රළ සමග

# නියමුවා

ISSN 1391 - 1031
2016 මාර්තු
21 වෙළුම 12 කලාපය

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ආධාරය රු 30/=

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"අප අනුගමනය කළ යුතු රීතිය මෙසේය, සංඛ්‍යාව අතින් අල්පවීම හොඳය, එනමුදු ගුණය උසස් විය යුතුය. අප අනුගමනය කළ යුතු අනෙක් රීතිය මෙසේය, යහපත් මිනිසුන් ලබා ගැනීමට කිසිදු බලාපොරොත්තුවක් නැතිව කඩිමුඩියේ වැඩ කරනවාට වඩා අවුරුදු දෙකකින් හෝ තුනකින් හෝ ඔවුන් ලබා ගැනීම වඩාත් හොඳය."

**ලෙනින්**
**තෝරාගත් කෘති**
*12 වෙළුම*
*211 පිටුව*

**05 ආණ්ඩුව මූල්‍ය...**




දැනටමත් ලොව පුරාම ඔප්පුකර තිබෙන පරිදි ණය ගැනීම යනු අර්බුදයට විසඳුම නොව...

**08 නැවත හොල්මන්**




ආර්ථික විද්‍යාඥයින් විසින් ලෝක ආර්ථික අර්බුදය පිළිබඳ යළිත් කථා කරන්නට පටන් ගෙන තිබේ...

**09 එට්කා...**




මෑත කාලයේ ලංකාවේ ආර්ථික ගිවිසුමක් පිළිබඳව වැඩිම සාකච්ඡාවක් පැවැතියේ නම්...

**11 දැනුම යනු....**



වත්මන් ධනවාදී අධ්‍යාපනය සකස්කර ඇත්තේ ඊට එරෙහිවය. තර්කයට ඉඩ නොතබා පොත් කටපාඩම්...

සංවාදය........................... 03
තරුණ............................. 04
ආවර්ජනා.......................... 06
කාන්තා............................ 10
කාලීන ............................ 12
වේදිකාව........................... 13
විශේෂාංග......................... 14

# ආණ්ඩුවට එරෙහිව

# ජවිපෙ සටන තීව්‍ර කරයි

02 පිටුවට






**සමාජවාදී තරුණ සංගමයේ**
**03වන ජාතික සමුළුව**

**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**



# වැඩ බිම

## වෘත්තීය සමිති මර්දනයට ගියොත් රනිල්ට වෙන්නෙත් රාජපක්ෂට වූදේමයි ලාල්කාන්ත සහෝදරයා




රනිල් වික්‍රමසිංහ මහතා වෘත්තීය සමිති මර්දනය කිරීමට උත්සාහ දැරුවොත් මහින්ද රාජපක්ෂ පරාජයට කළාටත් ඉක්මණට රනිල් පැරදවීමට වැඩකරන ජනතාව පෙළගැසීම වැළැක්විය නොහැකි බව ලාල්කාන්ත සහෝදරයා පසුගියදා ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය මගින් ඈඔක් ගිවිසුමට විරෝධය පළකරමින් කොළඹදී පැවැත්වූ මාධ්‍ය හමුවකදී පැවසීය.

මෙම මාධ්‍ය හමුව සඳහා අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ, ලංකා ගුරුසේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ, සමස්ත ලංකා වෛද්‍ය නිලධාරී සංගමයේ ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර, සමස්ත ලංකා හෙද සංගමයේ ලේකම් ගාමිණී කුමාරසිංහ, ඊ කියාලාභී උපාධිධාරී සංගමයේ ලේකම් චන්දන සූරියආරච්චි, එට්කා ගිවිසුමට එරෙහි ඒකාබද්ධ වෘත්තීයවේදීන්ගේ සංගමය වෙනුවෙන් ඉංජිනේරු උපාලි රත්නායක යන අයද සහභාගි වූහ.

## මෑන් පවර් සේවකයෝ 4500ක් පෙළපාළියේ

වත්මන් ආණ්ඩුව පොරොන්දු වූ පරිදි විදුලි බල මණ්ඩලය තුළ සේවය කරන සියලුම මෑන්පවර් සේවකයින් ස්ථිර කිරීමට බලකරමින් පසුගිය 09වැනිදා දැවැන්ත විරෝධතා උද්ඝෝෂණයක් හා සමුළුවක් පැවැත්විණි.

ලංකා විදුලි බල මුලස්ථානය ඉදිරිපිට සිට ආරම්භ කරන ලද මෙම විරෝධතාවය සඳහා රට පුරා විදුලි බල මණ්ඩල ආයතන තුළ සේවය කරන සේවකයෝ 4500ක් පමණ පැමිණ සිටියහ. විදුලිබල මණ්ඩල මුලස්ථානයේ සිට විහාරමහාදේවී උද්‍යානය දක්වා විරෝධතා පෙළපාළිය පැවැත්වුණු අතර අනතුරුව සියලු සේවක සහභාගිත්වයෙන් සමුළුවක් පැවැත්විණි.

ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් මෙම සමුළුව පැවති අතර එහිදී ඔහු පැවසූයේ විදුලි සේවකයින් ආරම්භ කර ඇති සටනින් සේවකයින් 2350 ක් ස්ථිර කර ගැනීමට හැකි වූ බවත් ඉතිරි සියලු සේවකයින් ස්ථිර කරන තෙක් මෙම අරගලය ඉදිරියට ගෙන යන බවත්ය. ලංකා විදුලි සේවක සංගමයේ ප්‍රධාන ලේකම් රන්ජන් ජයලාල් ඇතුළු මෑන්පවර් සේවක සංගම් නියෝජිතයින් හා වෘත්තීය සමිති නියෝජිතයින් කිහිපදෙනෙකුද මෙම සමුළුව ඇමතූහ.

## හෙද හෙදියෝ උද්ඝෝෂණයේ



සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සියලු හෙද හෙදියන්ට බලපාන ගැටලු ගණනාවක් සම්බන්ධයෙන් විසඳුම් ලබා දීමට තීරණය කළද එම විසඳුම් ලබානොදීමට එරෙහිව පසුගිය දින සෞඛ්‍ය අමාත්‍යාංශය ඉදිරිපිටදී උද්ඝෝෂණයක් පැවැත්විණි.

සමස්ත ලංකා හෙද සංගමය මගින් ප්‍රධාන ඉල්ලීම් 08ක් සම්බන්ධයෙන් විසඳුම් ලබාදෙන ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් කරන ලද ඉල්ලීමට අනුව ඒවා ලබාදීමට තීරණය වුවද මේ වන තෙක් ප්‍රතිචාර දක්වා නැති බවත් හෙද උපාධිය, හෙද ව්‍යවස්ථාව, හෙද දීමනා ආදී කරුණු ගණනාවක් එම ඉල්ලීම්වලට ඇතුළත් වූ බවත් එබැවින් එයට විරෝධය පළකරමින් මෙම උද්ඝෝෂණය පවත්වන බවත් මෙහිදී සමස්ත ලංකා හෙද සේවා සංගමයේ ලේකම් ගාමිණී කුමාරසිංහ සහෝදරයා පැවසීය. 30,000කට අධික හෙද පුරප්පාඩු වහා පුරවනු, හෙද සේවාව වනසන පෞද්ගලික හෙද උපාධි කඩ එපා, අවම අතිකාල දීමනාව රු. 150 ක් කරනු, ශ්‍රේණිගත උසස්වීම් වහා ක්‍රියාත්මක කරනු, නව හෙද ව්‍යවස්ථාව වහා ක්‍රියාත්මක කරනු ආදී සටන්පාඨ මෙම උද්ඝෝෂණයේදී ප්‍රදර්ශනය කෙරිණි.

## TUCC 9වන සමුළුවට මහින්ද ජයසිංහ ඉන්දියාවට




ඉන්දීය පෙරටුගාමී පක්ෂයේ වෘත්තීය සමිති අංශය වන Trade union Co-ordination Center (TUCC) හි 9 වන සමුළුව වෙනුවෙන් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය නියෝජනය කරමින් එහි ලේකම් මහින්ද ජයසිංහ පසුගියදා ඉන්දියාවට පිටත්විය. පසුගිය 26 දින ආරම්භ වූ මෙම සමුළුව සඳහා ජාත්‍යන්තර සහයෝගය සහ මිත්‍රත්වය එක්කරමින් මහින්ද ජයසිංහ සහෝදරයා සහභාගී වූ අතර එයට TUCC හි ඉහළ ප්‍රතිචාර ලැබුණි. මෙම සමුළුව වෙනුවෙන් සුබපැතුම් එක්කරමින් මහින්ද ජයසිංහ සහෝදරයා පැවසූයේ ලොව පුරා නිර්ධන පන්ති ව්‍යාපාරය එක්සත් කිරීම වෙනුවෙන් වන මෙම වෘත්තීය සමිති සමුළුව විශාල කාර්යභාරයක් කරන බවත් සමාජවාදය ගොඩනැගනීම වෙනුවෙන් සංවිධානය වීම ප්‍රමුඛම කාරණය බවත් ඒ අරමුණින් ඉන්දියාව පුරා කම්කරු පන්තිය සංවිධානය කිරීමට මෙම සමුළුව සඳහා ඉහළම සහාය පළකරන බවත්ය.

# ඉතිරි

## ආණ්ඩුවට එරෙහිව...

01 පිටුවෙන්

**ජන පීඩක රාජපක්ෂ පවුල් පාලනය පරාජයට පත්කළ ජනතාවගේ අපේක්ෂාවන් ඉටු කිරීමට අසමත් වෙමින් සිටින මෛත්‍රී-රනිල් ආණ්ඩුවේ ජනතා විරෝධී ක්‍රියාමාර්ගවලට එරෙහි සටන තීව්‍ර කිරීමට ජනතා විමුක්ති පෙරමුණ කටයුතු කරමින් සිටී.**

ආණ්ඩුවේ තීන්දු තීරණ හේතුවෙන් විශාල ජනතාවක් පීඩාවට පත්වෙමින් සිටින තත්වයක් තුළ ඔවුන්ගේ අයිතිවාසිකම් දිනාදීම වෙනුවෙන් පීඩාවට පත්වන සියලු ජනකොටස් ඒකරාශී කරගනිමින් ආණ්ඩුවට එරෙහිව මාර්තු මාසයේ සිට දැවැන්ත ජන අරගලයක් දියත්කිරීමට ජ.වි.පෙ. සූදානමින් සිටී. විශේෂයෙන් මහත් මතභේදයට තුඩුදී ඇති එට්කා ගිවිසුම සම්බන්ධයෙන් ආණ්ඩුව ජනමතය නොසලකා හිතුවක්කාරී ලෙස ඉදිරියට යමින් සිටින අතර ගොවි ජනතාව අර්බුදයකට ඇද දමමින් පොහොර සහනාධාරය කප්පාදු කිරීමටද ධීවර ජනතාව අසරණ කරමින් ඉන්දියානු ධීවර ආක්‍රමණයට ඉඩහැරීමටද ලෝක වෙළඳපොළේ තෙල්මිල විශාල ලෙස පහළ යාමේ වාසිය ජනතාවට ලබා නොදීමටද ආණ්ඩුව කටයුතු කර තිබේ.

අනෙක් අතට පසුගිය පාලන සමයේ වංචා හා දූෂණවල නිරතවූවන් සහ අපරාධකරුවන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමටත් කොල්ලකෑ මහජන දේපළ ආපසු පවරා ගැනීමටත් අදාළ පියවර ගැනෙමින් ඇත්තේ අතිශය මන්දගාමීවය.

මේ අතර පාර්ලිමේන්තුව තුළ ඊනියා ඒකාබද්ධ විපක්ෂය ලෙස පෙනී සිටින, පරාජිත මහින්ද පාලනයේ සමීපතමයෝ ජනතා ප්‍රශ්න පිළිබඳව හඬ නගනු වෙනුවට තමන්ට එරෙහිව සිදුකෙරෙන පරීක්ෂණ නතර කරන ලෙස ඉල්ලා පොල් ගසමින් සිටිති. පොලීසියේ කණිෂ්ඨ නිලධාරීන් විශාල සංඛ්‍යාවකට බලපෑ අසාධාරණ උසස් වීම් ක්‍රමවේදයකට එරෙහිව පාර්ලිමේන්තුව තුළ හඬනැගීමට පවා සිදුවූයේ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයාටය.

වර්ධනය වෙමින් පවතින මේ තත්වය පිළිබඳව නියමුවා කරන ලද විමසුමකට පිළිතුරු දෙමින් ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා පැවසුවේ, වෘත්තකයින්, වෘත්තීය සමිති, කම්කරුවන්, ගොවීන්, ධීවරයින් ඇතුළු ජන බලවේග ඒකරාශි කරගමින් ආණ්ඩුවේ අත්තනෝමතිකත්වයට හා ජන පීඩක ප්‍රතිපත්තිවලට එරෙහිව පුළුල් බහුජන සටන් ව්‍යාපාරයක් මාර්තු මාසයේ සිට ඇරඹීමට ජනතා විමුක්ති පෙරමුණ තීරණය කර ඇති බවය.

"ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණය ගන්න යනවා. ඔවුන් ණය දෙන්නේ කොන්දේසි මත. ඒකෙ තේරුම ආණ්ඩුව තව තවත් ජනතා සහන කප්පාදු කිරීමට සැරසෙනවා කියන එක. මේ තත්වයත් එක්ක ඇති වන ජනතා විරෝධයට නායකත්වය දෙන්න ජ.වි.පෙ. සූදානම්." විජිත හේරත් සහෝදරයා වැඩිදුරටත් පැවසීය.

## වකුගඩු ජාවාරම පිළිබඳ සත්‍යය රටට හෙළිකළ යුතුයි!

### අනුර දිසානායක සහෝදරයා



**පසුගිය 09වැනි දින පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 23/2 යටතේ ප්‍රශ්නයක් ඉදිරිපත් කරමින් ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා රටත් ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයත් අපකීර්තියට ලක්වූ වකුගඩු ජාවාරම සම්බන්ධ සත්‍යය රටට හෙළිකළ යුතු බවට ආණ්ඩුවට අවධාරණය කළේය. ඔහු විසින් ඉදිරිපත් කරන ලද සම්පූර්ණ ප්‍රකාශය පහත පරිදිය.**

පසුගිය දිනවල මහත් ආන්දෝලනයට ලක්වූ වකුගඩු ජාවරමට ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රය සම්බන්ධ බවට පළවූ ප්‍රවෘත්ති පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

පසුගිය දිනවල නීති විරෝධී වකුගඩු ජාවාරමක් පිළිබඳ තොරතුරු ඉන්දියානු පොලිසිය විසින් අනාවරණය කරගෙන තිබුණා. එම තොරතුරු වලට අනුව ඊට අදාල වකුගඩු ශල්‍යකර්ම සිදුකර තිබුණේ ශ්‍රී ලංකාවේ රෝහල් තුළ හා ශ්‍රී ලංකාවේ වෛද්‍යවරුන් සම්බන්ධ කරගෙනයි. ඊට ලංකාවේ පෞද්ගලික රෝහල් 4කුත් වෛද්‍යවරුන් හයදෙනෙකුත් සම්බන්ධවී ඇති බවට මාධ්‍ය වාර්තා කළා.

මේ පිළිබඳව සොයා බලා වාර්තා කිරීමට සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් පළමුව ත්‍රිපුද්ගල කමිටුවක්ද පසුව පංචපුද්ගල කමිටුවක්ද පත්කරනු ලැබුවා. එම අවසන් කමිටුවේ වාර්තාව පසුගිය පස්වෙනිදා ඇමතිවරයාට පිළිගන්වා ඇති බව අමාත්‍යවරයා ප්‍රකාශ කළා.

පුද්ගලයන් ඝාතනය කර ශරීර කොටස් විකිණීමේ ජාවාරමක් කලක සිට ඉන්දියාවේ පැවැති අතර මෑතකාලීනව ඉන්දියානු රජය මේ පිළිබඳව නීති දැඩි කර තිබෙනවා. එසේම ලංකාවේ පවතින නීතිය අනුවද කිසිදු ශරීර කොටසක් විකිණීම තහනම් වන අතර බද්ධ කිරීම සඳහා අවයව ලබාගත හැක්කේ නොමිලේය. මේ වාතාවරණය තුළ ඉන්දියානු ජාවාරම්කරුවන් විසින් නීති විරෝධී බද්ධ කිරීම් සඳහා ලංකාව තොරාගෙන ඇති බව මාධ්‍ය වාර්තා පළකළා. මේ ආකාරයෙන් නීති විරෝධී වකුගඩු ජාවාරම් පිළිබඳව 2012, 2013 වසරවල ආන්දෝලනාත්මක තත්වයක් පැන නැගුණා. ඉන්පසුව එවකට සෞඛ්‍ය අමාත්‍යවරයා ඒ පිළිබඳව සොයා බැලීම සඳහා කමිටුවක් පත්කළද එහි අවසන් වාර්තාවට සිදුවූ දෙයක් දැනගන්නට ලැබුණේ නැහැ.

දැනටමත් මෙවැනි වකුගඩු ජාවාරම් උඩරට වතුකරය තුළ සිදුවන බවට එහි දේශපාලකයන් විසින්ද හෙළිදරව් කිරීම් සිදුකර තිබෙනවා. පවතින ආර්ථික දුෂ්කරතා හමුවේ තමන්ගේ අවයව අලෙවි කරන අය හමුවීමේ පුදුමක් නැහැ. එහෙත් මෙය පැහැරගෙන ගොස් ශරීර කොටස් ලබාගන්නා තැනට යා නොහැකි යැයි කිසිවෙකුටත් කිව නොහැකියි. එසේම ශ්‍රී ලංකාව රටක් ලෙසත් ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයත් අපකීර්තියට ලක්වූ මෙම වකුගඩු ජාවාරම සම්බන්ධ සත්‍යය මෙම සභාව දැනගත යුතු යැයි අප විශ්වාස කරනවා.

මේ තත්වය තුළ පැන නගින පහත ගැටලුවලට පිළිතුරු අග්‍රාමාත්‍යවරයා විසින් සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා.

01. 2012, 2013 වකවානුවේ වකුගඩු ජාවාරම පිළිබඳව පත්කරන ලද කමිටුවේ වාර්තාවට සිදුවූයේ කුමක්ද? එහි සිදුකරන ලද හෙළිදරව් කිරීම් කවරේද?

02. පසුගිය පස්වෙනිදා අමාත්‍යවරයා අතට පත්කරන ලද කමිටු වාර්තාවේ සිදුකර ඇති හෙළිදරව් කිරීම් කවරේද? එම වාර්තාව සභාගත කරන්නේද?

03. මෙවැනි ජාවාරම් නතර කිරීම සඳහා ගන්නාවූ කෙටිකාලීන සහ දිගුකාලීන ක්‍රියාමාර්ග කවරේද?

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# සටන කුමක් සඳහාද?

පසුගිය සියලුම ධනපති ආණ්ඩු විසින් වර්ධනය කොට පවත්වාගෙන ආ සියලු සමාජ ආර්ථික ගැටලු වත්මන් එ.ජා.ප.-ශ්‍රී.ල.නි.ප. ආණ්ඩුව විසින්ද එලෙසම පවත්වාගෙන යමින් සිටී. ඒ තුළ පීඩාවට පත්ව ඇත්තේ, පොදු ජනතාවය. ගොවි ජනයාගේ පොහොර සහනාධාරය කැපීම, රජයේ සේවකයාගේ විශ්‍රාම වැටුප නැවැත්වීමට උත්සාහ කිරීම, අධ්‍යාපන පෞද්ගලීකරණය, උතුරු මුහුදේ මත්ස්‍ය සම්පත ඉන්දියාව විසින් කොල්ලකෑම නැවැත්වීමට නොහැකිවීම, තෙල් මිල අඩුවී තිබියදීත් එහි වාසිය ජනතාවට ලබා නොදීම ආදී ගැටලු රැසකින් ඒ ඒ ජන කණ්ඩායම් පීඩාවට පත්ව සිටිති.

මෙම ජන කණ්ඩායම් මත පටවා ඇති පීඩනයට එරෙහිව, ජනතා සහන කැපීමට එරෙහිව, ජනයාගේ අයිතීන් රැකීම සඳහා සටන් කරමින් සිටින්නේ ජ.වි.පෙ.ය. පාර්ලිමේන්තුව තුළත්, ඉන් පිටතත් ජ.වි.පෙ. තම වගකීම ඉටුකරමින් අරගල කරමින් සිටී. තෙල් මිල අඩුකරන ලෙස ආණ්ඩුවට බල කරන්නේත්, ඉන්දු-ලංකා වෙළඳ ගිවිසුම රටට අනතුරක් බැවින් ඒ පිළිබඳ ජනතාව දැනුවත් කොට එය පරාජය කිරීමට කටයුතු කරන්නේත් ගොවි ජනයාගේ, ධීවරයාගේ, තරුණයාගේ, ශිෂ්‍යයාගේ අයිතීන් සඳහා හඬ නගන්නේත් ජ.වි.පෙ.ය. එය ජනතාව දන්නා කරුණකි.

මේ අතර රාජපක්ෂ කල්ලියේ ඊනියා ඒකාබද්ධ විපක්ෂයද "සටන් කරති" පාර්ලිමේන්තුව තුළ ඝෝෂා කරති. දිනපතා ජනමාධ්‍ය (සංදර්ශන) සාකච්ඡා පවත්වති. ප්‍රකාශ නිකුත් කරති. එකිනෙකාට සතුන්ගේ නම්වලින් ආමන්ත්‍රණය කරමින් බැන ගනිති. එහෙත් ඒ සියල්ල කරන්නේ ජනතා ප්‍රශ්න වෙනුවෙන් නොවේ.

තෙල් මිල අඩුකරන ලෙස හෝ ගොවියන්ගේ පොහොර සහනාධාරය කප්පාදු නොකරන ලෙස හෝ යෝජිත ඉන්දු-ලංකා වෙළඳ ගිවිසුම නතර කරන ලෙස හෝ ඔවුන් ඉල්ලන්නේ නැත. ඒ වෙනුවට ඔවුන් සටන් කරන්නේ කුමක් සඳහාද? තම පැවැත්ම වෙනුවෙනි. වරෙක පාර්ලිමේන්තුවේ වෙනම කණ්ඩායමක් ලෙස තමන් පිළිගන්නා ලෙස ඉල්ලති. තවත් වරෙක තමන්ගෙන් පළිගන්නා බව කියමින් ඊට එරෙහිව පොල් ගසති. අලුතින් පක්ෂ හදන බවට, පෙරමුණු හදන බවට පාරම්බාති. එහෙත් ජනතා ප්‍රශ්න ගැන මුනිවත රකිති.

ඊනියා ඒකාබද්ධ විපක්ෂය හෙවත් රාජපක්ෂ කල්ලියේ සටනේ අරමුණ ඉතා පැහැදිලිය. දැන් ඔවුන් කරමින් සිටින්නේ රටත් ජනතාවත් වත්මන් අර්බුදයෙන් මුදවා ගැනීමේ සටන නොව තම තමන් මුහුණ පා ඇති බේදවාචකයෙන් ගැලවීමේ සටනය. රාජපක්ෂ කල්ලිය අලුත් පක්ෂයක් හදන බවට, අලුත් පෙරමුණක් හදන බවට කෑ ගසන්නේ ඇයි? එහි අරමුණ කුමක්ද? මෙහි අරමුණ ජනතාව වෙනුවෙන් නම් නොවේ. තමන් වෙනුවෙනි.

රාජපක්ෂ පවුලේ අයට හා ඔහුට හිතවත් කල්ලියට එරෙහිව ඇති මූල්‍ය අපරාධ චෝදනාවලින් ඔවුනට ගැලවීමක් නැති බව ඔවුහු දනිති. ඒ පිළිබඳ පරීක්ෂණවලට මුහුණ දී අධිකරණයට ගොස් තම නිර්දෝෂීභාවය ඔප්පු කරනවා වෙනුවට තමන්ගෙන් පළිගන්නා බවට කෑ ගසන්නේත් මූල්‍ය අපරාධ කොට්ඨාසය විසුරුවන ලෙස ඉල්ලන්නේත් ඒ අනුවය. තමන් කළ අපරාධවලින් බේරීමට ඔවුනට ඇති එකම මඟ යළි තමන් අතට බලය ගැනීමය. එය යථාර්ථයෙන් බොහෝ දුර සිහිනයක් වුවත් එය ඔවුන්ගේ බේරීමේ අවසන් 'පිදුරු ගසය'. ඒ නිසා යළි බලය ගැනීමට හැකිදැයි බලති. ඒ සඳහා පෙරමුණක් අවශ්‍යය. ජනතාව රවටා ගැනීම අවශ්‍යය.

එසේම රාජපක්ෂලාගේ මහ ගසේ පිළිල ලෙස තිබූ, දැන් වඳවී යාමේ අනතුරට මුහුණ පා සිටින කුඩා දේශපාලන කල්ලිවලට තම පැවැත්ම රැකගැනීමට නම් රාජපක්ෂ මහතා ඇතුළු පිරිසක් ශ්‍රීල.නි.ප.යෙන් ඉවත්කරගෙන හෝ පෙරමුණක් අටවා ගත යුතුය. නැතිනම් ඔවුන් දේශපාලනයෙන් වඳවී යනු ඇත. ඒ, ඔවුනට තනිව තම දෙපයින් දේශපාලන බිමේ සිටගත නොහැකි නිසාය. ශ්‍රී.ල.නි.ප.ය සමඟ හෝ එහි කොටසක් සමඟ පෙරමුණක් ඔවුනට අවශ්‍ය ඒ නිසාය.

අනෙක් අතට දැනට කෙරෙන වංචා-දූෂණ පිළිබඳ පරීක්ෂණවලට බාධා කොට ඒවා ප්‍රමාද කරවා ගැනීම සඳහාත් මෙම කෑකෝ ගැසීම්, පොල් ගැසීම් හා පක්ෂ හදන බවට තර්ජනය කිරීම් අවශ්‍ය යයි ඔවුන් සිතන බව පෙනේ. ඒ මගින් තාවකාලික සහනයක් හෝ ලබා ගැනීමටත් පක්ෂ හදන බවට තර්ජනය කොට ආණ්ඩුව සමඟ එකඟතාවලට ඒමටත් ඔවුන් සිතන බව පෙනේ. ඒ නිසා රාජපක්ෂ කල්ලියේ පෙරමුණු ඇටවීමේ හා පක්ෂ හැදීමේ ඝෝෂාව තනිකරම තම පැවැත්ම රැකගැනීම වෙනුවෙන්ම බව පැහැදිලිය. ඔවුන් කොතරම් තමන් ගැන පමණක් සිතනවාද යන්න පෙනෙන්නේ තම පාක්ෂිකයන් ගැනවත් නොසිතන තත්වය තුළය. ඔවුනට පොල් ගැසීමට, දෙවියන්ගේ පිහිට පැතීමට සිදුව තිබෙන්නේ ඇයි? ඒ ජනතාව ගැන විශ්වාසය නැති නිසාය. ජනතාව විසින් ඔවුන් ප්‍රතික්ෂේප කරමින් සිටින නිසාය.

මේ තත්වය විසින් ධනපති හවුල් ආණ්ඩුවට එරෙහිව ජනතාවගේ ප්‍රශ්න වෙනුවෙන් හඬ නැගීමේත් ජනතාව අතර වැඩ කිරීමේත් ඉඩ හා අවස්ථාව ජ.වි.පෙ.ට හිමිවී ඇත. ඒ අනුව ඉදිරියේ ජනතා බලවේග එකතු කළ හැකි වන්නේත් ජනතා බලවේග පෙළගැසීමේ ඉඩ තිබෙන්නේත් ජ.වි.පෙ.ටය, ජ.වි.පෙ. වටාය. ධනවාදයෙන් හා වත්මන් පාලනයෙන් පීඩාවට පත්වන ජනතාවටද දැන් ඒකරාශී වීමට ඉතිරිව ඇත්තේ ජ.වි.පෙ.ය. එබැවින් ජනතාවගේ සටන සිදුවනු ඇත්තේ ජ.වි.පෙ. පෙරටුකර ගනිමිනි.

# කාන්තාවන්ගේ දායකත්වය රටට ලබාගත හැකි ප්‍රායෝගික ක්‍රමවේදයක් තිබිය යුතුයි!



**සමාජවාදී කාන්තා සංගමයේ ජාතික සංවිධායිකා**
**සමන්මලී ගුණසිංහ සහෝදරිය**

***නියමුවා:-*** ***ලාංකේය කාන්තාව මෑතකාලීනව පාර්ශ්වීය අරගල තුළ ඉදිරියට පැමිණීම සාධනීය ලක්ෂණයක් වුවත් දේශපාලනික ක්‍රියාවලිය තුළ තවමත් පසුගාමී ස්වභාවයක් දක්වනවා. මේ තත්වය ඔබ තේරුම් ගන්නේ කොහොමද?***

***සමන්මලී සහෝදරිය:-*** පසුගිය කාලයේදී තම දරුවා පාසලට ඇතුල්කිරීමට නොහැකි වූ විට කාන්තාවන් දරුවන් සමග පාසලක් ඉල්ලා උද්ඝෝෂණය කරනවා. එසේත් නැත්නම් ප්‍රදේශයේ දරුවෙකුට සිදුවූ අපරාධයක් හෝ හිංසනයක් වෙනුවෙන් පාරට බහිනවා. එසේත් නැත්නම් තමන්ට සිදුවූ අසාධාරණයට එරෙහිව තනිවම විරෝධය දක්වනවා. එලෙස තමන්ට මුහුණදීමට සිදුවන ප්‍රශ්නවලදී පාර්ශ්වීය අරගල හෝ මැදිහත්වීම් තමයි වැඩි වශයෙන් දක්නට ලැබුණේ.

එහෙත් මේ හැම ප්‍රශ්නයක්ම පවතින ක්‍රමය තුළ නිර්මාණය වූ සමාජ ආර්ථික දේශපාලන ගැටලු බව ඔවුන් බොහෝ දෙනෙකු අවබෝධ කරගෙන නැහැ. අවුරුදු 68ක් පුරා විවිධ පාලකයින් ජනතාවට බොරු පොරොන්දු දී ඇති බව ඔවුන් තේරුම් ගන්නේ නැහැ. සාමාන්‍යයෙන් කාන්තාවන් විශේෂයෙන් වෙළඳපොළේදීත් තවත් බොහෝ තැන්වලදීත් හොඳම දේ තෝරනවා. එහෙත් අපේ කාන්තාවන් රටේ පාලකයින් තෝරද්දී, දේශපාලන නායකයින් තෝරද්දී හොඳම අය තෝරාගන්නට අසමත් වෙනවා. මවා පාන ලක්ෂණවලට අහුවෙනවා. ඒ නිසාම රටේ ජයග්‍රහණවලින් වැඩි ප්‍රතිශතයක් කාන්තාවන් විසින් නියෝජනය කළත් ඡන්දදායකයින්ගෙන් වැඩි ප්‍රතිශතයක් කාන්තාවන් වුවත් දේශපාලනය වැනි ක්ෂේත්‍රයක කාන්තාවන් ඉතාමත් අඩු සංඛ්‍යාවක් නියෝජනය කරනවා.

මෙයට අපේ රටේ සමාජයේ පොදු පසුගාමිත්වය වගේම කාන්තා සමානත්වය නොසලකන දේශපාලන ක්‍රමයත් බලපා තිබෙනවා. විශේෂයෙන් ධනවාදී වෙළඳපොළ රටාවත් ඒ මත ගොඩනැගී තිබෙන වැරදි මතවාදත් කාන්තාවන් පොදු දේශපාලන කටයුතුවලින් ඉවත්කර තිබෙනවා.

***නියමුවා:-*** ***පළාත් පාලන නියෝජනය තුළ කාන්තාවන්ට 25%ක කෝටාවක් වෙන්කිරීම වැනි නෛතික පියවරක් මේ තත්වයට විසඳුමක් ලබාදෙනු ඇත්ද?***

***සමන්මලී සහෝදරිය:-*** පළාත් පාලන ආයතන තුළ කාන්තාවන්ට 25% ක් දක්වා නියෝජනයක් වෙන් කිරීමට පියවර ගන්න එක හොඳයි. හැබැයි අපේ නියෝජනය කාන්තාවන්ගේ දක්ෂතාවය පදනම් කරගෙන 50%ක දායකත්වයක්, සහභාගිත්වයක් තිබිය යුතු බවයි. එහෙත් ප්‍රතිශතය වෙන්කළ පමණින්, නෛතික වටිනාකමක් ලබාදුන් පමණින් කාන්තාවන්ගේ ඇත්ත ප්‍රශ්න, සමාජ ආර්ථික දේශපාලන ප්‍රශ්න එම ආයතන තුළ කථා කළ හැකි පරිදි සැබෑ නියෝජනයක් සිදුවේද යන්න ගැටලුවක්. ප්‍රතිශතයට එහා ගිය, කාන්තාවන්ගේ දායකත්වය රටට, සමාජයට ලබාගත හැකි ප්‍රායෝගික ක්‍රමවේදයකට හැර නියෝජනය වැඩි කිරීම වැනි තාක්ෂණික ක්‍රමවලින් කාන්තාවන්ගේ සමාජ දායකත්වය වැඩිකළ හැකියැයි සිතීම රැවටීමක්. කළ යුතු වන්නේ, කාන්තාවන්ට දැනට වඩා වැඩියෙන් අවස්ථා ලබාදීම හා ඒ සඳහා ඔවුන් බැඳදමා ඇති සාම්ප්‍රදායික බැමිවලින් නිදහස් කිරීමට කටයුතු කිරීමයි.

***නියමුවා:-*** ***2016 ජාත්‍යන්තර කාන්තා දිනය එළඹෙන්නේ ලොව පුරා කාන්තාවන් දහස් ගණනක් සරණාගතභාවය, යුදමය තත්වය, දරිද්‍රතාවය, ප්‍රචණ්ඩත්වය, ලිංගික හිංසනයන්ට ලක්වීම් තුළ පීඩා විඳිමින් සිටියෙදීයි. එවැනි පීඩනයන්ට එරෙහිව ජාත්‍යන්තර වශයෙන් ඒකාබද්ධ හඬක අවශ්‍යතාව ඔබ දකින්නේ කොහොමද?***

***සමන්මලී සහෝදරිය:-*** 2016 ජාත්‍යන්තර කාන්තා දිනය සමරන මේ මොහොතේත් ලෝකයේම අඩක් කුසගින්නෙන් පෙළෙනවා. එයින් විශාල ප්‍රමාණයක් කාන්තාවන්. විවිධ යුද තත්වයන් කාන්තාවන් වැන්දඹුවන් බවට පත්කර තිබෙනවා. රටවල් කිහිපයක් හැරුණු විට බොහෝ තැන්වල කාන්තාවන් ලිංගික හිංසනයට, ප්‍රචණ්ඩත්වයට ලක්වන ප්‍රමාණය වැඩිවෙලා. ලංකාව තුළ සියදිවි නසාගැනීමට තැත් කරන කාන්තාවන් ප්‍රමාණය ලෝකයේ දෙවන ස්ථානයට පත්වෙලා. බිලියනපතියන්ගේ ආදායම වැඩිවන විට කුසගින්නේ මියයන දුප්පතුන්ගේ ප්‍රමාණය වැඩිවෙලා. ලෝකයේ සෑම තැනකම කාන්තාවන්ට මුහුණ දීමට සිදුවන සෘජු ආර්ථික, දේශපාලන ප්‍රශ්නවල කෲරකම වැඩිවෙලා. ඒ නිසාම ලෝකයේ සිටින කාන්තාවන්ට එරෙහිව හිංසනයටත්, පීඩනයටත්, දූෂණයටත් එරෙහිව ඒකාබද්ධ හඬක් නැගිය යුතු කාලය එළඹ තිබෙනවා.

***නියමුවා:-*** ***ලාංකේය කාන්තාවන් බලමුළු ගැන්වීම සඳහා සමාජවාදී කාන්තා සංගමයේ මැදිහත්වීම කවරාකාරද?***

***සමන්මලී සහෝදරිය:-*** සමාජවාදී කාන්තා සංගමය ලෙස විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරන විවිධ හැකියාවන් නියෝජනය කරන කාන්තාවන් එකමුතු කරමින් බහුජන සංවිධානයක් ගොඩනගමින් තිබෙනවා. අපේ නායකත්වයෙන් කාන්තා නායිකාවන් පෙරට ගැනීම මෙන්ම ඔවුන් රටේ විවිධ ක්ෂේත්‍රවලට නායකත්වය දෙමින් බලවේගයක් ලෙස කටයුතු කිරීමට සූදානම් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ගම් මට්ටමින් කාන්තාවන් සවි ගැන්වීමක් ලෙස දේශපාලන ක්‍රියාවලිය තුළට ගෙන ඒමත් ඔවුන් ඇත්ත සමාජ ජයග්‍රහණය වෙනුවෙන් පෙළ ගැස්වීමත් ඒ අතරම කාන්තා ගැටලු වෙනුවෙන් හඬ නැගීම හා අරගල කිරීමත් අප විසින් කරමින් සිටිනවා. එසේම විවිධ රටවල වාසය කරන ශ්‍රී ලංකික සහෝදරියන් කාන්තා සංගමය තුළට ඒකරාශී කර ගැනීමටත් ඒ මගින් පුළුල් කාන්තා ව්‍යාපාරයක් නිර්මාණය කිරීමටත් අපි කටයුතු කරනවා.

කාන්තාවන් මුහුණ දෙන සමස්ත සමාජ ගැටලුවලට සැබෑ විසඳුම් ලබාගත හැක්කේ, පවතින සමාජය වෙනස් කොට නිර්මාණය කරන නව සමාජයකින් පමණයි; සමාජවාදය ගොඩනැගීමෙන් පමණයි. ඒ සඳහා අප සමඟ අත්වැල් බැඳගන්නා ලෙස සියලු කාන්තාවන්ගෙන් මෙම ජාත්‍යන්තර කාන්තා දිනයේදී අප ඉල්ලා සිටිනවා.

තරුණ

සමාජවාදී තරුණ සංගමය

# සමාජවාදය ජීවිතය සහ අනාගතය උදෙසා





















## 03වන ජාතික සමුළුවේ යෝජනා

### කඩිනම් ක්‍රියාමාර්ග

අප රටේ ලක්ෂ හැත්තෑපහක් වන තාරුණ්‍යයේ අනුල්ලංඝනීය අයිතීන් ආරක්ෂා කර ගැනීමට පහත සඳහන් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු යැයි මෙම සමුළුව ආණ්ඩුවට බල කර කියා සිටී.

ඒ අනුව;

- අධ්‍යාපනය සඳහා දළ ජාතික නිෂ්පාදිතයෙන් 06%ක් වෙන් කරන ලෙසත්,
- උසස් පෙළ සමතුන් සියලු දෙනා සරසවිවලට බඳවා ගත හැකි වන පරිදි නව රාජ්‍ය සරසවි ආරම්භ කරන ලෙසත්,
- 1990දී උසස් පෙළ සමතුන්ගෙන් 21%ක් සරසවිවලට ඇතුළත් කර ගත් නමුත්, මේ වන විට එය 17% දක්වා පහත වැටී තිබේ. 2020දී අවම වශයෙන් ඇතුළත් කර ගන්නා ප්‍රමාණය සමත් වන ප්‍රමාණයෙන් තුනෙන් එකක් දක්වා ඉහළ දමන ලෙසත්,
- ආණ්ඩුවේ රැකියා ලබා දීමේදී දේශපාලන ඇඟිලි ගැසීම් නවතා තරග විභාග ක්‍රමය අනුගමනය කරන ලෙසත්,
- රජයේ සේවය සඳහා බඳවා ගන්නා තරුණ, තරුණියන්ගේ අයිතියක්වූ විශ්‍රාම වැටුප් අයිතිය යළි ලබා දෙන ලෙසත්,
- පෞද්ගලික අංශයේ අවම මූලික වැටුප රාජ්‍ය අංශය හා සමාන කරන ලෙසත්,
- 'මෑන්පවර්' වහල් සේවය අහෝසි කරන ලෙසත්,
- දින 180න් රජයේ හා පෞද්ගලික අංශයේ සියලු සේවක සේවිකාවන් ස්ථිර කරන ලෙසත්,
- තරුණ රැකියා ගැටලු පිළිබඳ සොයා බලා කටයුතු කිරීම සඳහා කාර්යසාධන බළකායක් පිහිටුවන ලෙසත්,
- පරිසර, ක්‍රීඩා, කලා, සංස්කෘතික හා නව නිපැයුම් ආදී ක්ෂේත්‍රවල තරුණ ස්වේච්ඡා සමාජ ක්‍රියාකාරකම් දිරිගන්වන අරමුදලක් පිහිටුවන ලෙසත්,
- විවාහයේ දී දෑවැදි ලබා දීම අහෝසි කිරීමට නීති සකසන ලෙසත්,
- දේශපාලන සිරකරුවන් වහා නිදහස් කරන ලෙසත්,
- යුද්ධය නිසා බිඳ වැටුණු උතුරේ තරුණ ජීවිත ගොඩනඟන වසර තුනක කඩිනම් වැඩපිළිවෙළක් සකස් කරන ලෙසත්,
- විෂ මත්ද්‍රව්‍යවලට සම්බන්ධ වගකිව යුත්තන්ට තරාතිරම නොබලා දඬුවම් දෙන ලෙසත් සමාජවාදී තරුණ සංගමය ආණ්ඩුවට බල කර කියා සිටී.



### සමාජවාදී තරුණ සංගමයේ නව ලේකම් මණ්ඩලය

දේශපාලන අධ්‍යාපන කටයුතු පිළිබඳ ලේකම්
**මහේෂ් අබේපිටිය සහෝදරයා**

ප්‍රචාරක හා ජාත්‍යන්තර කටයුතු පිළිබඳ ලේකම්
**අංජන සම්පත් අමරසිංහ සහෝදරයා**

මූල්‍ය කටයුතු පිළිබඳ ලේකම්
**බන්දුල පුෂ්ප කුමාර සහෝදරයා**

සංස්කෘතික කටයුතු පිළිබඳ ලේකම්
**ගයාන් ජානක සහෝදරයා**

ක්‍රීඩා කටයුතු පිළිබඳ ලේකම්
**සංජය විශ්වනාත් සහෝදරයා**

පරිසර කටයුතු පිළිබඳ ලේකම්
**අසිත නිරෝෂණ සහෝදරයා**

විෂ මත්ද්‍රව්‍ය විරෝධී කටයුතු පිළිබඳ ලේකම්
**ගයාන් චතුරංග සහෝදරයා**

### සමාජවාදී තරුණ සංගමයේ නව ජාතික කමිටුව

ජාතික සංවිධායක **එරංග ගුණසේකර සහෝදරයා**
අනුරාධපුර දිස්ත්‍රික් සභාපති **සංජය විශ්වනාත් සහෝදරයා**
කොළඹ දිස්ත්‍රික් සභාපති **අංජන සම්පත් අමරසිංහ සහෝදරයා**
**බන්දුල පුෂ්ප කුමාර සහෝදරයා**
පොළොන්නරුව දිස්ත්‍රික් සභාපති **ගයාන් චතුරංග සහෝදරයා**
ගාල්ල දිස්ත්‍රික් සභාපති **ප්‍රමිල් ලක්ෂිත සහෝදරයා**
මාතර දිස්ත්‍රික් ලේකම් **නදීකා හේමමාලි සහෝදරිය**
හම්බන්තොට දිස්ත්‍රික් සභාපති **මහේෂ් අබේපිටිය සහෝදරයා**
යාපනය දිස්ත්‍රික් සංවිධායක **ශ්‍රීකාන්ත නේෂන් සහෝදරයා**
කොළඹ දිස්ත්‍රික් මාධ්‍ය ලේකම් **නිපුණා සාරංගි සහෝදරිය**
කොළඹ දිස්ත්‍රික් ලේකම් **අසිත නිරෝෂණ සහෝදරයා**
**ගයාන් ජානක සහෝදරයා**
මොණරාගල දිස්ත්‍රික් සභාපති **අජිත් අගලකඩ සහෝදරයා**
අම්පාර දිස්ත්‍රික් සභාපති **සම්පත් චාමික සහෝදරයා**
ගම්පහ දිස්ත්‍රික් සභාපති **විරාජ් සඳරුවන් සහෝදරයා**
බදුල්ල දිස්ත්‍රික් සභාපති **අනිල් මංජුල සහෝදරයා**
නුවරඑළිය දිස්ත්‍රික් සංවිධායක **චමින්ද සේනාධීර සහෝදරයා**
මාතලේ දිස්ත්‍රික් සභාපති **චමින්ද කෝනාර සහෝදරයා**
වව්නියාව දිස්ත්‍රික් සංවිධායක **ආසිරි සෝමරත්න සහෝදරයා**
කළුතර දිස්ත්‍රික්කයේ සභාපති **ධනුෂ්ක ජයවීර සහෝදරයා**
හම්බන්තොට දිස්ත්‍රික් පරිසර ලේකම් **සුජිත් ප්‍රියන්ත සහෝදරයා**
කුරුණෑගල දිස්ත්‍රික් සභාපති **ජානක උදය කුමාර සහෝදරයා**
**මධුතරංග සිල්වා සහෝදරයා**
ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සංවිධායක **හේමචන්ද්‍රා අරුණ් සහෝදරයා**
හම්බන්තොට දිස්ත්‍රික් කාරක සභික **රිසිනි විල්මා සහෝදරිය**
**ඉෂානි චන්දිමා සහෝදරිය**
ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයෙහි උප සභාපති **පුබුදු නුවන් සමරවීර සහෝදරයා**






"විප්ලවයේ ගාමක බලවේගය වන්නේ කුමන පංතිද යන්න අපි තේරුම් ගත යුත්තෙමු. ඔවුන්ගේ විවිධ අපේක්ෂාවන් කල්පනාකාරී ලෙස අගය කළ යුතුය. කම්කරුවා යන මාර්ගයෙහිම යාමට ධනපතියා සමත් නොවේ. ධනපතියන් කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තැබීමට හෝ, එසේ නැතහොත්, කම්කරුවන් සමග සහෝදර සන්ධානයක් ඇති කර ගැනීමට සියලු දෙනාගේම එකඟත්වයක් වහාම ඇතිකර ගැනීමට හෝ පුළුවන්කමක් සුළු දේපළ හිමියන්ට නැත. විප්ලවයට යන නිවැරදි මඟ අපට සොයා ගත හැකි වන්නේ, අප මෙම පංති අතර වෙනස තේරුම් ගත්පසු පමණකි."

**ලෙනින්**
**තෝරා ගත් කෘති,**
**05වැනි වෙළුම, පිටුව 140**

# ආණ්ඩුව මූල්‍ය අර්බුදයක

ලංකාවේ පසුගාමී ධනපති ක්‍රමය නිම නොවන හා සුව නොවන ආර්ථික අර්බුදයකට ගොදුරුවී සිටී. එය කලක් තිස්සේ උස් පහත් වෙමින් වර්ධනය වේ. ධනවාදය තුළ ධනපති පාලනයට ඊට විසඳුම් නැත. මේ අප පොදුවේ දන්නා ඉතිහාසයක් පුරා අත්දුටු සත්‍යයය. දැන් ඊට අමතරව වත්මන් පාලනය විශාල මූල්‍ය අර්බුදයකටද මුහුණ දී සිටී. මෙයට ප්‍රධානතම හේතුව වන්නේ, රට තුළ නිෂ්පාදන ආර්ථිකයක් ඇති නොකිරීමත් පැවති සම්ප්‍රදායික නිෂ්පාදන මාර්ග පවා (තේ, පොල්, රබර් වැනි) නොසලකා හැර දුර්වල කිරීමත් ණය මත යැපෙන ආර්ථිකයක් පවත්වාගෙන යාමත්ය.

මේ ආණ්ඩුව ආරම්භයේදීම දින 100 තුළදීම මෙම මූල්‍ය අර්බුදය මතුවූ අතර එයට ආණ්ඩුව විසඳුම් සෙවූයේ මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීම හෙවත් අභ්‍යන්තර ණයක් ගැනීමෙනි. රු.මිලියන 10,000ක් වූ එම මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීම හරහා වංචාවක්ද සිදුවිය. ඉන් මූල්‍ය අර්බුදය විසඳුණේ නැත. ණය ගැනීමෙන් මූල්‍ය අර්බුද විසඳිය නොහැකි බව යළිත් තහවුරු කරමින් නැවත මෙම අර්බුදය මතුව තිබේ. එක් අතකින් ආණ්ඩුවට අයවැය පරතරය පියවා ගැනීමට මුදල් නොමැත. අනෙක් අතින් අලුත් ව්‍යාපෘති කිසිවක් ආරම්භ කිරීමටද මුදල් නැත. මේ දෙක සඳහාම විදේශ රටවලට අතපා හිඟමනේ යාම හැර අන් විකල්පයක්ද ආණ්ඩුව සතුව නැත. අයවැය පරතරය දෙස බැලීමෙන් වුව ආණ්ඩුව මුහුණපා සිටින මූල්‍ය අර්බුදයේ තරම වටහාගත හැක. ආණ්ඩුව 2016 වසර තුළ කළ යුතු අවම වියදම රු. බිලියන 2787ක් ලෙස සඳහන් කර තිබුණි. එම වියදම යනු සියලු කප්පාදු කිරීම්වලින් පසු කළ යුතු අනිවාර්ය හා අත්‍යාවශ්‍ය වියදම්ය. රාජ්‍ය සේවකයින්ට වැටුප් ගෙවීම් අමාත්‍යාංශ පවත්වාගෙන යාම් වැනි අත්හළ නොහැකි වියදම්ය. එම වියදම් සඳහා සියලු බදු වර්ග යෝජනා කිරීමෙන් පසුද ආණ්ඩුවේ ආදායම ලෙස ඇස්තමේන්තු ගත කර තිබුණේ රු. බිලියන 2047කි. ඒ අනුව අයවැය හිඟය රු. බිලියන 740ක් හෙවත් කෝටි 740,000ක් විය. මෙය දැන් තවත් වැඩිවී තිබිය හැක. එය පසෙක තැබුවත් මින් කියවෙන්නේ කුමක්ද? 2016 වසරේ රජයේ අත්‍යාවශ්‍ය වියදම් ටික වෙනුවෙන් රු. බිලියන 740ක් අඩු බවය. මෙය සොයාගත නොහැකි වුවහොත් මාස 06 කින් 07 කින් ආණ්ඩුවේ සියලු වැඩ නතරවිය හැකිය. ප්‍රශ්නය ඒ තරම් බරපතළය.

දැන් ආණ්ඩුව ණය හා ආධාර හිඟමින් ලෝකය වටා යන්නේ මේ නිසාය. දැනටමත් ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ණය ඉල්ලා ඇත. මූල්‍ය අරමුදලද ලංකාවට ණයක් දීම ගැන සලකා බලමින් යන බව වාර්තා වේ. එහි ණය ප්‍රමාණය තවම පැහැදිලි නැත. එහෙත් එකක් පැහැදිලිය. ඒ, මූල්‍ය අරමුදලින් ණයක් ගන්නා බවය. මීට පෙරද 2009 කාලයේ මූල්‍ය අරමුදල ලංකාවට ඩොලර් බිලියන 2.6ක ණයක් වාරික වශයෙන් ගෙවීමට අනුමත කළා අපට මතකය. ඒ 2008 අග ලෝක පරිමාණයෙන් ඇතිවූ ආර්ථික අවපාතයේ සමයේය. දැන් නැවත මූල්‍ය අරමුදලින් ණයක් ගැනීමට ආණ්ඩුවට සිදුව තිබෙන්නේ, මූල්‍ය අර්බුදය බරපතළ නිසාය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සංවර්ධන ව්‍යාපෘති සඳහා ණය දෙන ආයතනයක් නොවේ. එය ණයක් අනුමත කරන්නේම රටක මූල්‍ය අර්බුදයක් ඇතිවූවිට ඊට විසඳුමක් ලෙසය. මෙහි බරපතළ කරුණ වන්නේ, මූල්‍ය අරමුදල ණයක් දෙනවිටම රටකට ආර්ථික හා දේශපාලන කොන්දේසිද පැනවීමය. එම කොන්දේසි කිසිලෙසක රටේ ජනතාවට සුබ වන්නේ නැත.

> දැනටමත් ලොව පුරාම ඔප්පුකර තිබෙන පරිදි ණය ගැනීම යනු අර්බුදයට විසඳුම නොව අර්බුදය තාවකාලිකව කල්දමා ගැනීමක් හා යළි මෙයටත් වඩා බරපතළ ලෙස එය ආපසු කැඳවා ගැනීමක් වේ.

මෑතදී සිදුකළ ජනාධිපතිවරයාගේ යුරෝපා සංචාරයේ අරමුණ දෙස බලන විටද පෙනෙන්නේ රට මූල්‍ය අර්බූදයකට මුහුණ දී ඇති බවය. ජනාධිපතිවරයා යුරෝපයේ සංචාරයක නිරතවූයේ සැබැවින්ම කීයක් හරි හොයා ගැනීමටය. ජර්මනියේ සංචාරය ඉන් ප්‍රධාන විය. ජර්මනිය හා ලංකාව අතර පසුගිය කාලයේ සමීප මිත්‍රත්වයක් තිබුණේ නැත. දැන් ජනාධිපතිවරයා ජර්මනියට ගියේ, එම දුරස්ථ බව නැතිකර ගැනීමට වඩා 'ආධාරයක්' ලබා ගැනීමටය. මාධ්‍ය වාර්තාකර තිබූ පරිදි ජර්මනිය ලංකාවට යුරෝ මිලියන 14ක මුදලක් ප්‍රදානයක් ලෙස දීමට එකඟවී තිබේ. එය එතරම් විශාල මුදක් නොවේ. එහෙත් අර්බුදයේ ප්‍රමාණයට අනුව ආණ්ඩුවට එයද වටී.

මේ අතර, ආණ්ඩුව ආසියානු සංවර්ධන බැංකුවෙන්ද ණයක් ගැනීමට සූදානම් වන බව පෙනේ. පසුගිය පෙබරවාරි 23 මාධ්‍ය වාර්තාවල දැක්වූණේ ආසියානු සංවර්ධන බැංකුව ලංකාවට එක්සත් ජනපද ඩොලර් බිලියන 02ක ණයක් දීමට ඉලක්ක කර සිටින බව එහි සභාපතිවරයා පැවැසූ බවය.

මේ අතර චීනයෙන් ණය මුදලක් ගැනීම සඳහා අගමැතිවරයා චීන සංචාරයක නිරතවීමට සූදානම් බවක්ද මාධ්‍ය වාර්තාකර තිබුණි. මේ සියල්ල එක්ව ගත් විට පෙනෙන්නේ, ආණ්ඩුව දැවැන්ත මූල්‍ය අර්බුදයකට මුහුණදී සිටින බවත් ඉන් මිදීම සඳහා ණය ගතහැකි හැම තැනකින්ම ණය ගැනීමට කටයුතු කරමින් සිටින බවත්ය.

දැනටමත් ලොව පුරාම ඔප්පුකර තිබෙන පරිදි ණය ගැනීම යනු අර්බුදයට විසඳුම නොව අර්බුදය තාවකාලිකව කල්දමා ගැනීමක් හා යළි මෙයටත් වඩා බරපතළ ලෙස එය ආපසු කැඳවා ගැනීමක් වේ. දැනටමත් ලංකාව ණය උගුලක සිරව සිටී. මේ වන විටද කලින් ගත් ණයවල වාරික හා පොලී ගෙවීම රාජ්‍ය වියදම්වල විශාල පංගුවක් බවට පත්ව ඇත. ලංකාවේ වසරක ණය හා පොලී වාරිකයේ ප්‍රමාණය වසරක රාජ්‍ය ආදායම ඉක්මවන තත්වයට පත්ව තිබේ.

මෙම මූල්‍ය අර්බුදය ජනතාවට බලපානු ඇත්තේ කෙසේද? අප කල්පනා කළ යුතු කරුණ එයයි. පැහැදිලිව මෙම අර්බූදය අවසානයේ ජනතාව මත පැටවීම වැළක්විය නොහැක. පවතින තත්වය හමුවේ ආණ්ඩුවට සිදුවන්නේ, රාජ්‍ය වියදම් 'අඩුකිරීම' හා ආදායම් 'වැඩිකිරීම' යන ක්‍රියාමාර්ග ගැනීමටය. මෙම ක්‍රියාමාර්ග දෙකම ජනතාවට හානිකරය. ආණ්ඩුවේ වියදම් අඩුකිරීම යනු ජනතාවට ලැබෙන සහන කප්පාදු වීමය. දිනාගත් සහන යළි අහෝසිවීමය. ආදායම් වැඩිකිරීම යනු ජනතාව මත අලුතින් බර පැටවීමය. දැනටමත් ආණ්ඩුව ලෝක වෙළඳපොළේ තෙල් මිල අඩුවීමේ වාසිය ජනතාවට ලබා නොදී එය ගසාකමින් සිටී.

අනෙක් අතට මෙම අර්බුදයට විසඳුම් සෙවීම සඳහා ආණ්ඩුවේ ආර්ථික උපාය මාර්ගය වී ඇත්තේද විවෘත ආර්ථිකය තවදුරටත් පුළුල් කිරීමය. මේ වන විට විවෘත ආර්ථිකය තුළ රටේ කර්මාන්ත හා සම්පත් විකුණා ඇති අතර දැන් ඉතිරිව ඇත්තේ ඉඩම් පමණි. වර්තමාන ආණ්ඩුව දැන් සූදානම් වන්නේ, ඉඩම් ටික විදේශ ජාවාරම්කරුවන්ට ලබාදී කීයක්හරි හොයා ගැනීමටය. පසුගිය අයවැයෙන්ම විදේශිකයන්ට ලංකාවේ ඉඩම් ගැනීමේදී අයකළ 100% බද්ද ඉවත්කිරීම ඊට උදාහරණය. එසේම එක් පුද්ගලයෙකුට ලංකාවේ ඉඩම් ලබා ගැනීමේ අක්කර 100 සීමාව 250 දක්වා වැඩිකිරීමට යාමද එහිම තවත් පියවරකි. මෙය රටේ ඉඩම් ප්‍රශ්ණයක් හැදීමට හේතුවන අතර ඉන් පීඩාවට පත්වන්නේ ද ගොවි ජනතාව ඇතුළු මෙරට පීඩිත ජනතාවය.

ආණ්ඩුව මුහුණ පා ඇති මෙම මූල්‍ය අර්බුදයත් ධනපති ක්‍රමයේ පොදු අර්බුදයත් ආණ්ඩුවේ අභ්‍යන්තර අර්බුදත්, නොහැකියාවත් යන සියලු කරුණු එක්වූ විට නිර්මාණය වන තත්වය ඉතාමත් බැරෑරුම්ය. එය පොදු ජනතාවට හිතකර තත්වයක් නොවේ. ඉන්දු - ශ්‍රීලංකා වෙළඳ ගිවිසුම් එන්නේද ඒ අස්සේය. එය එවිට ලංකාවේ ආර්ථිකය සම්බන්ධයෙන් "ගහෙන් වැටුණ මිනිහාට ගොනා ඇන්නා වාගේ" වනු ඇත. මෙම තත්වය විසින් පීඩාවට පත්වන ජනතා බලවේග ඊට එරෙහිව අරගල කිරීමට සූදානම් වන විට අගමැතිවරයා අනතුරු ඇඟවීමක්ද කර ඇත. ඒ, මර්දනයේ පැත්තෙනි. මේ දුර්වල ආණ්ඩුවට, හවුල් ආණ්ඩුවට මර්දනයේ අවිය පහසුවෙන් යොදාගත නොහැක. එසේ වුවත් ආණ්ඩුවේ නායකයින්ගේ අභිලාෂය ප්‍රශ්නවලට විසඳුම් දීම නොව විසඳුම් ඉල්ලන අය මර්දනය කිරීමය. ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය ධනවාදය යටතේ විහිළුවක් වන්නේ එසේය. දැන් මෙරට පීඩිත බලවේගය ඇතුළු මෙම අර්බුදයෙන් පීඩාවට පත්වන සැමට ඇත්තේ එක් තෝරා ගැනීමක් පමණි. ඒ, ධනපති ක්‍රමය තුළ ආණ්ඩු විසින් පවසනු ලබන සංවර්ධනයේ මිත්‍යාවට යට නොවී සැබෑ ආර්ථික සංවර්ධනය සඳහා ධනපති ක්‍රමය පරදා නව සමාජයක් බිහිකිරීම සඳහා පෙළ ගැසීමය. බලවේග පෙළ ගැස්වීමය. තවදුරටත් පමා කළ යුතු නැති කාර්ය එයය. ඊට දායකවීම කාගේත් වගකීමය.

# එට්කාට එරෙහිව ජ.වි.පෙ.න් සම්මන්ත්‍රණ

පසුගිය පෙබරවාරි මුල් සතිය පමණ වන විට ෆේස් බුක්, වෙබ් අඩවි මෙන්ම ඇතැම් විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍යද හරහා විවිධ දෝෂාරෝපණ එල්ල වෙමින් තිබුණේ එට්කා ගිවිසුම සම්බන්ධයෙන් ජ.වි.පෙ. මුනිවත රකින්නේ යැයි පවසමිනි. සැබැවින්ම එම විවේචන ගොඩනගන්නන්ගේ දේශපාලන මූලයන් ගත් විට ජ.වි.පෙ. මෙයට සම්බන්ධ නොවනවාට වඩාත්ම කැමති ඔවුන් බවද පෙනී යයි.

ඇතැමුන්ගේ මතය වී ඇත්තේ ඉන්දියාව කී සැණින් ජ.වි.පෙ. වහා විරුද්ධ විය යුතු බවය. තම තමන්ගේ දේශපාලන දැනුම මෙන්ම තමන් දරන දේශපාලන ආස්ථානවල සිටිනවුන්ට එසේ සිටීමට ඉඩදී ජ.වි.පෙ. විසින් එට්කාට එරෙහි දැවැන්ත වෙඩි මුරයක් පසුගිය පෙබරවාරි 18 වෙනිදා කොළඹ මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරයේදී මුදාහරිනු ලැබීය.

ඉන්දියාවේ ආර්ථික සහ දේශපාලන වුවමනාව මෙම ගිවිසුම මගින් ක්‍රියාත්මක වීම අනිවාර්යක් වන බවත් අගමැති රනිල් වික්‍රමසිංහ මගින් ක්‍රියාත්මක වන්නේ එම වුවමනාව බවත් ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා පැවසීය. ඔහු මේ බව ප්‍රකාශ කළේ පෙබරවාරි 18වෙනිදා කොළඹ මහවැලි කේන්ද්‍ර





ශ්‍රවණාගාරයේදී පැවති "රටේ ආර්ථිකය ඉන්දියාවට බිලි දෙන එට්කා එපා! " සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය පවත්වමිනි. මෙම සම්මන්ත්‍රණය දිවයිනේ ප්‍රධාන නගර රැසකදී පැවැත්වීමට නියමිතය.

ජ.වි.පෙ. විසින් සංවිධානය කර තිබූ මෙම සම්මන්ත්‍රණය සඳහා වෛද්‍යවරුන්, වෘත්තීයවේදීන්, විශ්වවිද්‍යාල ආචාර්යවරු ඇතුළු විශාල පිරිසක් සහභාගී සිටියහ.




# රුසියාවට ගිය SYU

ජ.වි.පෙ.ට අනුබද්ධ සමාජවාදී තරුණ සංගමය ජාතිකව මෙන්ම ජාත්‍යන්තරවත් මෙරට ක්‍රියාත්මක වන අනෙක් තරුණ සංවිධාන අභිභවා යමින් සිටී. ජාත්‍යන්තර තලයේ පැවත්වෙන තරුණ වැඩමුළු, තරුණ සමුළු ආදියට මෙරටේ එකම නියෝජනය සමාජවාදී තරුණ සංගමය බවට පත්වෙමින් ඇත.

පසුගිය පෙබරවාරි මාසයේදී රුසියාවේ මොස්කව් නුවර පැවති ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ නියෝජිත සමුළුවක් සඳහා තරුණ සංගමය නියෝජනය කරමින් එහි ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා සහභාගි වූ අතර සමාජවාදී ශිෂ්‍ය සංගමය නියෝජනය කරමින් එම සමුළුව සඳහා පුබුදු සමරවීර සහෝදරයාද සහභාගි විය. සමාජවාදී ශිෂ්‍ය සංගමය ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ උප සභාපති ධූරයද උසුලනු ලබයි.

පෙබරවාරි මස 02දින සිට 08දින දක්වා පුරා දින 06ක් පැවති මෙම සමුළුව සඳහා ආසියා පැසිෆික්, අප්‍රිකා, යුරෝපා සහ උතුරු ඇමරිකානු, ලතින් ඇමරිකානු හා කැරිබියන් සහ මැදපෙරදිග කලාපයන් නියෝජනය කරන රටවල් 45ක අධිරාජ්‍ය විරෝධී සංවිධාන සහභාගිවී සිටියහ.

# භික්ෂු සමුළුවේ ප්‍රධාන දෙසුම ජ.වි.පෙ.න්

1948න් පසු මෙරට සිටි පාලකයන් අතුරෙන් රාජපක්ෂ පාලනය තරම් භික්ෂූන් වහන්සේලා තම බල ව්‍යාපෘතිය සඳහා යොදාගත් පාලනයක් දක්නට නොමැත. විටෙක වරදාන දෙමින්ද තවත් විටෙක තර්ජනය කරමින්ද ඔවුහු තම පාලනය පවත්වාගෙන ගියහ. තමන්ට එරෙහි භික්ෂු ව්‍යාපාරයන් මර්දනය කරමින්ද හිතැති ව්‍යාපාරයන් ප්‍රවර්ධනය කරමින්ද ගිය ඒ ගමන තුළ සැබෑ භික්ෂු ව්‍යාපාරයක වුවමනාව අන් කවරදාටවත් වඩා ලාංකේය සමාජයට වුවමනා විය.

ඒ වුවමනාව සපුරනු වස් ජාතික භික්ෂු පෙරමුණ නව ජවයකින් ඉදිරිගමනක් ආරම්භ කර තිබේ. පසුගිය පෙබරවාරි මස 12වෙනිදා "භික්ෂුවගේ උරුමයත් ජනතාවගේ නිදහසත් දිනා ගැනීම සඳහා ලාංකේය භික්ෂුව පෙළගස්වන ජාතික සමුළුව" මැයෙන් ජාතික භික්ෂු පෙරමුණේ සමුළුවක් කොළඹ පදනම් ආයතනයේදී පැවැත්විණි. එහි ප්‍රධාන දේශනය පැවැත්වන ලද්දේ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයාය.

මහාචාර්ය අත්තංගනේ රතනපාල හිමි, නයිගල රජමහා විහාරාධිපති පූජ්‍ය වකමුල්ලේ උදිත හිමි, පොළොන්නරු දිස්ත්‍රික්කයේ ප්‍රධාන සංඝනායක තමන්කඩුවේ සරණ ජෝති හිමි, විශ්‍රාමලත් විදුහල්පති මාතර පළාතේ ප්‍රධාන සංඝනායක පූජ්‍ය හඳුගල රතනපාල හිමි ඇතුළු මහා සංඝරත්නයද, ගිහි පැවිදි විශාල පිරිසක්ද මේ අවස්ථාවට සහභාගි වූහ.



# ජ.වි.පෙ. උතුරේ ධීවර ගැටලු වෙනුවෙන්



ජාතිවාදී ප්‍රවණතාවන්ගේ සැලකිය යුතු වෙනසක් සිදුවූයේ රාජපක්ෂ පාලනය බිඳ වැටීමෙන් අනතුරුවය. එම පාලනය පෙරළා දැමීමට පළමු ගල ගසන ලද්දේ ජ.වි.පෙ. බවද නොරහසකි. වත්මන් රනිල් - මෛත්‍රී හවුල් පාලනය මහින්ද එළවා දමා ජනතාව බලාපොරොත්තු වූ කාරණා ඉටු නොකරන තත්වයකට පත්ව සිටියද, නැවතත් ලාංකේය සමාජය ජාතිවාදය, ආගම්වාදය දෙසට ගෙන යාමට නොහැකි ලෙස ජනතා පවුරක් ඉදි වෙමින් පවතී. එම පවුරටද මුල් ගල තබා ඇත්තේ ජ.වි.පෙ.ය.

පසුගිය පෙබරවාරි 05 වනදා උතුරු, දකුණු ධීවර ජනතාවගේ සහභාගිත්වයෙන් කොටුව දුම්රියපොළ ඉදිරිපිටදී උද්ඝෝෂණයක් පැවැත්විණි. ඉන්දීය ධීවරයින් නීති විරෝධී ආකාරයට උතුරු මුහුදු සීමාවට ඇතුල් වී මත්ස්‍ය සම්පත සොරා ගැනීමට එරෙහිව මෙය සංවිධානය කර තිබුණි.

කලක් උතුරේ ජනතාව තමන්ගේ ගැලවුම්කාරයා ඉන්දියාව යැයි සිතා සිටියෝය. පසුකාලීනව උතුරේ දේශපාලන නායකත්වය තමන්ගේ ගැලවුම්කාරයන් යැයි උතුරේ ජනතාව සිතා සිටියහ. එහෙත් ඔවුන් විශ්වාසය තබා සිටි කිසිම ගැලවුම්කරුවෙකු ඉන්දීය ධීවරයන්ගේ මේ ආක්‍රමණයට එරෙහිව ඔවුන් සමග එකට හිට ගත්තේ නැත.

අවසානයේදී ඔවුන්ගේ ගැටලු පිළිබඳව අවධානය යොමු කොට ඒ සඳහා ක්‍රියාමාර්ගයන්වලට යොමු වූයේ ජ.වි.පෙ.ට අනුබද්ධ සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනය පමණි. පෙබරවාරි 05වැනදා පැවති උද්ඝෝෂණ ව්‍යාපාරය උතුරු පළාත් ධීවර සමුපකාර සමිති සම්මේලනයද සහභාගි කරවා ගනිමින් සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනය විසින් සංවිධානය කර තිබුණි.

පොදු ධීවර සම්මේලනයේ සභාපති පා.ම. නිහාල් ගලප්පත්ති සහෝදරයා, ජාතික සංවිධායක රත්න ගමගේ සහෝදරයා ඇතුළු උතුරු සහ දකුණු පළාත් නියෝජනය කරමින් ධීවරයෝ රැසක් මෙම උද්ඝෝෂණයට සහභාගි වූහ.

ඉතිහාසය වෙනස් කළ අරගල

# රුසියානු විප්ලවය පෙළගැසෙයි



ඉතිහාසය වෙනස් කළ අරගලයන් පිළිබඳ සාකච්ඡාවේදී මෙවර අප යොමුවන්නේ රුසියාවේ සිදුවූ සමාජවාදී සමාජ විප්ලවය පිළිබඳවය. වහල් හිමියන්ට එරෙහිව ස්පාර්ටකස් මෙහෙයවූ කැරැල්ලත්, ප්‍රංශ හා ඇමරිකන් විප්ලව පිළිබඳවත් අවධානය යොමුකළ විට අපට පෙනීයන්නේ, ඒ සෑම අරගලයක්ම අවසාන වූයේ දේපළ හිමි පංතියක් අතින් තවත් දේපළ හිමි පංතියක් අතට රාජ්‍ය බලය හුවමාරු වීමෙන් බවයි. එහෙත් සමාජවාදී සමාජ විප්ලවය විසින් රුසියාව තුළ සිදුකරනු ලැබුවේ දේපළ හිමි පංතිය අතින් දේපළ අහිමි පංතියට රාජ්‍ය බලය ලබා ගැනීමේ ක්‍රියාවලියයි. එබැවින් රුසියාව තුල සිදුවූ මෙම අරගලය ඉතිහාසයේ සිදුවූ අරගලයන්ට වඩා වෙනස් ආකාරයක් ගනී.

## පූර්ව රුසියාව

එක්තරා අවධියක රුසියාව යනු මුහුදක් නොමැති එනම් මුහුදට පිවිසීමට මාර්ග යක් නොමැති ගොඩබිමෙන් වටවූ රාජ්‍යයක් විය. එරට උතුරු කොටසෙහි පසෙහි නිසරුභාවය සහ අධික ශීතල හේතුවෙන් මනුෂ්‍යවාසයට නුසුදුසු විය. එහෙත් දකුණු ප්‍රදේශය සෞම්‍ය දේශගුණයෙන් සහ සාරවත් පසකින් යුක්ත විය. මෙනිසාම ජනාවාස බිහි වීම මේ ප්‍රදේශයෙන් ආරම්භ වූ බවටද තොරතුරු පවතී. පසු කලෙක දකුණු ප්‍රදේශය දෙසින් කළු මුහුද දෙසට රුසියානු දේශ සීමාව ව්‍යාප්ත කර ගැනීමට පාලකයන්ට හැකි විය. මෙම භූගෝලීය තත්වයන් හේතුවෙන් රුසියාව බොහෝ කාලයක් ලෝකයෙන් හුදකලා වූ රාජ්‍යයක් ලෙස පැවතිණි. එම නිසා රුසියාව සමාජ සංවර්ධනයේ දිශාවට ගමන් කිරීම ඉතාම මන්දගාමී විය. එසේම රුසියාව ගැන සාකච්ඡා කිරීමේදී සාර් රජ පෙළපත මගහැර යා නොහැකි ලෙස ඉතිහාසය හා බැඳී පවතී. ඉදිරියේදී අපගේ සංවාදයේදී සාර් පාලනය ලෙස හඳුන්වනු ලබන්නේ එම පෙළපතේ රජවරුන් ඒ ඒ කාල පරිච්ඡේදයන් තුළ සිදුකළ කාර්ය භාර්යයන්ය.

## සාර් සහ ජනතාව

ඉතිහාස තොරතුරු අනුව 16වැනි සියවසේදී මොස්කව් ප්‍රදේශයේ සිටි අයිවන් නම් කුමාරයෙක් රුසියාවේ පළමුවන සාර් (1533 -84) තනතුරට පත් විය. මෙහි පාලන රටාවද වැඩවසම් ලක්ෂණවලින් සමන්විත විය. ඉඩම්වල අයිතිය රදලයන් සතු වූ අතර එනිසාම ඉඩම්වලට බැද තැබූ ප්‍රවේණි දාසයෝ මෙන්ම ගොවීහුද දැඩි පීඩනයකට ලක් වූහ. ක්‍රිස්තියානි පල්ලියද සාර් පාලනයේ අතකොළු වූ අතර සාර්ට එරෙහි මතවාදයන් අහෝසි කොට හිතැති මතවාදයන් පීඩිතයන්ගේ හිත් තුලට කා වැද්දීම පල්ලියේ ප්‍රධාන රාජකාරිය විය. (දේව මෙහෙයන් සහ පල්ලියේ නොයෙකුත් ක්‍රියා මාර්ග මගින් මෙය සිදු කරන ලදී.)

නිෂ්පාදන උපකරණයන්ගේ අඩු දියුණු මට්ටම නිසාම නිෂ්පාදන ක්‍රියාවලිය පවත්වා ගැනීම සඳහා විශාල වශයෙන් මිනිස් ශ්‍රමය අවශ්‍ය විණි. එනිසාම විශාල ඉඩම් අස්වැද්දීම සඳහා ප්‍රවේණි දාසයන්ගේ සහභාගිත්වය වඩා වැඩි වශයෙන් අවශ්‍ය විය. මේ තත්වය තුළ එම පාලනයේ නීති රීති ඉතා දැඩි වීම අනිවාර්යක් වුයේය. එබැවින් සාර් පාලනයට එරෙහිව වචනයක් හෝ පිට කිරීම ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදුවණ කාරණාවක් විය. සාර් රුසියාවේ ලාංඡනය වූයේ නවුට් (Knout), නොහොත් කසයයි. නවුට් යනු වහලුන්ට පහර දීම සඳහා යොදාග න්නා ලද කසයයි. එසේම එහි ඉතා සංවිධානාත්මකව අධික වධ බන්ධනයන්ට ලක් කර මරා දමන ක්‍රමයක් පැවති අතර එය පොග්රම්(Pogrom) යනුවෙන් හඳුන්වනු ලැබිණි. සාර් රුසියාව ලොව හමුවේ තැබූ මෙම නම් දෙකෙන්ම ඔවුන්ගේ ඒකාධිපති ස්වභාවය ලොවට හෙළිකෙරුණි. එම පාලනයට එරෙහි වූවන්ට ලබා දෙන තවත් දඬුවමක් වූයේ සයිබීරියාව නම් මිනිස් වාසයට නුසුදුසු අධික ශීතල ප්‍රදේශයට පිටුවහල් කිරීමයි. එසේ පිටුවහල් කළ ජනයාගෙ න් කඳවුරු පිරී ඉතිරී ගිය අතර මෙය සැබැවින්ම සොහොන් පිටියකම විය. බොහෝ දෙනා මෙහි කටුක බව දරා ගත නොහැකිව සිය දිවි හානි කරගත්හ.

> වර්ෂ 1689 දී මහා පීටර් වශයෙන් ප්‍රසිද්ධියට පත් වූ සාර්වරයා විසින් යුරෝපයේ ධනේශ්වර සංවර්ධනයේ යම් යම් අංගයන් රුසියාව මත උත්තරාරෝපණය කිරීමට උත්සහ කළ අතර 1782 දී බලයට පත් කැතරින් රැජිණ විසින්ද එම උත්සහයම දරන ලදී. එහෙත් රුසියාව තුළ ධනේශ්වර සංවරධනයක් ඇති කිරීමට ඔවුනට නොහැකි විය.

වර්ෂ 1689 දි මහා පීටර් වශයෙන් ප්‍රසිද්ධියට පත් වූ සාර්වරයා විසින් යුරෝපයේ ධනේශ්වර සංවර්ධනයේ යම් යම් අංගයන් රුසියාව මත උත්තරාරෝපණය කිරීමට උත්සහ කළ අතර 1782 දී බලයට පත් කැතරින් රැජිණ විසින්ද එම උත්සහයම දරන ලදී. එහෙත් රුසියාව තුළ ධනේශ්වර සංවරධනයක් ඇති කිරීමට ඔවුනට නොහැකි විය. කෙසේ නමුත් සාර්වරුන්ගේ ඒකාධිපති පාලනය තුළ සිදුවූයේ සාමාන්‍ය ජනතාව, ප්‍රවේණි දාසයන්, ගොවීන් ආදී පහළ ස්ථරවල කොටස් වඩ වඩාත් පීඩාවට පත්වීමයි. ඔවුනට එසේ වෙද්දී අධ්‍යාපනය ලැබීම, රජයේ උසස් නිලවලට පත්වීම, රදලයන්ට පමණක් සීමා විය.

එසේම සාර්වාදී වැඩවසම් රුසියාව 'ජාතීන්ගේ සිරගෙය' නම් අන්වර්ථ නාමයෙන්ද හඳුන්වනු ලැබිණි. ඒ, සාර්වරුන් විසින් රුසියාව අවට කුඩා රාජ්‍යයන් යටත් කරගනිමින්ද රුසියානු අධිරාජ්‍යයක් නිර්මාණය කිරීමට කටයුතු කිරීම නිසාය. ඈඳාගත් රටවලට විවිධ ජාතිකත්වයන්ට අයත් ජනතාව මහා රුසියානු ස්ලාව් ජාතිවාදයේ පීඩාවට යටත්කිරීමටද ඔවුහු කටයුතු කළහ.

"රුසියානු ගැමි ජනයා ඇත්ත වශයෙන්ම වහල්ලු වූහ. තම ගම් බිම් වල ඇද බැඳ තබන ලැබූ ඔවුන්ට විශේෂ අවසරයක් නොමැතිව ඉන් පිටවිය නොහැකි විය. අධ්‍යාපනය උසස් නිලධාරීන් හා බුද්ධිමතුන් කිහිප දෙනෙකුට සීමා විය. ඒ සෑම දෙනෙකුම තොරා ගනු ලැබුවේ ඉඩම් හිමි රදල පංතියෙනි. නියම මධ්‍යම පංතියක් එහි නොවීය. ගැමි ජනයා නොදියුණු නූගත් කොටසක් විය. ඔවුනට විඳීමට තිබූ අධික වද හිංසා හේතු කොට ගෙන අතීතයේදී නිරන්තර කැරළි ඇති වුවද , ඒවා සැමෙකක්ම පාගා මිරිකා යටපත් කර දමනු ලැබීය"

(ලෝක ඉතිහාස සිහිවටන - ශ්‍රී ජවහර් ලාල් නේරු, පිටුව 657)

## අදහස් පිපිරීම

ඉහළ පංති ස්ථරයේ පුද්ගලයින්ට ලැබුණු වරප්‍රසාද හේතුවෙන් ඔවුන්ට විදේශයන්හි අධ්‍යාපන ලැබීමේ අවස්ථා මෙන්ම ඒවායෙහි සංචාරය කිරීමේ අවස්ථාද හිමි වුණි. විශේෂයෙන්ම ඒ හරහා යුරෝපය පුරා පැතිර ගිය රාජාණ්ඩුවලට එරෙහි මතවාදයන් රුසියාවට ඇතුල් වන්නට විය. එසේම ඇමරිකන් මෙන්ම ප්‍රංශ විප්ලවයන්ද රුසියානු උගත් පරපුර වෙත බලපෑම් සිදු කරන ලදී.

තවත් පැත්තකින් කලා හා සාහිත්‍යමය කේෂත්‍ර තුළින්ද සැලකිය යුතු බලපෑමක් මෙම ප්‍රජාව මත වෙත එල්ල විය. ඇලෙක්ස්සැන්ඩර් පුෂ්කින්, ගොගොල්, ටර්ගෙනව්, ඩොස්ටොය්ව්ස්කි හා ඇන්ටන් චෙකොෆ්ද එසේම ලියෝ ටෝල්ස්ටෝයි හා මැක්සිම් ගොර්කි වැනි ශ්‍රේෂ්ඨ සාහිත්‍යවේදීන්ගේ මඟ පෙන්වීම්ද උගත් පරපුර වෙත නැවුම් හැඟීම් ගෙන ආවේය.

සාර් පෙළපතේ ඒකාධිපති පාලනයත් යුරෝපය දෙසින් පැමිණි නිදහස පිළිබද නව අදහස් හේතුවෙන් උගත් ප්‍රජාවට නිසොල්මනේ සිටිය නොහැකි තත්වයක් උද්ගත විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂ 1825 දී තරුණ නිලධාරීන් පිරිසක් සහ උගත් මෙන්ම බුද්ධිමත් පිරිස්ද එක් වී සාර්ට එරෙහිව කැරැල්ලක් ගැසූහ. සාර් විසින් තම දේශපාලනික ක්‍රියාකාරීත්වය යටපත් කර දමනු ඇති බැවින් මෙම කැරැල්ලට අදාල සංවිධාන කටයුතු කෙරුණේ ඉතා රහසිගතවය. කැරැල්ල යටපත් කෙරුණද මෙය රුසියාවේ දේශපාලන පිබිදීමේ ගුණාත්මක පිම්මක් විය. සාර් පාලනයේ නොයෙක් මර්දනකාරි තත්වයන් මැද මෙම නව අදහස් උගත් ප්‍රජාව අතර පැතිරුණි.

මේ අතර 19 වන සියවස අග භාගය පමණ වන විට යුරෝපයේ ප්‍රචලිතව තිබූ මාක්ස්වාදයේ බලපෑම්ද රුසියාවට කාන්දු විය. ගොවි ව්‍යාපාරයන්හි ක්‍රියාකාරීව සිටි 'නරොද්නික' ව්‍යාපාරයේ පුරෝගාමියෙකු වූ ප්ලෙහනොව් වැන්නන් විසින් රුසියාවට මාක්ස්වාදය හඳුන්වා දීමට මුල පුරන ලදී. ඒ අනුව නව සමාජවාදී අදහස්ද උගත් ප්‍රජාව අතර වේගයෙන් ව්‍යාපත් විය. දහස් ගණන් ශිෂ්‍යයෝ ගම් බිම් කරා ගොස් මේ සම්බන්ධයෙන් ගැමි ජනතාවට අවබෝධය ලබා

15වැනි පිටුවට



"සාර් එලවා දැමීම දුෂ්කර දෙයක් නොවීය. ඒ සඳහා අවශ්‍ය වුයේ දින කිහිපයක් පමණකි. ඉඩම් හිමියන් පන්නා දැමීමත් බොහෝ දුෂ්කර දෙයක් වුයේ නැත. එය මාස කිහිපයකින් කළ හැකි විය. ධනපතීන් පන්නා දැමීමත් මහත් දුෂ්කර වුයේ නැත. නමුත් පන්ති අහෝසි කිරිම අනුපමේය තරම් දුෂ්කරය."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**11වැනි වෙළුම,**
**පිටුව 68**

# නැවත හොල්මන් කරන ලෝක ආර්ථික අර්බුදය

ආර්ථික විද්‍යාඥයින් විසින් ලෝක ආර්ථික අර්බුදය පිළිබඳ යළිත් කථා කරන්නට පටන් ගෙන තිබේ. 2016 -17 කාලය තුළ දී නැවතත් 2008 සැප්තැම්බර් පන්නයේ ආර්ථික අර්බුදයක් ඇති වනු ඇතැයි ධනේශ්වර ආර්ථික විද්‍යාඥයින් විසින් අනාවැකි පළ කරන්නට පටන් ගත්තේ මේ අවුරුද්ද ආරම්භයේදීමය.

ඉන්දියාවේ Economic and Political Weekly සඟරාවට අදහස් දැක් වූ තුර්කි ආර්ථික විද්‍යාඥ ටී.සැබ්රි ඔන්කු පැවසුවේ ලෝක ආර්ථිකය 2007 යානිස් වැපෝෆාකිස් ප්‍රකාශ කර සිටියේ, දේශපාලන ආර්ථිකයේ දී ඕනෑම දෙයක් සිදුවිය හැකි බැවින් 2008 පන්නයේ ඇර්බුදයක් යළි ඇතිවීම නොවැළැක්විය හැකි බවය.

එක්සත් ජනපද මහා භාණ්ඩාගාරයේ ආර්ථික ප්‍රතිපත්තිය පිළිබඳ සහකාර ලේකම් ආචාර්ය පෝල් ක්‍රේග් රොබර්ස් පවසන්නේ, එක්සත් ජනපදයේ 2008 වර්ෂයේ ඇති වු ආර්ථික අර්බුදය තවමත් යථා තත්වයට පැමිණ නැති බව හා යළි එය යථා තත්වයට පත් නොවන බවයි.

දිගු කාලීන ආර්ථික ප්‍රවණතා පිළිබඳ අධ්‍යායන ආයතනයේ සභාපති ක්‍රියාමාර්ගයකි. එහි මූලික පියවරයන් වී ඇත්තේ, සහන කප්පාදුව හා පුද්ගලීකරණයයි. වැටුප් කප්පාදුවත්, විරැකියාවත් එය පසුපස එන අනිවාර්යය ප්‍රතිඵලයයි. **මේ තත්වය තුළ සමාජ ධනය 1%ක් පමණ සුළු පිරිසක් අත සංකේන්ද්‍රණය වී ඇති අතර සමාජ ධනය අහිමි කරනු ලැබූ 99% ඉදිරියේදී උසස් ජීවන තත්වයක්, වැඩි වැටුප්, වෙනුවෙන්ද ඒකාධිකාරයන් පාලනය කළ හැකි ක්‍රමවේදයක් වෙනුවෙන්ද සාධාරණ බදු ක්‍රමයක් වෙනුවෙන්ද සටන් වදිනු ඇති බව ඔහුගේ අදහසයි.**

මේ වන විට ලෝක ආර්ථිකයේ මතු වී ඇති තත්වය විවිධ ආර්ථික ගුරුකුලවල අය විවිධ නම්වලින් හඳුන්වමින් සිටිති. ඇතමුන් මෙය සමස්ත. ඉල්ලුමේ අඩුවීමක් ලෙසද මූල්‍ය අස්ථායිතා කල්පිතය අනුවද පමණ ඉක්ම වූ පුද්ගලික ණය ලෙසද පැහැදිලි කිරීමට උත්සාහ කළද සිදුවී ඇත්තේ එකම දෙයකි.

ධනේශ්වර සීමාවන් තුළ මෙම අර්බුදය විග්‍රහකර ගැනිමට යාමේදීත් ඒවාට විසඳුම් සෙවිමට යාමේදීත් ප්‍රශ්නයේ එක් හෝ තවත් පැත්තක් ගැන පමණක් විග්‍රහ කෙරේ. එක් හෝ තවත් පැත්තකට පමණක් විසඳුම් ඉදිරිපත් කෙරේ.




වසරේ ගිම්හානයේ සිටම ආගාධයකට වැටෙමින් සිටින අතර මේ අවුරුද්දේ දී සිදුවිය හැක්කේ එය තවත් නරක අතට හැරිමක් පමණක් බවයි. ඔහුට අනුව ලෝක ආර්ථික අර්බුදයේ බරපතළකම පෙන්වන වැදගත් සිදුවීම් කිහිපයක් 2016 වසර මුලදීම සිදු වී ඇත.

i. ඉතාලි බැංකු පද්ධතිය කඩා වැටෙනු ඇතැයි පැතිර ගිය ආරංචිය
ii. ඕලන්ද බැංකුව බංකොලොත් වනු ඇතැයි පැතිර ගිය ආරංචිය
iii. චීනයේ ණය ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් ට්‍රිලියන 5 ඉක්මවීම
iv. ජපානයේ ඍණ පොලී අනුපාතික වැඩපිළිවෙළ
v. අවුරුදු 10කදී එක්සත් ජනපදයේ භාණ්ඩාගාරික අනුපාතිකය 1.8% කට වඩා පහළ බැසීම හා එය වේගයෙන් උච්චාවචනය වීම.
vi. බොරතෙල් බැරලයක මිළ ඩොලර් 30 ට වඩා අඩුවීම හා එහි මිල වේගයෙන් උච්චාවචනය වීම
vii. රන් මිල (රන් අවුන්සයක - ට්‍රොයි අවුන්සය) එක්සත් ජනපද ඩොලර් 1115ට වඩා ඉහළ යාම හා වේගවත් මිල උච්චාවචනය
viii. ලෝක වෙළඳාමේ තත්වය පෙන්වන Baltic Dry Indexහි අගය ඉතිහාසයේ පළමු වතාවට 300ට වඩා පහත බැසීම, මෙම වැදගත් සිදුවීම්ය.

2016 ජනවාරි 29 වන දින The Guadian පුවත්පතට කරුණු දැක් වූ හිටපු ග්‍රීක මුදල් ඇමති ආර්ථික විශේෂඥ ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය මයිකල් හඩ්සන් පින්ලන්ත පුවත්පත් වාර්තාකරුවකු සමඟ සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීය. එහිදී ඔහු ඉදිරිපත් කළ කරුණු අනුව 2008 අර්බුදයේදී එක්සත් ජනපද මහා භාණ්ඩාගාරය විසින් ගත් ක්‍රියාමාර්ග හරහා යථා තත්වයට පත්වූයේ මහා පරිමාණ මූල්‍ය ආයතන පමණකි. මේ නිසා සැබෑ ආර්ථිකය - නිෂ්පාදන ක්ෂේත්‍රය- නොසලකා හැරුණු අතර සැබෑ අර්බුදය ඇත්තේ එතැනය. ඔහුට අනුව මේ මොහොතේදී ද මූල්‍ය ආර්ථිකය (විශේෂයෙන් එක්සත් ජනපද කොටස් වෙළඳපොළ - Wallstreet) සැබෑ ආර්ථිකයට එරෙහිව යුද්ධයක් ප්‍රකාශයට පත්කර ඇත. එහි දී මූල්‍ය ධනපතියන්ගේ ප්‍රධාන ආයුධය වී ඇත්තේ Federal Reserve හෙවත් එක්සත් ජනපද මහා භාණ්ඩාගාරයය, මූල්‍ය ධනපතියන් එය සිය ග්‍රහණයට ගෙන ඇත.

එළඹෙන එක්සත් ජනපද ජනාධිපතිවරණයේදී ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ අපේක්ෂක හිලරි ක්ලින්ටන්ගේ ජයග්‍රහණය වෙනුවෙන් මේ වන විටත් එක්සත් ජනපදය කොටස් වෙළඳපොළ හෙවත් Wallstreet කටයුතු කරමින් සිටී.

මයිකල් හඩ්සන්ට අනුව ආර්ථික අර්බුදයට පිළියමක් ලෙස එක්සත් ජනපදය හා යුරෝපය තුළ මේ වන විට හඳුන්වාදී ඇති අරපිරිමැසුම් හෙවත් කප්පාදු වැඩපිළිවෙළ මූල්‍ය ධනපතියන් විසින් සැබෑ ආර්ථිකයට එදිරිව ගත්

මේ සියලු මත දැක්විම් අනුව පෙනී යන්නේ, ලෝක ආර්ථිකය විශේෂයෙන් එහි තීරක සාධකයක් වන එක්සත් ජනපද ආර්ථිකය හා යුරෝපා ආර්ථිකය මින් පෙර නොවූ විරූ බරපතළ අර්බුදයක ගිලී ඇති බවය. එය ඕනෑම මොහොතකදී පුපුරා යා හැකි මට්ටමකට වර්ධනය වී ඇති බවය.

**"එංගල්ස් පැවසූ පරිදි ආර්ථික අර්බුදයකදී ධනවාදී නිෂ්පාදනය හා හුවමාරුව පීලි පනී. ළඟ එන අර්බුදයක ප්‍රථම සලකුණු සාමාන්‍යයෙන් සංසරණ ක්ෂේත්‍රයෙන් මතුවේ. එය මුදල් සංසරණයේ හා ණය පහසුකම්වල විද්‍යාමාන වේ. බොහෝ ව්‍යාපාරික ආයතන හා බැංකු, විශාල ඒවාද ඇතුළුව බංකොලොත්භාවයට පත් වේ. කර්මාන්ත හිමියන්, වෙළෙඳුන්, බැංකුකරුවන් හා තැරැව්කරුවන් අතර භීතිය පැතිර යයි. සියලු දෙනාටම මූල්‍ය ප්‍රාග්ධනයේ බලවත් වුවමනාවක් ඇති වේ. ණය හිමියන් ණය ගෙවන ලෙස බලකර සිටිති. තැන්පත්කරුවන් තමන්ගේ තැන්පතු මුදල් ආපසු ලබා ගැනීමට බැංකුවලට රොක් වෙති. අලෙවි කරගත නොහැකි භාණ්ඩවලින් වෙළඳපොළ පිරී ඉතිරී යයි. බොහෝ ව්‍යවසායයන්, විශේෂයෙන් කුඩා ඒවා වසා දමනු ලැබේ. මිල ගණන් පහත වැටුණුද සඵල ඉල්ලුම වැඩි නොවේ. එසේම අති විශාල හුවමාරු භාණ්ඩ රාශිය අඩු නොවේ."**

*(දේශපාලන ආර්ථික විද්‍යාව යනු කුමක්ද? - **S.** ඉල්යින් සහ **A.** මොතිල්යොව්)*

## දකුණු චීන මුහුදේ චීන-එ.ජ. යුද සූදානම




ඇමරිකා එක්සත් ජනපදය චිනයට එරෙහිව දකුණු චීන මුහුදේ අර්බුදයක් නිර්මාණය කරමින් සිටී. එකී මුහුදු ප්‍රදේශයේ ඇති කුඩා දූපත් භාවිතා කරමින් කලාපය තුළ යුදමය තර්ජනයක් වර්ධනය කරතියි යන චෝදනාව කරමින් එක්සත් ජනපදය එම කලාපයට මැදිහත් වෙමින් සිටී.

පසුගිය ජනවාරි මාසයේදී එක්සත් ජනපදයේ යුද නෞකාවක් නාවුක සැතැපුම් 12ක් චීන මුහුදු සිමාව තුළට යාත්‍රා කළ අතර චීනය ඊට නිල වශයෙන් විරෝධය පළ කරන ලදී.

මෙම තත්වය පිළිබඳ කරුණු පැහැදිලි කිරීම සඳහා පසුගිය පෙබරවාරි 25වැනිදා චීනයේ ජාතික ආරක්ෂාව පිළිබඳ අමාත්‍යාංශය විසින් මාධ්‍ය සාකච්ඡාවක් පවත්වනු ලැබිය. එහිදී චීනය ප්‍රකාශ කළේ එක්සත් ජනපදය දකුණු චීන මුහුදේ යුදමය තර්ජනය පිළිබඳව දෙබිඩි ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් සිටින බවය. තමන් කිසි විටෙකත් චීනයේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වීමට කිසිවෙකුටත් ඉඩ නොතබන බවද ඔවුහු අවධාරණය කළහ.

එසේම මේ වන විට එක්සත් ජනපදය දකුණු කොරියාව තුළ මිසයිල පද්ධතියක් ස්ථාන ගත කිරීමට සූදානම වන බවටත් චිනය හා දකුණු කොරියාව අතර සම්බන්ධතා පළුදු වීමට එය හේතුවක් වනු ඇති බවටත් චීනය අනතුරු අඟවා සිටියේය.

## ඔබාමා කියුබාවට



එළඹෙන මාර්තු 21 හා 22 දෙදින එක්සත් ජනපද ජනාධිපති බැරක් ඔබාමා කියුබාවේ සංචාරයක නියැලීමට නියමිතව ඇත. අවුරුදු 90 කට පමණ පසු එක්සත් ජනපද ජනාධිපතිවරයෙකු කියුබාවේ සංචාරය කරන පළමු අවස්ථාව මෙයයි.

දශක ගණනාවක් සිට එ.ජ. ආර්ථික සම්බාධකවලින් පීඩාවට පත්ව සිටින සමාජවාදී කියුබාවට මෙම සංචාරය විශේෂ වැදගත්කමක් ගෙන ගෙන දෙයි. සම්බාධක ඉවත් කරලීමේ ක්‍රියාවලිය කඩිනම් කර ගැනීමටත් ජාත්‍යන්තර සබඳතා පුළුල් කර ගැනීමටත් මෙම සංචාරය හරහා විවර වන ඉඩකඩ විශාලය.

ආර්ථික සම්බාධක හමුවේ කියුබාවට උදව් කළ වෙනිසියුලාව වැනි රටවල පාලනයන් අන්ත දක්ෂිණාංශිකයන් අතට පත් වෙද්දීත්, කලාපය තුළ කියුබාවට සහය පළ කළ ආණ්ඩු වෙනස්වීමේ අවදානමක් මතුව ඇති මොහොතකදී එක්සත් ජනපදය සමග සබඳතා යථාතත්වයට පත්කර ගැනීමට ඉඩකඩ සලසා ගැනීම සමාජවාදී කියුබාව ලද ජයග්‍රහණයකි.

## මොරාලෙස්ට සිව්වැනි වාරය අහිමි වෙයි



2019 වසරේදී පැවැත්වීමට නියමිතව ඇති මීළඟ බොලිවියානු ජනාධිපතිවරණයට ඉදිරිපත්විම සඳහා වත්මන් ජනාධිපති ඊවෝ මොරාලෙස්ට හා ඔහුගේ උප ජනාධිපතිවරයාට ඉඩ දිය යුතුද නැද්ද යන්න විමසීම සඳහා ජනමත විචාරණයක් පසුගිය පෙබරවාරි 21වැනි දින පැවැත්වුණි. කෙසේ වුවද 51.31%ක සියුම් වැඩි ඡන්ද ප්‍රතිශතයක් ලබා ගනිමින් ජයග්‍රහණය කරනු ලැබුවේ ඊට ඉඩ නොදිය යුතුයයි යන මතයයි.

වත්මන් ජනාධිපති ඊවෝ මොරාලෙස්ට 2019 දක්වා රට පාලනය කිරීමට ජනවරමක් ලැබී තිබේ. ඔහු පළමුවරට ජනාධිපතිවරයා ලෙස තෝරාපත් කර ගනු ලැබුවේ 2006 වසරේදීය. ඉන්පසු 2009 වසරේදීත්, 2014 වසරේදීත් ඔහු නැවත තොරා පත් කර ගනු ලැබුණි.

ඔහුගේ පාලන කාලය තුළ රටේ ආරථික සංවර්ධන වේගය 6.2% දක්වා ඉහළ ගිය අතර සමාජ සුබසාධනය ඉහළ නැංවුණි. ඒ අතරම අධිරාජ්‍ය විරෝධියෙකු ලෙසද ලතින් ඇමරිකානු කලාපයේත් ඉන් පිටතත් ක්‍රියාකාරී වැඩකොටසකට උරදෙනු ලැබිණි.

# එට්කා ආර්ථිකයේ රාජයෝගයද? මාරයෙක්ද?

මෑත කාලයේ ලංකාවේ ආර්ථික ගිවිසුමක් පිළිබඳව වැඩිම සාකච්ඡාවක් පැවැතියේ නම් ඒ තවමත් අවසන් නොවී ඇති 'එට්කා' නම් කෙටි නමින් හඳුන්වන ඉන්දියානු-ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්‍ෂණික සහයෝගීතා ගිවිසුම (ETCA) පිළිබඳවය. මෙම ගිවිසුම පිළිබඳව සාකච්ඡාව ආන්දෝලනාත්මක තත්වයකට පත්වීම ප්‍රධාන හේතුව වූයේ, අදාළ ගිවිසුමේ විෂය පථයේ වගකීම දරන අමාත්‍යවරයා ලෙස සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය මලික් සමරවික්‍රම මහතා දින වකවානු සහිතව මෙම ගිවිසුම අත්සන් කිරීම ගැන ප්‍රකාශයක් සිදු කිරීමයි. ඔහුට අනුව 2016 ජනවාරි අගදී ගිවිසුමේ දළ රාමුව ඉන්දියාවට ඉදිරිපත් කර ඇති අතර 2016 පෙබරවාරි අගදී දළ රාමුවට අත්සන් තබා 2016 වසර මැදදී (ජූනි මාසයේදී) ගිවිසුම අත්සන් කිරීමට අපේක්‍ෂා කෙරේ.




> ගිවිසුමක් නොමැතිව රාමුවට විතරක් විරෝධය පෑම "එට්කා බිල්ලකු මැවීමක්" යන්න ආණ්ඩුවේ විරෝධය සංසිඳුවන තර්කයයි. නමුත් ගිවිසුම ගොඩනැගෙන්නේ රාමුව තුළ හෝ රාමුව මතය. රාමුවට පිටින් ඊට සපුරා වෙනස් ගිවිසුමක් ඇතිවනු ඇතැයි සිතිය නොහැකිය.

## එට්කා විරෝධයේ හේතුව

ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ඓතිහාසික වශයෙන් බොහෝ සමීප සබඳතා ඇතිවා මෙන්ම බොහෝ ගැටලුද නිර්මාණය වූ අවස්ථා ඇත. පසුගිය රාජපක්‍ෂ පාලනය තුළදී ඉන්දියාව සමඟ පැවැතියේ දේශපාලනික වශයෙන් දුරස්ථ ස්වභාවයකි. ලංකාවේ පැවැති 30 අවුරුදු යුද්ධය යුදමය වශයෙන් නිමා වීමද ඉන්දියාවේ නොසතුටට හේතු විය. නමුත්, ආර්ථික වශයෙන් ඇත්තේ ඉතා ළඟ ගනුදෙනු ප්‍රමාණයකි. ලංකාවට ගෙන්වන සියලු බෙහෙත්වලින් 70%කට වැඩි ප්‍රමාණයක් ගෙන්වනු ලබන්නේ ඉන්දියාවෙනි. ඊට අමතරව පරිප්පු, ළූණු, කුළුබඩු, මිරිස් ආනයනයෙන් 72%කුත් ඛනිජ තෙල් ආනයනයෙන් 1/3කුත් සිදු කරන්නේ ඉන්දියාවෙනි. ඉන්දියාව ගිවිසුමකින් එකඟ නොවුණද දැනටමත් ලංකාවේ ආර්ථිකයේ විශාල පංගුවක පාලනය අත්පත් කරගත් "ලොකු අයියා" බව අමතක කළ යුතු නැත.

එට්කා පිළිබඳ විරෝධය පෙළ ගැසී ඇත්තේ, හුදෙක් ඒ ඉන්දියාව නිසාම නොව එම ගිවිසුම ලංකාවේ ආර්ථික ස්වාධීනත්වය කෙරෙහි එල්ල කරන අනතුර නිසාය. ද්විපාර්ශ්වික හෝ බහු පාර්ශ්වික වෙළඳ ගිවිසුම්වල අරමුණු කිහිපයක් තිබිය හැකියි. සමහර ගිවිසුම් තාක්‍ෂණික හුවමාරු කර ගැනීම උදෙසා විය හැකිය. තවත් ගිවිසුම් ප්‍රාග්ධන ආයෝජන ඉලක්ක විය හැකිය. නැතිනම් ලෝක වෙළඳපොළේ තම කොටස අත්පත්කරගැනීම උදෙසාය. අප නිරපේක්‍ෂ ලෙස ඕනෑම ආකාරයක වෙළඳ ගිවිසුමක් ප්‍රතික්‍ෂේප කිරීම හෝ ඉන්දියාව සමඟ වෙළඳ ගිවිසුම අපට (ලංකාවට) වාසිදායක වුවත් ප්‍රතික්‍ෂේප කිරීමේ පටු දෘෂ්ටියක සිටිමින් එට්කා විරෝධයට එක් විය යුතු නැත. එට්කා ගිවිසුමේ අන්තර්ගතය මෙන්ම, එට්කා පසුබිම් කතාවේ ඇති ලංකාව 2000-01 සිට අත්සන් කර ක්‍රියාත්මක ඉන්දු ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සිට මේ දක්වා ඉන්දියාව හා ලංකාව අතර ඇති කරගත් ආර්ථික එකඟතාවයන්හි ප්‍රතිඵල සමාලෝචනයක් නිවැරදි ලෙස සිදුකර ගත යුතුව ඇත. මෙහිදී 1998 අත්සන් කර 2000 සිට ක්‍රියාත්මක වූ ඉන්දු-ලංකා නිදහස් වෙළඳ ගිවිසුමත් එයම පුළුල් කරමින් එයට සේවා ක්‍ෂේත්‍රයද ඇතුළත් කර 2003දී කෙටුම්පත් කළ විස්තීරණ ආර්ථික සහයෝගිතා ගිවිසුමත් (CEPA) ඉතා තීරණාත්මකය. 2014 මහ බැංකු වාර්තා දත්ත අනුව ලංකාව ඉන්දියාවට අපනයනය කරන භාණ්ඩ වර්ධනයට මෙම ගිවිසුම දායක වී ඇත්තේ ඉතා සුළු ප්‍රතිශතයකිනි. එය 4.8% සිට 5.6% දක්වා ප්‍රමාණයකි. නමුත් එවැනි වෙළඳ ගිවිසුමකින් බැඳී නැති එක්සත් රාජධානිය සහ එක්සත් ජනපදය සඳහා අපේ අපනයනවලින් 40%ක් තරම් ඉහළ අගයක් තිබීමෙන්ම මෙම තත්වය තේරුම් ගත හැකිය.

## බදු නොවන බාධක (NTB)

භාණ්ඩ අපනයනය කිරීමේදී හමුවන පළමු බදු වර්ගය වන්නේ තීරු බදුය. නමුත්, ඉන්දියාවට තීරු බදුවලට අමතරව බදු නොවන බාධක ලෙස එහි ප්‍රාන්තවලටද අමතර බද්දක් අය කරනු ලැබේ. යමෙක් ඉන්දියාවට භාණ්ඩ යවන්නෙක් ලෙස තමිල්නාඩුවට භාණ්ඩ යවන්නේ නම් ඒ සඳහා 21%ක් බදු ගෙවිය යුතුය. වෙනත් ප්‍රාන්තයකදී එම අයකිරීම 0.5%ක් වනු ඇත. ඉන්දියාවේ බදු පමණක් නොව දීර්ඝ පරිපාලන පිළිවෙත්, අනවශ්‍ය ලෙස සිදුකරනු ලබන තත්ව පරීක්‍ෂා බාධාවන් හා ප්‍රතික්‍ෂේප කිරීම්ද මේ අතර වෙයි.

## ඉන්දියාවේ වෙළඳ පංගුව

ඉන්දියාව සහ ලංකාව අතර වෙළඳපොළ පරිමාවන්ගේ පරතරයද දෙරට අතර වෙළඳ ගිවිසුමකදී සැලකිල්ලට ලක් නොකර බැහැර කළ නොහැකි ප්‍රධාන සාධකයකි. වර්තමාන ඉන්දියාවේ ජනගහනය කෝටි 127කි. ශ්‍රම බලකාය මිලියන 532කි. ළමා ශ්‍රමිකයින්ගේ ප්‍රමාණය එක් කෝටි 26 ලක්‍ෂයකි. විරැකියාවෙන් පෙළෙන ප්‍රමාණය ශ්‍රම බළකායෙන් 7%කි. එය ආසන්න වශයෙන් ලක්‍ෂ 370කි. එය ලංකාවේ මුළු ජනගහනය ඉක්මවන ප්‍රමාණයකි. දිනකට ඩොලර් 1.25ක් නොඋපයන ජනතාව කෝටි 27කි. එය ලංකාවේ මුළු ජනගහනය මෙන් දස ගුණයකි. එසේම, ලංකාවේ වෙළඳපොළට දිනකට ළඟාවන (වෙළඳපොළේ සැරිසරන) ජනතාව ලක්‍ෂ 30කි. එය ඉන්දියාවේදී ලක්‍ෂ 3880කි. ලංකාව ඉන්දියාව සමඟ කවර මට්ටමේ හෝ වෙළඳ ගිවිසුමක් ඇතිකර ගැනීමේදී මෙම අසමානතා තත්වයන් හොඳින් තේරුම් ගෙන ගිවිසුම්ගත වීමක් අත්‍යාවශ්‍ය වේ.

## රාමුව සහ ගිවිසුම

ඉහත සියලු කරුණු තේරුම් ගැනීම අවශ්‍ය වන්නේ දැනට 'යහපාලන' ආණ්ඩුවෙන් යෝජිත එට්කා ගිවිසුමේ ලංකාවේ ආර්ථිකයට කවර බලපෑමක් සිදුකරනු ඇතිද යන්න තේරුම් ගැනීමටය. ආණ්ඩුව විසින් එට්කා විරෝධයට ඉදිරිපත් කරන ප්‍රතිචාරය වන්නේ, මෙය අවසන් ගිවිසුමක් නොව ගිවිසුම් රාමුවක් පමණක් බවයි. ඒ අනුව, රාමුව ගිවිසුමක් වීමට නම් අප (ලංකාව) ඉදිරිපත් කරන දළ රාමුව සහ ඉන්දියාවට ඉදිරිපත් කරන රාමුව එකතු කර අවසන් ගිවිසුමක් සකස් විය යුතුය. ගිවිසුමක් නොමැතිව රාමුවට විතරක් විරෝධය පෑම "එට්කා බිල්ලකු මැවීමක්" යන්න ආණ්ඩුවේ විරෝධය සංසිඳුවන තර්කයයි. නමුත් ගිවිසුම ගොඩනැගෙන්නේ රාමුව තුළ හෝ රාමුව මතය. රාමුවට පිටින් ඊට සපුරා වෙනස් ගිවිසුමක් ඇතිවනු ඇතැයි සිතිය නොහැකිය. එසේ වන්නේ නම්, එය ලංකාවෙන් ඉදිරිපත් කරන දළ රාමුව සම්පූර්ණයෙන් ඉවත් කර ඉන්දියාවේ දළ රාමුවම ගිවිසුම ලෙස තහවුරු කිරීමත් විය යුතුය. ඒ අනුව රාමුව අනුව ගිවිසුම කවරාකාර වනු ඇතිදැයි තේරුම් ගැනීමට හැකිය.

## යෝජිත ගිවිසුමේ අඩංගුව

දැනට යෝජිත ඉන්දු-ශ්‍රී ලංකා ආර්ථික සහයෝගීතා ගිවිසුම (ETCA) සඳහා ආරම්භය සැලසෙන්නේ 2015 සැප්තැම්බරයේ රනිල් වික්‍රමසිංහ ඉන්දියාවේ සිදුකළ සංචාරයේදී ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝඩි සමඟ ඇතිවන එකඟතාවයයි. ආණ්ඩුව පාර්ශ්වයෙන් මෙම යෝජිත ගිවිසුමේ කලින් පැවති සීපා (CEPA) ගිවිසුමට වඩා සාධනීය ප්‍රතිඵල ලෙස දකින (ගුණාත්මක වෙනස්කම්) ලෙස පහත කරුණු හඳුන්වා ඇත.

භාණ්ඩවලට අදාලව දැනට පවතින ගිවිසුම අනුව (ISFTA) ඉන්දියාවට ලංකාවෙන් එක් වසරකට යවනු ලබන භාණ්ඩවලින් 65%-80%ක් පමණ මෙම වෙළඳ ගිවිසුමේ වරණීය කොන්දේසි (preferentional terms) යටතේ යවනු ලැබුවද ඉන්දියාවෙන් ලංකාවට ගිවිසුමේ පදනමින් එවනු ලබන්නේ 20%-30%ක් අතර ප්‍රමාණයක් පමණි. එසේම ඉන්දීය වෙළඳපොළට ඇතුළුවීමට ඇති බාධා (Non Tarrif Barries) ඉවත් කිරීමට ඉක්මන් ප්‍රතිඵල ලැබෙන කොන්දේසි ඇතුළත් කිරීමේ වුවමනාව ලෙස රජයේ පාර්ශ්වයෙන් දකී. දෙවනුව,

15වැනි පිටුවට



"මාක්ස්වාදය අරාජිකවාදයට වඩා වෙනස්ය. එය සාමාන්‍ය වශයෙන් විප්ලවවාදී අවදියකදී රාජ්‍යයක් හා රාජ්‍ය බලය තිබීමේ අවශ්‍යතාවය විශේෂයෙන්ම ධනපති ක්‍රමයේ සිට සමාජවාදයට පරිවර්තනය වීමේ කාල පරිච්ඡේදයේදී එය තිබීමේ අවශ්‍යතාවය පිළිගන්නේය."

**ලෙනින්**
**තෝරා ගත් කෘති,**
**05වැනි වෙළුම,**
**පිටුව 46**

## කාන්තා දිනයේ සැබෑ අරුත වෙනුවෙන් පෙළ ගැසෙමු!

106 වන ජාත්‍යන්තර කාන්තා දිනය මාර්තු 08 වන දිනට යෙදී ඇත. කාන්තා දිනයේදී මෙවරත් සුපුරුදු ලෙස පැවැත්වෙන මල් ප්‍රදර්ශන, කේක් ප්‍රදර්ශන, ඉවුම් පිහුම්, ඇඳුම් විලාසිතා, මනාලියන් දැක්ම වැනි විවිධ වෙළෙඳ වැඩසටහන් හරහා ලොව බොහෝ රටවලත් ලාංකීය භූමිය තුළත් විවිධ දේශපාලන පක්ෂ, විවිධ ආයතන, විවිධ සංවිධාන, විවිධ ආකාරයෙන් ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීමට කටයුතු කර ඇත. කාන්තා දිනයේ සැබෑ අර්ථය හා අරමුණු වටහා නොගෙන කරනු ලබන එවැනි සැමරුම්වලින් කාන්තාවන් සිහින ලෝකවල අතරමං කිරීම, සැබෑ කාන්තා ප්‍රශ්න යට ගැසීම තවදුරටත් සිදුවනු ඇත.

ජාත්‍යන්තර කාන්තා දිනය ආරම්භ වීමට මුල් වූයේ ඉතිහාසයේ කාන්තාවන් තම අයිතීන් දිනා ගැනීම උදෙසා කරන ලද අරගලයන්ය. 18 වන සියවසේ යුරෝපයේ හා උතුරු අමෙරිකාවේ කාර්මික දියුණුවත් සමග ඇරඹුණු රෙදිපිළි හා ඇගලුම් කර්මාන්තශාලාවල සුළු වැටුපකට පැය 14ක් 16ක් වැනි දිගු කාලයක් සේවය කරමින් ඉතා දුෂ්කර, දුක්ඛිත හා අනාරක්ෂිත තත්වයෙන් සේවය කළ කම්කරු කාන්තාවන්, වාමාංශික ව්‍යාපාරයන්ගේ මගපෙන්වීම යටතේ තම අයිතීන් දිනා ගැනීමට හා සර්ව ජන ඡන්ද බලය ලබාගැනීමට අරගල කරනු ලැබිණි. 1910 ඩෙන්මාර්කයේ කෝපන්හේගන් නගරයේ පැවැති සමාජවාදී කාන්තාවන්ගේ දෙවන ජාත්‍යන්තර සමුළුවේදී ජර්මන් ජාතික සමාජවාදී නායිකාවක් වූ ක්ලාරා සෙට්කින් විසින් ජාත්‍යන්තර කාන්තා දිනයක් නම් කළ යුතු බවට යෝජනාවක් ගෙනෙනු ලැබුවේ එවැනි අරගලයන්ට සහභාගි වූ කාන්තාවන්ගේ සටන්කාමීත්වය සැමරීම උදෙසාය.

අප කාන්තා දිනය සමරනු ලබන මේ මොහොතේ රට තුළ අර්බුද ගණනාවක් මතුව ඇත. එයින් වඩාත් පීඩාවට පත්ව ඇත්තේ කාන්තාවන්ය. දිනෙන් දින වැඩිවන ආර්ථික අර්බුදය විසින් හෙට දවසේත් මැදපෙරදිග වහල් මෙහෙය සඳහා කාන්තාවන්ට යාමට සිදුවන තත්වයක් උද්ගත වනු නිසැකය. රටට විදෙස් විනිමය රැගෙන ඒමට පිටත්ව යන කාන්තාවන්ට මුහුණපෑමට සිදුවන විවිධ ගැටලු, දුෂ්කරතාවන් වළක්වා ගැනීමට මෙතෙක් කලක් බලධාරීන් රාජතාන්ත්‍රික මට්ටමින් කිසිදු පියවරක් ගෙන නොමැති තත්වයක් තුළ නැවත නැවතත් ශාරීරික හා ලිංගික ප්‍රචණ්ඩත්වයට, ජීවිතයෙන් වන්දි ගෙවීමට ගෘහ සේවිකාවන් ලෙස මැදපෙරදිගට යන අපේ කාන්තාවන්ට සිදුවනු ඇත.

ලංකාවේ ජනගහනයෙන් 52.6%ක් කාන්තාවන් වුවත් බහුතරයක් කාන්තාවන් තවමත් ඵලදායි ආර්ථික ක්‍රියාවලියකට දායක කරගැනීමට සමත්ව නැත. 35%ක් වන මෙරට කාන්තා ශ්‍රම බලකායෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් සේවය කරනු ලබන්නේ වතු ක්ෂේත්‍රය තුළයි. පරිපාලන හා දේශපාලන තීන්දු තීරණ ගන්නා ආයතන තුළ කාන්තා නියෝජනය පවතින්නේ ඉතා අවම මට්ටමකය. ගර්භනී කාන්තාවන් තුන් දෙනෙකු ගෙන් එක් අයෙකු නීරක්තියෙන් පෙළේ. අවුරුදු 15ත් 49ත් අතර පසුවන කාන්තාවන්ගෙන් 16.2%ක් මන්දපෝෂණයෙන් පෙළේ. දිනපතා ඉහළ යන බඩු මිල, දරාගත නොහැකි ජීවන වියදම හේතුවෙන් දරුවන්ද සමගින් සිය දිවි නසා ගන්නා තත්වයටම අද ලාංකීය මව්වරුන් පත්ව ඇත.

වැඩිවන ආර්ථික අර්බුදයට සාපේක්ෂව සමාජීය හා සංස්කෘතික ගැටලුද උග්‍ර වී ඇත. සමාජයක් ලෙස පැවතීමට අවශ්‍ය සියලු සාරධර්මයන් වේගයෙන් පිරිහෙමින් පවතී. කාන්තාවන්ට හා ළමුන්ට එරෙහි අපරාධ, ලිංගික අතවර, මිනීමැරුම්, මංකොල්ලකෑම් ආදී සමාජ විරෝධී ක්‍රියාවන් දිනපතා වර්ධනය වෙමින් ඇත.

ලාංකීය කාන්තාවන්ට මෙවන් තත්වයක් උරුම වී ඇති වටපිටාවක වත්මන් පාලනාධිකාරිය කාන්තාවන් සවිබල ගැන්වීමේ අරමුණින් යැයි පවසමින් පලාත් පාලන ආයතන සඳහා 25% ක කෝටාවක් ලබා දීමට කෙටුම්පතක් සකස් කළද ඒ පිළිබඳව පැහැදිලි නිරවුල් බවක් තවමත් නැත. කාන්තාවන් සංවිධාන නායකත්වය සඳහා පුහුණු කිරීම හා හැඩගැස්වීමට රජයක් ලෙස මැදිහත්ව ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කළ යුතු වුවත් ඒ කිසිත් නොමැතිව කාන්තාවන් දේශපාලන වශයෙන් සවිබල ගැන්වීමට කතා කිරීමෙන් ඵලක් නොවනු ඇත.

රටක් ලෙස අප පත්ව ඇති අර්බුදයෙන් ගොඩ ඒමට කාන්තාවන් ලෙස අප සියලු දෙනා අත්වැල් බැදගත යුතුව ඇත. අසීමිත පීඩාවන් මැද පවුලට උරදෙන කාන්තාවන්ද, දෙස් විදෙස්හි විවිධ වැඩබිම් තුළ ශ්‍රමය වගුරවන කාන්තාවන්ද, කලා ක්ෂේත්‍රය තුළ නිර්මාණශීලී දායකත්වය සපයන කාන්තාවන්ද ඒ වෙනුවෙන් පෙරමුණ ගත යුතුව ඇත. අපේ ශක්තිය මව්බිමේ ජයග්‍රහණය බවට පත් කළ යුතුව ඇත. එනිසා කාන්තා දිනයේ සැබෑ අරමුණු දිනාගැනීම උදෙසා ධෛර්යය හා අවබෝධය එක්රැස් කරගන්නා දිනයක් බවට එම දිනය පත්කර ගැනීමට දෙස් විදෙස්හි විසිරී සිටින ලාංකීය කාන්තාවන් සියලුදෙනා අදිටන් කරගත යුතුය.

**සමාජවාදී කාන්තා සංගමය**

(මාර්තු 08 දිනට යෙදෙන ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙනි.)



**අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානයේ සභාපතිනි**

**සරෝජා පෝල්රාජ් සහෝදරියගේ**

# චීන සංචාරයේ අත්දැකීම්...

චීනය ජනගහනය අතින් ලොව පළමුවැනි රටය. එහි ජනගහනයෙන් හරි අඩකටත් මඳක් වැඩියෙන් සිටින්නේ කාන්තාවන්ය. වෙනත් රටකට එම කාන්තා ප්‍රතිශතය මහත් බරක් වුවත් චීනයට එය එසේ නොවේ. චීනයේ කාන්තාවන් සිටින්නේ ඉතා ඉදිරියෙනි. මන්ද යත් පැරණි චීනයේ කාන්තාවට සාපේක්ෂව දැනුම, තාක්ෂණය, සංස්කෘතිය හා සමාජ ආකල්ප අතින් වත්මන් චීන කාන්තාවට හිමි තැනත් චීන කාන්තාව අත්පත් කරගත් තැනත් ඉතා ඉහළ මට්ටමක පවතී.





රදළ වැඩවසම් පාලන ක්‍රමයන්ට අනුගතව පැවති පැරණි චීනයද ගතානුගතික ආසියාතික රටකි. එහෙත් නව සමාජවාදී චීනය එම සියළු මතවාදයන් බැහැර කරමින් ඉතා දිගු මාවතකට පියවර තබමින් සිටී.

පසුගිය දෙසැම්බරයේ යෙදුණු සංචාරයේදී චීනයට අප පා තැබූයේ පාන්දර 2.30ත් 3.00ත් අතර කාලයේය. චීන කොමියුනිස්ට් පක්ෂයේ ඉහළ නිලධාරිනියන් කිහිපදෙනෙක් සෙල්සියස් අංශක 6ක් වැනි අධික සීතලේ නිදි වරමින් අප පිළිගැනීමට බලා සිටියේ සැබෑ රාජතාන්ත්‍රිකබව ප්‍රදර්ශනය කරමිනි. එසේ අප පිළිගත් ඔවුන් අප චීනයේ ගත කළ දින 10 තුළ අවස්ථා කිහිපයකදීම චීන කාන්තාව සම්ප්‍රදායික කාන්තා භූමිකාව ඉක්මවා රටේ සංවර්ධන කාර්යයට දක්වන දායකත්වය කොතරම්දැයි අපට පැහැදිලි කරදුනි.

චීනය තුළදී අප දුටු විශේෂ දර්ශනයක් නම් සෑම කර්මාන්තශාලාවකම, ගොවිපලකම, වැඩබිමකම පිරිමින් හා සමසමව වැඩ කරනා කාන්තාවන්ය. ඉගෙනුම ලබන දැරිවියන්ය. ප්‍රවාහන ක්ෂේත්‍රයේ තුළ සේවය කරන රියදුරු කාන්තාවන්ය. පරිපාලන විධායක අංශවල නිපුණ නිලධාරිනියන්ය. ඔවුන් එවන් තත්වයක පසුවීමට එරට සමාජවාදී පාලන ක්‍රමය සමත් වී ඇත.

තම ගෙවල් තුළ ගාල්කර හුදෙක් පවුලේ බර ඇදීමට පමණක් සීමාකර අනෙකුත් අයිතිවාසිකම් අහිමි කර සිටින අපේ රටේ කාන්තාවන් අතර චීන කාන්තාවට සමාජවාදය විසින් අත්කර දී ඇති තත්වය ඉතා සුවිශේෂී වේ. චීන සමාජවාදී ජනරජයේ අප සංචාරය කළ චැන්ෂා ප්‍රාන්තයේ අපේ පරිවර්තන කටයුතු, මග පෙන්වීම ආදී සියළුම රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සඳහා දායක වූයේ කාන්තාවන්ය. එම කාන්තාවන්ගෙන් අප හඳුනාගත් පොදු ජීව ගුණය වූයේ ස්වාභිමානයයි. එම ස්වාභිමානය ඔවුන්ට ලැබී ඇත්තේ එම සමාජ ආර්ථික දේහය තුළ ඔවුන්ට හිමිව ඇති ස්ථානයේ වටිනාකම හේතුවෙන්ය.

චීනයේදී කාන්තාව ස්වාධීනය. ස්වායක්තය. තීන්දු තීරණ ගැනීමේ කාර්යයේදී ඔවුන් සිටින්නේ ඉදිරියෙනි. ඔවුන්ද පිරිමින් හා සමානව නිසි ඇගයීමට හා ගෞරවයට ලක්වන්නේය. ලංකාවේ මෙන් කාන්තාවන් තවදුරටත් දෙවන පෙළ පුරවැසියන් නොවෙති. පිරිමියාගේ අනන්‍යතාවය තුළ වැජඹෙන්නෝ නොවෙති. ඔවුන්ගේම අනන්‍යතාවයක් ගොඩ නංවා ගැනීමටත් හැකියාවට සරිලන සමාජ වටිනාකම්වලට උරුමකම් කියන්නටත් ඔවුන්ට ඉඩකඩක් හිමිව ඇත. අධ්‍යාපන, වෘත්තීය, සමාජ, දේශපාලනික දේහය තුළ කෝටාවකට එහා ගිය සැබෑ උරුමයක් හා අයිතිවාසිකම් සුරැකි කාන්තා පරපුරක් වීමටත් චීන කාන්තාවන්ට හැකියාව ලැබී ඇත. එසේ ඔවුන්ගේ ජීවිත වෙනස්වීමට බලපා ඇත්තේ එකෙක් අනෙකා සූරාකන ධනවාදය පරදා සැමට සාධාරණ ලෙස සලකන, සමාජවාදී සමාජය නිසාවෙනි. එවැනි සමාජයක් ගොඩ නැංවීමට නම් ලංකාවේ කාන්තාවන්ද ඒ සඳහා පෙළ ගැසිය යුතුයි.

## ඇගෙන් අපට...



“ කාන්තා ප්‍රචාරක කටයුතු නිර්ධනීන්ගේ ව්‍යාපාරයට වැදගත් ප්‍රශ්න සෑම එකක් සමගම බද්ධ විය යුතුය. එසේම ප්‍රධාන කර්තව්‍යය වන්නේ කාන්තාවන්ගේ පංති හැඟීම පුබුදුවාලීමයි. එසේම ඔවුන් පංති සටන සඳහා එක්කර ගැනීමයි. ”

**ක්ලාරා සෙට්කින්**



“ අප අපගේ පුද්ගලික ජීවිත අප අරගල කරන අභිප්‍රාය සමඟ බද්ධ කරගත යුතුය. එනම් කොමියුනිස්ට්වාදය ගොඩ නැගීම සඳහාය. ”

**නදේස්දා කෲප්ස්කයා**



“ කොමියුනිස්ට්වාදය නොමැතිව කාන්තා විමුක්තිය ගැන සිතීමටවත් කාන්තා විමුක්තියක් නොමැතිව කොමියුනිස්ට්වාදයක් ගැන සිතීමටවත් නොහැක. ”

**ඉනේසා ආමන්ඩ්**



“ අප නව දීප්තිමත් අනාගතයක් එනම් සමාජවාදය ළඟා කර ගන්නේ සෑම රටකම ධනපති පංතියට එරෙහිව කරන විප්ලවීය අරගලයකින් හා මුළු ලෝකයේම වැඩ කරනා පිරිමින් හා කාන්තාවන්ගේ එක්සත් වීමෙන් පමණි. ”

**ඇලෙක්සැන්ඩ්‍රා කොලොන්තායි**

## දැනුම සමාජය හා චින්තනය 02



# දැනුම යනු කුමක්ද?

මා දන්නා එකම දෙය මා කිසිවක් නොදන්නා බව යැයි වරක් දාර්ශනිකයෙක් පවසා තිබුණි. සියල්ල දන්නේ යැයි සිතන මිනිසාට කිසිවක් ඉගෙනගත හැකි වන්නේ නැත. ඒ ඔහු සියල්ල දන්නේ යැයි සිතන නිසාය. එහෙත් තමා බොහෝ දේ නොදන්නා බව දන්නා අයට ඉගෙනීම පහසුය. ඒ, තමන් නොදන්නා දේ ඉගෙන ගැනීමට ඔහු යොමුවන නිසාය. සෙන් බුදුදහම නමින් දහමක් චීනය, ජපානය වැනි රටවල පැවතී තිබේ. එහි හිමිවරුන් බොහෝ දැනුම ඇති අය ලෙස සැලකිණි. වරක් සෙන් ගුරු හිමිනමක් වෙත ඉගෙනීමට ගිය පුද්ගලයෙකුට එම හිමිනම පවසා තිබුණේ වතුර පිරවූ භාජනයකට තවත් ජලය පිරවිය නොහැකි බවත් ජලය පිරවිය හැක්කේ හිස් බඳුනකට බවත්ය. ඒ නිසා ඉගෙනීමට පෙර ඔබේ මනසේ ඒ සඳහා ඉඩ තබා ගන්නා ලෙසත්ය. මිනිසුන් ඉගෙන ගැනීමට පෙළඹෙන්නේ තමන් නොදන්නා නිසා වන බැවින් දැනුම ආරම්භ වන්නේ නොදැනුමේ සිටය.

### නිර්වචනයක් සොයා

සැබැවින්ම දැනුම යනු කුමක්ද? මේ පිළිබඳව විවිධ අයට විවිධ නිර්වචන තිබිය හැක. දැනුම යනු තමා අවබෝධ කරගත් දන්නා දේ යැයි කෙනෙක් සිතන විට තවත් සමහරු විඥානවාදයේ පතුලටම වැටී දැනුම යනු සංසාරගතව ලැබෙන දෙයක් පෙර ආත්ම භවයේ සිට එන දෙයක් ලෙස හෝ දෙවියන්ගේ දායාදයක් ලෙසද සිතීමට පුළුවන. දැනුම පිළිබඳව වන එම විඥානවාදී මිත්‍යා මත අතීතයේ ප්‍රබලව පැවැති අතර වර්තමානයේ පවා යම් දුරකට ඒවා ශේෂ වී පවතී. එය එසේ වන්නේ දැනුම යනු කුමක්ද යන්න පවා නොදන්නා තත්වයක් තුළය.

දැනුම පිළිබඳ කෙටි, එහෙත් ඉතාම නිවැරදි අංගසම්පූර්ණ නිර්වචනය අපට සපයන්නේ මාක්ස්වාදයයි. එය මෙසේය. "වාස්තවික ලෝකය හා එහි නියාම මිනිස් මනස තුළ අරමුණු සහගතවත් සංවර්ධනාත්මකවත් පරාවර්තනය වීම දැනුම නම් වේ." ඒ අනුව මිනිසා ප්‍රකෘතිය හෙවත් තමාද ඇතුළත් සොබාදහම මත බලපා එමගින් ලබා ගන්නා අවබෝධය දැනුම ලෙස කෙටියෙන් පැවසිය හැකිය. එබැවින් දැනුමේ එකම උල්පත වන්නේ වාස්තවික ලෝකයයි. වාස්තවික ලෝකය හෙවත් සොබාදහමේ සමහර දේ සතුන් තුළද පරාවර්තනය වේ. පිළිබිඹු වේ. සත්තු යම් යම් දේ දකිති; ශබ්ද අසති. ස්පර්ශය දැනේ. උන් යම් යම් දේ වෙන්කොට හඳුනාගනිති. එහෙත් සතුන් තම පංචේන්ද්‍රියයන් හරහා ඇති කර ගන්නා හැඟීම්, සංවේදනා දැනුම නොවේ. මන්ද ඒවා අරමුණු සහගත නොවන බැවිනි. සත්තු සොබාදහම හරයෙන් වටහා නොගනිති. එහෙත් මිනිසා ප්‍රකෘතිය හෙවත් සොබාදහම එහි පෙනුමෙන් පමණක් නොව හරයෙන්ද වටහා ගනී. සොබාදහමේ නියාමයන්ද වටහා ගනී. ඒවා පරපුරෙන් පරපුරටත්, එකම පරපුර තුළත් මිනිස් මොළය තුළත් සංවර්ධනාත්මකව හා අරමුණු සහගතව වර්ධනය වේ. එබැවින් 'දැනුම' එහි සැබෑ අර්ථයෙන් පවතින්නේ මිනිසා තුළ පමණි.

### පියවරෙන් පියවර

ප්‍රකෘතිය මිනිස් මනසේ අරමුණු සහගතව හා සංවර්ධනාත්මකව පිළිබිඹුවීම හෙවත් දැනුම අප තුළ ගොඩ නැගෙන්නේ, එක්වර හෝ අපිළිවෙලකට හෝ අහම්බයක් ලෙස නොවේ. කිසියම් අරමුණු සහගත ක්‍රමයකටය. දැන් මෙය අප තුළ නිරායාසයෙන් සිදුවුවද අප මෙලෙස සිතා සිදු නොකළද මිනිස් මනස තුළ දැනුම ගොඩ නැගෙන්නේ එක්තරා රටාවකට හා ක්‍රමයකටය.

> වත්මන් ධනවාදී අධ්‍යාපනය සකස්කර ඇත්තේ ඊට එරෙහිවය. තර්කයට ඉඩ නොතබා පොත් කටපාඩම් කරන අධ්‍යාපනයකට වත්මන් අධ්‍යාපන ක්‍රමය දරුවන් කොටුකර නැද්ද?

දැනුම සඳහා වන ක්‍රියාවලියේ පළමු පියවර හෙවත් ආරම්භය ජීවමාන සංජානනය ලෙස හැඳින්වේ. මෙය සරල දෙයකි. ජීවමාන සංජානනය යනු අප අවට වන ප්‍රකෘතිය හා එහි දේවල් මිනිසා සිය පංචේන්ද්‍රියයන් මගින් හඳුනා ගැනීමය. නැතිනම් පංචේන්ද්‍රියන්ට හසුකර ගැනීමය. මිනිසාගේ පංචේන්ද්‍රියන්ට හසුවන (අප අසන, දකින, රසවිඳින, ස්පර්ශකරන ආදී) දේ මිනිස් මොළය තුළ පිළිබිඹු වේ. නැතිනම් මිනිස් මොළය ඒවා සරල හා මතුපිට හඳුනා ගැනීමකට ලක්කරයි. එය හඳුන්වනු ලබන්නේ ජීවමාන සංජානනය ලෙසය. මෙලෙස ප්‍රකෘතිය සංජානනය හෙවත් පංචේන්ද්‍රියයන් මගින් හසුකර ගත් විට එය මොළය තුළ පිළිබිඹුවීම සංවේදනා ලෙස හැඳින්වේ. මෙම සංවේදනා හෙවත් සරල හඳුනා ගැනීම් ප්‍රකෘතිය හා එහි වස්තු සංජානනය කරන පුද්ගලයා දැනටමත් ලබා ඇති දැනුමේ ප්‍රමාණය මත අඩු වැඩි වේ. උදාහරණයක් ලෙස කිසියම් ගසක් සාමාන්‍ය පුද්ගලයෙක් දුටු විට ඒ ගැන වැඩි දුර පරීක්ෂණ කිරීමට පෙර ඔහුගේ මනසේ පිළිබිඹු වන්නේ ගසේ සරල මතුපිට ලක්ෂණ කිහිපයකි. එහෙත් උද්භිත විද්‍යාඥයෙක් ගසක් දුටුවිට ගස් පිළිබඳව වන ඔහුගේ පෙර දැනුම වැඩි නිසා එම ගසේ ලක්ෂණ රැසක් ඔහු සංජානනය කරයි.

කෙසේ හෝ මෙලෙස ඇතිවන ජීවමාන සංජානනයෙන් අත්කර ගන්නා මොළයේ සංවේදනා මගින් මිනිසා දැනුමේ ඊළඟ අදියර වන සංකල්ප ගොඩනගා ගනී. සංකල්ප යනු සමාන වස්තූන්ගේ සමාන ජාති ලක්ෂණ මත අප තුළ ඇති පූර්ව දැනුමය. මෙය පෙර ලබාගත් දැනුම මිනිස් මනස තුළ පුනර් නිෂ්පාදනය වීමක් හෙවත් යළි පිළිබිඹු වීමකි. සංකල්පවලද නිතරම අප තුළ පරාවර්තනය වන්නේ අදාළ වස්තුවල විශේෂ ලක්ෂණ නොව පොදු ලක්ෂණයන්ය. උදාහරණ ලෙස පොත්, මිනිසා, ගස්, පලතුරු, එළවළු ආදී ලෙස වේ. අපේ මනසේ සංකල්ප තිබූ පමණින් අදාළ වස්තු පිළිබඳ පූර්ණ දැනුමක් අප තුළ ඇතැයි සිතිය යුතු නැත. ඕනෑම වස්තුවක් පිළිබඳ වඩා අවබෝධයක් සඳහා මිනිස් මනස තුළ ඊළඟ ක්‍රියාවලිය ඇරඹේ. එය ප්‍රජානනයයි.

### කුමක්ද මේ ප්‍රජානනය

ප්‍රජානනය යන්නට යෙදිය හැකි සරලම තේරුම අධ්‍යයනය යන්නය. කිසියම් වස්තුවක් හෝ දෙයක් පිළිබඳ වැඩිදුර අවබෝධය සඳහා අප සිදුකරන අධ්‍යයනය මින් අදහස් වේ. ඒ සඳහා අපට තර්ක ඥානය අත්‍යාවශ්‍යය. එමෙන්ම පංචේන්ද්‍රියන්ගේ සීමාසහිත බව අභිබවා යාම සඳහා වූ විද්‍යාත්මක උපකරණද අත්‍යාවශ්‍යය. අපගේ පංචේන්ද්‍රියන්ගේ හැකියාව පවතින්නේ සීමාවකය. අපට පියවි ඇසින් බොහෝ දේ බැලිය නොහැක. අපට ඈත දුර තිබෙන වස්තු හෝ ඉතාම කුඩා අංශු පියවි ඇසින් බැලිය නොහැක. ඒ අපේ ඇසේ හැකියාව සීමාසහිත බැවිනි. අපට ශබ්ද ඇසීමේදී සීමාවක් තිබේ. මිනිසාගේ කනට හසුකරගත හැක්කේ ශබ්දය මනින මිම්මෙන්ම කිවහොත් ඩෙසිබල් 20ට වැඩි හා 2200ට අඩු ශබ්ද පරාසයන් පමණි. එහෙත් සමහර සතුන්ගේ සමහර ඉන්ද්‍රියයන්ගේ හැකියාව මිනිසා ඉක්මවා පවතී. උකුසු ඇසට, මිනිස් ඇසට වඩා දුරින් ඇති වස්තු දැකිය හැක. සුනඛයාගේ ආඝ්‍රාණ හැකියාව මිනිසා අභිබවා ඇත. එහෙත් සතුන්ට මිනිසාට මෙන් තර්ක කළ හැකි දියුණු මොළයක් නැති නිසා ඉන් පලක් නැත. මිනිසාගේ පංචේන්ද්‍රියන්ගේ හැකියාවන් සීමාසහිත වුවද එකී සීමා අභිබවනය කිරීමට සමත් විශේෂ ඉන්ද්‍රියයන් මිනිසාට ඇත. ඒ මිනිස් මොළයයි.

කෙසේ වෙතත් සීමිත හැකියාවන් සහිත අපේ පංචේන්ද්‍රියයන් මගින් අප ලබා ගන්නා ආරම්භක ප්‍රාථමික දැනුම මත ජීවමාන සංජානනයෙන් ඇතිකරන සංවේදනා මගින් වස්තුවල සියලු ලක්ෂණ පරාවර්තනය කරන්නේ නැත. ඒ නිසා පංචේන්ද්‍රියයන් මගින් පමණක් ලබාගන්නා දැනුම අසම්පූර්ණ එකක් වේ. එය බොහොවිට නිවැරදි නැති දුර්වල දැනුමකි. මෙය වෙනස් කරගත හැකි වන්නේ තර්කය මගින් හා පංචේන්ද්‍රියන්ට ලබාගත නොහැකි ලක්ෂණ හඳුනා ගැනීමට උපකාරී වන උපකරණ මගිනි. ඒ අනුව අප තුළ දැනුම ගොඩ නැගෙන්නේ ඉන්ද්‍රියන් මගින් ලබාගත් සරල දැනුම හෙවත් ඉන්ද්‍රිය ගෝචර දැනුම හා තාර්කික දැනුම එකතු වූ විටය.

### නිර්මාණශීලී චින්තනය

මිනිසුන් නිර්මාණශීලී වන්නේ ඔවුන් සතුව පවතින මෙම තර්කයේ හැකියාව නිසාය. එහෙත් වත්මන් ධනවාදී අධ්‍යාපනය සකස්කර ඇත්තේ ඊට එරෙහිවය. තර්කයට ඉඩ නොතබා පොත් කටපාඩම් කරන අධ්‍යාපනයකට වත්මන් අධ්‍යාපන ක්‍රමය දරුවන් කොටුකර නැද්ද? වත්මන් දරුවන් දවස පුරා පාසල තුළදීත් උපකාරක පංති තුළදීත් "ඉගෙන ගනිති" සැබැවින්ම එය ඉගෙන ගැනීමක් නොව විභාග සමත්වීම සඳහා කටපාඩම් කිරීමකි. ඒ තුළ තර්කනයට ඉඩක් තබා නැත. එය ධනපති ක්‍රමයේ පැවැත්මට හොඳය. මන්ද තර්කනය නැති තැනැත්තා තමා අවට සිදුවන නරක දේ ප්‍රශ්න නොකරන නිසාය. තමන් ජීවත්වන ලෝකය වෙනස් කිරීමට නොසිතන නිසාය.

එහෙත් 'දැනුම' යනු කටපාඩම් කිරීම නොව ඉන්ද්‍රියගෝචර දැනුම හෝ අතීත දැනුම මත පදනම්ව එය තර්කනය මගින්, පරීක්ෂණ, නිරීක්ෂණ, නිගමන මගින්, සංස්ලේෂණ විශ්ලේෂණ මගින් තවදුරටත් ප්‍රජානනය කිරීමය. සැබෑලෙසම දැනුම ගොඩ නැගෙන්නේ එකී ක්‍රියාවලිය තුළ පමණි.

දැනුම යනු දෙවියන් හෝ වෙනත් අද්භූත බලයක් විසින් අප වෙතට ලබාදෙන දෙයක් හෝ භවයෙන් භවයට රැගෙන එන දෙයක් නොවේ. අප තුළ දැනුම ගොඩ නැගෙන්නේ භෞතිකවය. ඒ සඳහා අපට විශේෂ හැකියාවක් සහිත ඉන්ද්‍රියක් තිබේ. ඒ මොළයයි. දැනුම ගොඩනැගීමේදී මිනිස් මොළය ඉටුකරන කාර්ය පිළිබඳ සාකච්ඡා කිරීමට මීළඟ කලාපයෙන් හමුවෙමු.



"පැරණි පාසල්වලින් ලැබුණේ තනිකරම පොතේ දැනුමය. බාල පරම්පරාවෙහි මොළය අසුරා දැමූ සහ ඔවුන් එකම රටාවකට පෙළ ගසන ලද නිලධාරි පිරිසක් බවට හැරවූ වැඩකට නැති, පමණට වැඩි හා නිස්සාර දැනුම සමුදායක් පාඩම් කරන ලෙස ඒවා එහි සිසුවන්ට බල කළේය. ඒ වුවද, මිනිස් වර්ගයා එක්රැස් කළ ඥාන සමුදාය අවබෝධ කර නොගෙන කෙනෙකුට කොමියුනිස්ට්වාදියෙකු විය හැකි යයි ඔබ නිගමනය කරතොත්, ඔබ කරන්නේ බරපතළ වරදකි."

**ලෙනින්**
**තෝරාගත් කෘති, 11වැනි වෙළුම, 60 පිටුව**

# උතුරු මුහුදේ සිදුවන ඉන්දීය ධීවර ආක්‍රමණය

ඉන්දියානු ධීවරයන් නීති විරෝධී ලෙස ශ්‍රී ලංකාවේ මුහුදු සීමාවේ සිදුකරන ආක්‍රමණය මේ වන විට බරපතළ ගැටලුවක්ව පවතී. උතුරු පළාතේ ධීවරයන්ගෙන් සාතිශය බහුතරයක් ධීවර කර්මාන්තයේ නියැළෙති. මේ හේතුවෙන් ඔවුන්ගේ ජන ජීවිත අඩාල වී ඇත. දීර්ඝ කාලයක් පුරා පැවත එන මෙම ගැටලුවට කිසිදු ආණ්ඩුවකින් ස්ථිරසාර විසඳුමක් මේ වන තෙක් ලබා දී නොමැත. මුහුදු සීමාවේ ධීවර සම්පත් කොල්ලය නිසා මෙරටට සිදුවන බලපෑම් ආකාර කිහිපයකින් පවතී. එනම් උතුරේ ධීවර ප්‍රජාවගේ ජන ජීවිතය අඩාල වීම, මේ රටේ ජාතික ආර්ථිකයට එකතුවිය යුතු කොටසක් ඉන්දියානු රජය බලහත්කාරයෙන් කොල්ලකෑමට ලක්කිරීම, මෙරට මුහුදු සීමාවේ ජීවත්වන සාගර ජීවීන් සහ ඔවුන්ගේ වාසස්ථානවලට හානි වීම, රටේ ස්වාධිපත්‍යයට බලපෑමක් සිදුවීම යන ආකාර වේ.

> “පසුගිය කාලය පුරාවටම මෙම පාලකයන් අනුගමනය කළේ මුහුදු සීමා උල්ලංඝනය කරන යාත්‍රාවලින් ඉතාම සුළු ප්‍රමාණයක් නාවික හමුදාව මගින් අත්අඩංගුවට ගැනීමයි. එය සමස්තයක් වශයෙන් වසරකට 0.3%ක් පමණ වේ. ඒ වෙනුවෙන් පුළුල් මාධ්‍ය හරඹයන් පවත්වා තම රජය දැඩි ක්‍රියාමාර්ග අනුගමනය කරන බවට ජනතාවට දැනුම් දෙන නමුත් එය කන්දක් විළිලා මී පැටියෙක් වැදුවා හා සමාන වේ.”

ශ්‍රී ලංකාව සතු සාගර කලාපය වර්ග කිලෝමීටර් 517,000කි. ගොඩබිමේ සිට නාවික සැතපුම් 200ක පමණ දුරක් මෙරට සතුව ඇත. 1974 වසරේ ජුනි 26වැනිදා ශ්‍රී ලංකාවේත් ජුනි 28වැනිදා ඉන්දියාවේ දිල්ලියේදී අත්සන් කළ ගිවිසුම අනුවත් 1976 වසරේ මන්නාරම් ද්‍රෝණිය සහ බෙංගාල බොක්ක පිළිබඳව ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර අත්සන් කළ ගිවිසුමට අනුවත් දෙරටේ මුහුදු සීමාව පැහැදිලිව සඳහන් කර ඇත. ඒ අනුව දෙරට අතර ඇති වූ එකඟතාවයට අනුව පොදු කරුණ වූයේ ශ්‍රී ලංකා මුහුදු සීමාවට ඉන්දියානු යාත්‍රා ඇතුළු වීම නීත්‍යානුකූල නොවන බවත් එය ශ්‍රී ලාංකික ධීවරයින්ගේ නිදහස් ආර්ථික කලාපයක් යන්නය. මෙම පනතෙහි අංක 27 දරන ව්‍යවස්ථාවේ (3) උප වගන්තියට අනුව රාජ්‍ය ආරක්ෂාව, ස්වාධිපත්‍යය, නිදහස, භෞමික අඛණ්ඩතාවය ආදී කරුණු පිළිබඳවද අන්තර්ගත වේ.

මෙම ගැටලුව හේතුවෙන් විශේෂයෙන්ම උතුරු පළාතේ මන්නාරම, කිළිනොච්චිය, යාපනය හා මුලතිව් දිස්ත්‍රික්කද, එයට අමතරව වයඹ පළාතේ පුත්තලම හා නැගෙනහිර පළාතේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයටද, බලපෑම් සිදුවී ඇත. උතුරු පළාතේ ධීවර කර්මාන්තයෙන් පමණක් යැපෙන ජනතාව දෙලක්ෂයකට අධිකය. මෙලෙස මෙරට මුහුදු සීමාව උල්ලංඝනය කරමින් සතියකට ඉන්දියානු ට්‍රෝලර් යාත්‍රා දින තුනක් පැමිණෙයි. සෑම සඳුදා, බදාදා, සෙනසුරාදා දින තුනට පමණක් පැමිණෙන යාත්‍රා ප්‍රමාණය 1500ක් පමණ වේ. මේ වන විටත් ගොඩබිම ආසන්නය දක්වා පැමිණෙන මෙම යාත්‍රා මගින් මෙරට ධීවරයන්ට පහර දෙති. යාත්‍රා විනාශ කරති. දැල් ආම්පන්න විනාශ කරති. මෙවන විටත් විනාශ කළ ප්‍රමාණය අති විශාල වේ. මෙලෙස පැමිණෙන යාත්‍රා මගින් සතියකට මත්ස්‍ය අස්වැන්න මෙට්‍රික් ටොන් 600ක් බැගින් වසරකට මෙට්‍රික් ටොන් 32,000ක් පමණ ඉන්දියානු ධීවරයන් කොල්ල කයි. ඒ අනුව වාර්ෂිකව රුපියල් රුපියල් මිලියන 8600ක් පමණ මෙරටට අහිමිවන බවට ගණන් බලා ඇත. ඉන්දියානු ධීවර යාත්‍රා මසුන් නෙළා ගැනීමේදී අනුගමනය කරන්නේ නීති විරෝධී Bottom Trawling System ක්‍රමවේදයයි. ඒ අනුව සමස්ත සාගර පත්ලේ සියලුම කුඩා ජීවියාගේ සිටම විනාශවීම අතිශය බරපතළ කරුණකි. මෙම තත්වය තුළ අනාගතයේදී උතුරු මුහුදේ මත්ස්‍ය ගහණයට දැඩි බලපෑමක් ඇති විය හැකි බවට ධීවරයෝ පවසති. පසුගිය තිස් අවුරුදු සිවිල් යුද්ධය අවසන් වීමෙන් පසු රාජපක්ෂ පාලනය උතුරට වසන්තයත්, නැගෙනහිරට නවෝදයත් ගෙන එන බව පවසමින් මහ හඬින් තප්පුලන ලදී. නමුත් උතුරේ ධීවරයාට ස්වකීය රැකියාවට යෑමට තොටුපොළක්වත් ඉදිකර නොමැත. අවම වශයෙන් බීකන් ලාම්පුවක්වත් ලබාදී නොමැත. ඔවුන්ගේ පැල්පත්වලට විදුලිය. ජලය සනීපාරක්ෂක පහසුකම් නැත. උතුරේ ධීවරයන්ට ඉතිරි වී ඇත්තේ මුහුදු යෑම වෙනුවට මුහුද දෙස බලාගෙන හීල්ලීමය. පසුගිය කාලය පුරාවට උතුරේ ධීවර ප්‍රජාව, තමන්ට සිදුවන අසාධාරණකම් පිළිබඳව පැවති ආණ්ඩුවලට දන්වා ඇති අවස්ථා ගණන අතිවිශාලය. නමුත් පාලකයින් නෑසූකන් සේ බකන්නිලා සිටීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී. උතුරේ ජනතාවගේ කරපිටින් බලයට තනතුරු, වරප්‍රසාද ගත් ද්‍රවිඩ ජාතික සන්ධානය සියල්ල අමතක කර දමා සිටිති.

පසුගිය රාජපක්ෂ ආණ්ඩුව වරෙක ප්‍රකාශ කළේ මෙම ගැටලු දෙරටේ ධීවරයන් සාකච්චා මගින් විසඳාගත යුතුය යන්නය. රාජ්‍යයන් දෙකක ගැටලුවක් ධීවරයන්ට විසඳා ගැනීමට බාරදිය නොහැකිය යන්න සිහිබුද්ධිය ඕනෑම අයෙකුට වටහා ගත හැකිය. එහි තේරුම ආණ්ඩුවට මෙම ගැටලුව පිළිබඳව පුළුල්ව අධ්‍යයනයක් සිදුකර සැබෑ විසඳුමකට යෑමට වැඩපිළිවෙළක් නොමැතිකමයි. වත්මන් මෛත්‍රී රනිල් හවුල් ආණ්ඩුවද අනුගමනය කරනුයේ දියාරු පිළිවෙතකි. පසුග ිය කාලය පුරාවටම මෙම පාලකයන් අනුගමනය කළේ මුහුදු සීමා උල්ලංඝනය කරන යාත්‍රාවලින් ඉතාම සුළු ප්‍රමාණයක් නාවික හමුදාව මගින් අත්අඩංගුවට ගැනීමයි. එය සමස්තයක් වශයෙන් වසරකට 0.3%ක් පමණ වේ. ඒ වෙනුවෙන් පුළුල් මාධ්‍ය හරඹයන් පවත්වා තම රජය දැඩි ක්‍රියාමාර්ග අනුගමනය කරන බවට ජනතාවට දැනුම් දෙන නමුත් එය කන්දක් විළිලා මී පැටියෙක් වැදුවා හා සමාන වේ.




මෙම තත්වය තුළ අත්අඩංගුවට ගත් එම යාත්‍රා සඳහා සිදු කරන්නේ කුමක්ද? 1948 අංක 20 දරන ආගමන හා විගමන පනතේ 45 වන ඡේදයට අනුව යාත්‍රා හා ධීවරයින්ට නඩු පවරා, සුළු දඩමුදලක් ගෙවීමෙන් පසුව මෙකී යාත්‍රා හා ධීවරයන් නිදහස් කර ඉන්දියාවට බාර දීමය. නමුත් මෙම ක්‍රියාවලිය නතර කිරීම අරභයා එය පය බරවාට පිටිකර බෙහෙත් බැඳීමක් හා සමාන වේ. නමුත් මේ රටේ සම්මත කළ 1979 අංක 59 දරන විදේශීය ධීවර යාත්‍රා විධිමත් කිරීමේ පනතට අනුව මෙම යාත්‍රා හා ධීවරයන්ට නඩු පවරන්නේ නම් එකී යාත්‍රා හා ආම්පන්න රාජසන්තක කළ හැකිය.

නීතිමය ප්‍රතිපාදන තත්වය එසේ පවතිද්දී මෙරට පාලකයන් එය අනුගමනය නොකරන්නේ පසුගාමී ධනේශ්වර පාලකයින්ගේ පවතින දීනකම නිසාය. මේ සඳහා විය යුත්තේ දෙරට අතර නිවැරදි රාජ්‍යතාන්ත්‍රික මැදිහත් වීමකින්, සාකච්ඡාවකින් පසුව දෙරටේ නාවික හමුදා මගින් දෙරට මුහුදු සීමා ආරක්ෂාකර ගැනීමට වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමය. නමුත් වර්තමානයේ සිදුකරනුයේ දෙරටේ නායකයින්ගේ උපන්දින අවස්ථාවලදී, සංචාරය කරන අවස්ථාවලදී, නිදහස් දිනයන්හිදී දෙරටේ අත්අඩංගුවේ පසුවන ධීවරයින් කොටස් වශයෙන් නිදහස් කර ‘හොඳ හිත පළකිරීම්’ සිදු කිරීමය. මේ නිදහස්කිරීම් මගින් නායකයින්ගේ ආයුෂ වැඩිකරග න්නා නමුත් ධීවරයන්ගේ ආයුෂ අඩුකරයි. මෙම තත්වයන්ද තමන්ගේ ප්‍රතිරූපය ගොඩ නැගීමට අවස්ථාවක් බවට පත් කර ගැනීමට තරම් ඔවුන් අඥබාල වී ඇත.

වර්තමානයේ වර්ධනය වෙමින් පවතින මෙම ගැටලුව හේතුවෙන් උතුරේ සමස්ත ධීවර ප්‍රජාවගේ පවතින්නේ මහත් වූ ශෝකාලාපයකි. මෙහිදී ඉන්දියානු ධීවරයින්ට මේ තුළින් අසාධාරණයක් වන බව පවසමින් තමිල්නාඩු ප්‍රධාන අමාත්‍ය ජෙයලලිතා ජෙයරාම් මහත්මිය නිරතුරුවම තම මධ්‍යම රජයටත් ජනාධිපතිවරයාත් දැනුවත් කරයි. ඇය ඒ පිළිබඳව අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝඩි මහතා දැනුවත් කරමින් ලිපි 21ක් යවා ඇත. නමුත් මෙරටේ උතුරේ ප්‍රධාන අමාත්‍ය, පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකවරයා ගත් ක්‍රියාමාර්ග මොනවාද? මෙම තත්ත්වය තුළ 2015 ඔක්තෝබර් 09 වන දින ජවිපෙ පාර්ලිමේනතු මන්ත්‍රී විජිත හේරත් සහෝදරයා විසින් පාර්ලිමේන්තු සභාව කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කර මෙම ගැටලුව පිළිබඳව පවතින අනතුරුදායක වටහා දෙන ලද නමුත්, උතුරේ ජනතාවගේ ඡන්දයෙන් බලයට පත් ද්‍රවිඩ ජාතික සන්ධානයේ නියෝජිතයින්ට ජනතාව අමතක වී ඇත. මෙයට අමතරව ඉන්දීය විදේශ ඇමති සුෂ්මා ස්වරාජ් මහත්මිය පසුගියදා ශ්‍රී ලංකාවේ සිදු කළ නිල සංචාරය අතරතුරදී පෙබරවාරි 05 වන දින උතුරු පළාත් ධීවර සමුපකාර සමිති සම්මේලන සහ සමස්ත ලංකා පොදු ධීවර සම්මේලනය මගින් ඒකාබද්ධ උද්ඝෝෂණයක් කොළඹ කොටුවේ දුම්රිය පොළ ඉදිරිපිට පවත්වා පසුව ජාතික පුස්තකාල සේවා මණ්ඩල ශාලාවේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. ඒ නිසා ධනපති පාලකයින් සිදුකළ යුත්තේ නිහඬව, දායාරු පිළිවෙත් අනුග මනය කිරීම නොව නිවැරදි වූත් ස්ථිරසාර වූත් රාජ්‍යතාන්ත්‍රික මැදිහත් වීමකින් මෙම ගැටලුව නිරාකරණය කිරීමය.

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස්
වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2016 පෙබරවාරි 11

# වැඩකරන ජනතාවට වූ පොරොන්දු වහා ඉටු කළ යුතුයි

**පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් සහෝදරයා**

*(පඩිපාලක සභා ආඥා පනතට කරන ලද සංශෝධන පිළිබඳ විවාදයට එක්වෙමින්)*



1941 සම්මත කරන ලද පඩිපාලක සභාව පිළිබඳවයි අද අපි සාකච්ඡා කරන්නේ. රුපියල් 400ක පැමිණීමේ දීමනාව රුපියල් 1,500 දක්වා වැඩි කිරීමත්, රුපියල් 500 දීමනාව රුපියල් 2,000 දක්වා වැඩි කිරීමත් තමයි මෙයින් කරන්නේ කියලා ගරු කම්කරු ඇමතිතුමා ඉතා පැහැදිලිව කිව්වා.

ඇත්තටම ගත්තොත් රුපියල් 1,500 කියන්නේ සොච්චම් මුදලක්. ඒ නිසා රුපියල් 1,500 ප්‍රමාණවත් වෙන්නේ නැහැ; රුපියල් 2,000 ප්‍රමාණවත් වෙන්නෙත් නැහැ. පඩිපාලක සභා 44 පිළිබඳව තීන්දු-තීරණ ගන්න, ඔවුන්ගේ වැටුප් පිළිබඳව, ඔවුන්ගේ අතිකාල දීමනා පිළිබඳව, සේවාවන් පිළිබඳව තීන්දු-තීරණ ගන්න ඒ ආයතනවල ප්‍රධානීන්ට, මේ ප්‍රධාන ආයතනයේ නියෝජිතයන්ට පඩිපාලක සභා රැස්වීමකට සහභාගි වීම වෙනුවෙන් ලබා දෙන මුදල වන රුපියල් 400 කොහොත්ම ප්‍රමාණවත් නැහැ. ඔබතුමන්ලා අද වැඩි කළා කියලා කියන රුපියල් 1,500 සෑහීමට පත්වෙන්න පුළුවන් ගණනකුත් නොවෙයි. ඇත්තටම ගත්තොත් ඒක ප්‍රමාණවත් නැහැ.

පසුගිය කාලය තුළම සේවකයන් ඉල්លුවේ අවම වැටුප රුපියල් 15,000ක් කරන්න කියලයි. අවම වශයෙන්, රුපියල් 15,000ක මට්ටමේවත් තබාගන්න කියන එකයි, මීට අවුරුදු එකහමාරකට කලින් සේවකයන්ගේ පැත්තෙන් කෙරුණු ඉල්ලීම. එහෙම තිබෙද්දී තමයි ඔබතුමන්ලා දැන් අවම වැටුප ලෙස තිබෙන රුපියල් 9,620, තවත් පොඩ්ඩක් එහාට තල්ලු කරලා රුපියල් 10,000ක් ලෙස තීන්දු කරන්න හදන්නේ. මෙමගින් කම්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමක් කිසිසේත් සිදු වන්නේ නැහැ; ඒ වාගේම පොරොන්දු ඉටු කිරීමක් වන්නේත් නැහැ.

ඊළඟට පෞද්ගලික අංශයේ සේවකයන්ට තවත් හොඳම වංචාවක් කරනවා. පෞද්ගලික අංශයේ සේවකයන් ඇත්තටම ඉල්ලුවේ රුපියල් 5,000ක වැටුප් වැඩිවීමක්. පසුගිය අවුරුද්දේ ඉදිරිපත් කළ අතුරු අයවැයේදී පොරොන්දුව අනුව 2015දී තමයි රුපියල් 2,500 වැඩි කරන්න ඕනෑ. හැබැයි, මේක කොටස් දෙකකට කැඩුවා. 2015 ජනවාරි මාසයේ 01වැනිදා ඉඳලා නොවෙයි, මාස පහක් විතර අත්හැරලා 2015 මැයි මාසයේ ඉඳලා රුපියල් 1,500ක් වැඩි කරන්න තීරණය කළා. හැබැයි ඒ රුපියල් 2,500ම වැඩි කරලා නැහැ. දැන් සම්මත කරන්න හදන පනත් කෙටුම්පතින් ඔබතුමන්ලා රුපියල් 2,500ක් වැඩි කරනවා කියපු පොරොන්දුව සම්පූර්ණයෙන් උල්ලංඝනය කරලා තිබෙනවා.

හැත්තෑ ලක්ෂයක් වන අපේ රටේ පෞද්ගලික අංශයේ සේවකයන්ගෙන් සියයට 75ක්, 80ක් ම ඇත්තටම අද කටයුතු කරන්නේ සාමූහික ගිවිසුම් මතයි. "සාමූහික ගිවිසුම් අනුව කටයුතු කරන සේවකයන්ට මේ වැටුප් වැඩිවීම අදාළ නැහැ." කියා මෙම පනත් කෙටුම්පතට ඔබතුමන්ලා වාක්‍යයක් ඇතුළත් කර තිබෙනවා. එතකොට මේ රුපියල් 2,500 කොටස් විධියට 1,500යි, 1,000යි කියා වැඩි කරන එකවත් අඩුම ගණනේ අර කියපු වතු සේවකයන්ට ලැබෙන්නේ නැහැ. වතු සේවකයන්ගේ වැටුප - රුපියල් 620කියන එක කොහෙත්ම මදියි කියන එක කවුරුත් පිළිගන්නා දෙයක්. ඒ නිසා වතු අංශයේ සේවකයන්ගේ වැටුප් අනිවාර්යයෙන්ම වැඩි කළ යුතුයි. එය වැඩි කිරීමේ ඉල්ලීම දිගින් දිගටම තිබෙනවා. ඒ ගැන හාම්පුතුන් එක්ක සාකච්ඡා කරනවා. කවුරු එක්ක සාකච්ඡා කළත්, ඒකට උත්තරක් හම්බ වුණේ නැහැ. පොදුවේ පෞද්ගලික අංශයේ සේවකයන්ට වැටුප් වැඩි කරනවා නම් ඒක සමස්ත පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් වැඩිවීමක් වන්න ඕනෑ. එතැනදීත් ඔබතුමන්ලා වතු සේවකයන්ව නොසලකා හැර තිබෙනවා.

> මේ රුපියල් 2,500 කොටස් විධියට 1,500යි, 1,000යි කියා වැඩි කරන එකවත් අඩුම ගණනේ අර කියපු වතු සේවකයන්ට ලැබෙන්නේ නැහැ. වතු සේවකයන්ගේ වැටුප - රුපියල් 620කියන එක කොහෙත්ම මදියි කියන එක කවුරුත් පිළිග න්නා දෙයක්. ඒ නිසා වතු අංශයේ සේවකයන්ගේ වැටුප් අනිවාර්යයෙන්ම වැඩි කළ යුතුයි.

පෞද්ගලික අංශයේ සියලුම සේවකයන්ට රුපියල් 2,500ක් වැඩි කරනවා කියලා පොදුවේ ගන්නවා නම් වතු කම්කරු ජනතාවට විතරක් අසාධාරණ විධියට සලකන්න එපා. එතැන වැටුප් විෂමතාවයක් විතරකේ නෙවෙයි, ජාතිකත්ව විෂමතාවත් මතු වෙනවා. ඒ ජාතිකත්ව විෂමතාවය අනාගතයේ ජාතික ප්‍රශ්නයක් බවට පත් වෙනවා. ඒ නිසා මේ වැරැද්ද වහාම නිවැරදි කළ යුතු වෙනවා.

මේකට තවත් වාක්‍ය කිහිපයක් ඇතුළත්කර තිබෙනවා. පොදුවේ කිව්වේ රුපියල් 2,500කින් වැටුප් වැඩි කරනවා කියායි. හැබැයි දැන් කියනවා රුපියල් 40,000ක් හෝ ඊට වැඩි වැටුපක් ලබන අයට මේ වැටුප් වැඩිවීම සිද්ධ වන්නේ නැහැ කියා. එහෙම ගත්තත්, කියපු දේ නොවෙයි දැන් මේ කරන්නේ. දැන් කොන්දේසි දමලා, එක එක ෙ කාන්දේසි අනුව සේවකයන් කප්පාදු කරනවා. ඒ වැටුප ගෙවන සේවකයන් ප්‍රමාණය අඩු කරනවා. මේක පෞද්ගලික අංශයෙන් ගෙවන වැටුපක්. ඇයි රජය පෞද්ගලික අංශයට ඒක ගෙවන්න ඉඩ දෙන්නේ නැත්තේ? ඔවුන් ගෙවන්න කැමැති නම් ඒක ගෙවන්න නීති හදන්න.

විශේෂයෙන්ම කාන්තාවන්ගේ අයිතිය ආරක්ෂා කරන්න, පළාත් පාලන ආයතනවලට කාන්තා නියෝජනය වැඩිකරන්න පනත් ගෙනැල්ලා අගමැතිවරයා රටට කියනවා, කාන්තාවන්ට වැඩි සැලකිල්ලක් දක්වන්න මේ ආණ්ඩුව වැඩියෙන් මැදිහත් වෙනවා කියලා. හැබැයි, එහෙම කියන ඔබතුමන්ලා මේ රටේ වැඩ කරන කාන්තාවන්ගේ මූලික අයිතියක් වෙන වැටුපට වැඩ කරන කාන්තාවන්ගේ මූලික අයිතියක් වන

15වැනි පිටුවට

පෙබරවාරි 12වැනිදා

# අධ්‍යාපනයේ සංවර්ධනය වෙනුවෙන් ගුරු උපදේශක සේවාවක් ස්ථාපිත කළ යුතුයි

**පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස සහෝදරයා**



> ඉතාම වේගයෙන් ලෝකයේ දැනුම දෙගුණ වෙමින් පවතිනවා. වර්ෂ 1900ට කලින් නම් ලෝකයේ දැනුම දෙගුණ වෙන්න අවුරුදු 100ක් ගියා. හැබැයි, 1900 සිට 1950 වනවිට දෙවන ලෝක යුද්ධය අවසන් වන විට අවුරුදු 25කට වතාවක් දැනුම දෙගුණ වුණා. දැන් 2015, 2016වන විට මාස 13කට වතාවක් දැනුම දෙගුණ වෙනවා කියලා සාමාන්‍යයෙන් කියනවා.

අපේ රටේ අධ්‍යාපනයේ තවත් ඉදිරි පියවරක් වෙනුවෙන් ගුරු උපදේශක සේවාව ස්ථාපනය කිරීම සඳහා වන යෝජනාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන සතුටු වෙනවා. අපේ රටේ අධ්‍යාපනයේ සංවර්ධනය පිළිබඳව කථා කළොත් ප්‍රධාන වශයෙන් ප්‍රධාන ධාරාවන් දෙකක් පිළිබඳව අපට අවධානය යොමුකරන්න සිද්ධ වෙනවා.

එකක් තමයි ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය. අනෙක තමයි පරිපාලන ක්‍රියාවලිය. මේ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යාපන විෂයමාලා නිපදවීමේ සිට ගුරුවරු දක්වා පහළට විහිදෙන ක්‍රියාවලියක්. දැනුම සම්ප්‍රේෂණය වන්නේ මේ ක්‍රියාදාමය තුළිනුයි. දැනුම ගලා යනවා කියන වචනය පාවිච්චි කරනවාට වඩා ඉහළ සිට පහළටත්, පහළ සිට ඉහළටත් දැනුම සම්ප්‍රේෂණය වන ක්‍රියාවලිය සිද්ධ වන්නේ මෙන්න මේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හරහායි.

පරිපාලන සේවය ගත්තොත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සිට විදුහල්පතිවරයා දක්වා වන ක්‍රියාදාමයක් තිබෙනවා. කොහොම වුණත් අවසානයේ අධ්‍යාපනයේ ප්‍රතිලාභ ලබන ශිෂ්‍යයට ගුරුවරයා සහ විදුහල්පතිවරයා මගින් තමයි මේ කියන ධාරාවන් දෙක දායක වන්නේ. ඒ නිසාම මේ ධාරාවන් දෙක එකිනෙකට වෙන් වෙන්ව පැවතියත් අන්‍යෝන්‍ය සහයෝගයෙන්, අන්‍යෝන්‍ය අවබෝධයෙන්, අන්‍යෝන්‍ය බැඳීමෙන් කටයුතු කළොත් තමයි අධ්‍යාපනයේ ප්‍රතිලාභ ලබන ශිෂ්‍යයාට උසස් දායාදයක්, ප්‍රතිලාභයක් අත්පත් කර දෙන්න අපට පුළුවන්කම ලැබෙන්නේ.

අපි දන්නවා, ජාතික අධ්‍යාපන ආයතනය ඇතුළේ විෂයමාලා, විෂය නිර්දේශයන්, පෙළපොත්, ගුරු අත්පොත් නිර්මාණය කරන බව. දැනුමට අදාල කරන ප්‍රභවයන් ගොඩනගන්නේ එතැනයි. දැනුම ගුරුවරයා වෙත සම්ප්‍රේෂණය කිරීම සඳහා මාධ්‍යයක් ඕනෑ. ඒ සඳහා තමයි මේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය, එය ඇගයීම, එය සුපරීක්ෂාවට ලක් කිරීම ආදී ඉගනුම් සහායක ක්‍රියාවලියට තමයි මෙන්න මේ මධ්‍ය පිරිසක් වුවමනා කරන්නේ. එක් පැත්තකින් ජාතික අධ්‍යාපන ආයතනයේ ඉඳලා ඒ නිෂ්පාදනය වන දැනුම ශිෂ්‍යයා වෙත ළඟා කරවීමට උගන්වන ගුරුවරුන්ට ඉගැන්වීම සඳහා සේවාවක් ස්ථාපනය කිරීමටයි මේ යෝජනාව කරන්නේ.

ඉතාම වේගයෙන් ලෝකයේ දැනුම දෙගුණ වෙමින් පවතිනවා. වර්ෂ 1900ට කලින් නම් ලෝකයේ දැනුම දෙගුණ වෙන්න අවුරුදු 100ක් ගියා. හැබැයි, 1900 සිට 1950 වනවිට - දෙවන ලෝක යුද්ධය අවසන් වනවිට අවුරුදු 25කට වතාවක් දැනුම දෙගුණ වුණා. දැන් 2015, 2016වනවිට මාස 13කට වතාවක් දැනුම දෙගුණ වෙනවා කියලා සාමාන්‍යයෙන් කියනවා. මෙන්න මේ දෙගුණ වන දැනුම ගුරුවරයා වෙත ගෙන යාම සඳහා තමයි අපි ක්‍රමවේදයක් සකස් කරන්න ඕනෑ. ඒ නිසා මම හිතනවා, මේ ගුරු උපදේශක සේවාවේ අවශ්‍යතාව පිළිබඳව අපි කාටවත් සැක සංකා තියෙන්න විධියක් නැහැ කියා. දරුවන් ලක්ෂ 40කට පමණ උගන්වන්න ලක්ෂ 02ක් පමණ වන ගුරුවරුන්ට උපදේශන සැපයීම සඳහා තමයි මේ සේවාව අත්‍යවශ්‍ය වන්නේ. ගුරු උපදේශක සේවාව ගැන අපේ රටේ අවුරුදු 50කට වඩා වැඩි කාලයක සිට සාකච්ඡා වෙලා තිබෙනවා. ඉස්සෙල්ලාම 1962දී, ගණිතය සහ විද්‍යාව ඉගැන්වීම සඳහා ගුරු උපදේශකයන් බඳවා ගැනීමෙන් මේ සේවාව ආරම්භකර

15වැනි පිටුවට

# කවුළුව හැර තබමි



## සෞඛ්‍ය පාඩම

අප රටේ සෞඛ්‍ය ඇමති මේ දවස්වල ඉන්නේ සිංගප්පූරුවේය. නිවාඩුවකට ගොස් නොවේ. ප්‍රතිකාර ගැනීමට ගොස්ය. ලේසි පහසු තැනක නම් නොවේ. ලෝකයේ මහා ධන කුවේරයන් සහ බලවතුන් ප්‍රතිකාර ගැනීමට එන සංගප්පූරුවේ මවුන්ට් එළිසබෙත් රෝහලේය. සේනක බිබිලේ සෞඛ්‍ය ප්‍රතිපත්තිය ගැන නිතර කෑමොර දෙන සෞඛ්‍ය ඇමතිවරයා මේ කළ දේ මගින් අපේ රටේ සෞඛ්‍ය සේවය ගැන කදිම පණිවුඩයක් දී තිබේ. ඒ, රටේ සෞඛ්‍ය ඇමතිවරයා ලෙස තමාටත් තමා යටතේ  තිබෙන සෞඛ්‍ය සේවය ගැන විශ්වාසයක් නැත යන්නය. අපට ප්‍රශ්නය තිබෙන්නේ ඔහු ලෝකයේ සුපිරි රෝහලක වෛද්‍ය ප්‍රතිකාර ගැනීමට යාම නොව මේ රටේ පැනඩෝල් පෙත්තක්වත් නැති රෝහල් සිය ගණනක් තිබියෙදී නේවාසික රෝගීන්ට ඉන්න හිටින්නට ඉඩකඩ පවා නැති රෝහල් තිබෙද්දීත් සෞඛ්‍ය බලධාරීන් ඒ ගැන වගේ වගක් නැතිව කටයුතු කිරීම ගැනය.

මුළු ලෝකයම පිළිගත් දක්ෂ වෛද්‍යවරු සහ රෝහල් කාර්ය මණ්ඩල සිටින්නේ රටවල් කිහිපයක පමණි. එහෙත් සෞඛ්‍ය ඇමතිවරයා අද ඒ සියල්ල හැල්ලුවට පත්කර රටේ සෞඛ්‍ය සේවය ගැන නරකම පණිවුඩය නිකුත් කර හමාරය. තමන්ගේ සෞඛ්‍ය සේවය තමන්ටම විශ්වාසයක් නොමැති නම් රටේ ජනයා ගැන කවර කථාද? එකක් කිව යුතුය. කෙසේ වුවද මේ සියල්ලම තුළ රටේ දේශපාලන සෞඛ්‍යයට හිතකර පණිවිඩයක්ද ලබා දී තිබේ. ඒ, පූර්ණ රාජ්‍ය අනුග්‍රහය සහිත සෞඛ්‍ය සේවයක් ඇති කියුබාව වැනි රටක් බවට පත්වීමෙන් තොරව මෙරට ජනතාවට කොත්තමල්ලි සරණ පමණක් උරුම වනු ඇති බවය.

## චණ්ඩි ශ්‍යාමා



හවුල් ආණ්ඩුව බලයට ඇවිත් ටික කලකින්ම දැන් අලුත් චණ්ඩියෙක් බිහි වී සිටියි. ඔහු වරෙක මාධ්‍යයට චණ්ඩි පාට් දමයි. වරෙක එට්කා ගිවිසුමට එරෙහි වන්නන්ට පාට් දමයි. ඔහු දැන් අලුත්ම සිංදුවක් කීමට පටන් ගෙන ඇත. එනම් තම මතයට විරුද්ධවන හැමෝම ඔහුට අනුව දේශද්‍රෝහීන්ය. මේවා කියන්නේ සහ කරන්නේ මහා දේශප්‍රේමී රනිල් 'හාමුය'.

බලයේ සිටිනවිට මහින්ද රඟපෑවේද එම භූමිකාවය. ඔහුගේ මතයට සහ වැඩවලට විරුද්ධ වූ හැමකෙනාම දේශද්‍රෝහීන්ය. එකල ඔහු ලංකාවේ එකම මහා දේශප්‍රේමියා විය. මහින්දගේ දේශප්‍රේමය සහ රනිල්ගේ දේශප්‍රේමය යනු දෙකම එකකි. ඒ දේශප්‍රේමයේ රස රටේ ජනයා ඇති තරම් භුක්ති විඳ තිබේ.

එට්කා ගිවිසුම ගැන කථාකරන රනිල් දැන් කියන්නේ මොකා විරුද්ධ වුණත් තමා ගත් තීරණය ආපස්සට නොගන්නා බවයි. පවුල් බලය හොඳටම ගොඩ නඟාගෙන, තම ක්ෂණික හා හිතවත් මන්ත්‍රීවරු සහ කණ්ඩායම් සිය පවුලේ ආවතේවකරුවන් බවට පත්කරගෙන, හමුදාව, පොලීසිය, අධිකරණය තම පාපිසි බවට පත්කරගත් මහින්ද ලොක්කාට දැන් ඔහුට බැල මෙහෙවර කළ හිසේ සිට පතුල දක්වා වැනූ තම රාජකීය දෛවඥයා පවා එරෙහි වී සිටී.

ඒකාධිපති වියරුවෙන් පෙළුණු නායකයින් නිසා ලෝකයට වූ විපත් මහත්ය. එමෙන්ම ඔවුන් ලෝක ඉතිහාසයෙන් අතු ගෑවී ගියේද අළු දූවිලිවත් සොයා ගැනීමට බැරිසේය. රනිල්ට මේවා ඉගෙන ගැනීමට මහින්දම ප්‍රමාණවත්ය.

## සිංදු කියන රාජපක්ෂලා

හිටපු ජනාධිපති රාජපක්ෂ උන්නැගේ තම පුත් යෝෂිත රාජපක්ෂ අත්අඩංගුවට ගත් දිනවල මාධ්‍යයට මුහුණ දුන්නේ ශෝකයෙන් බර වූ මුහුණකින් යුතුවය. සමහර



අවස්ථාවල දාරක ප්‍රේමය උතුරා ගොස් කඳුළු කැට දෑසට උනනවාද අපි දුටුවෙමු. එහිදී අපට සිහියට නැගුණේ බලය තිබෙන විට ඔහු සහ ඔහුගේ පුතාලා ඇතුළු පවුලේ උදවියගේ වැඩ කිඩ නිසා තම දූ දරුවන්, ස්වාමි පුරුෂයන් අහිමි භාර්යාවන් සහ අම්මලා තාත්තලාගේ දණටත් දෑස්වලින් කඩා වැටෙන කඳුළු කැටය.

හොරෙක් හොරකමට අත්අඩංගුවට ගත් විට රාජපක්ෂ තියරියට අනුව එය පළිගැනීමකි. එසේම අත්අඩංගුවට ගත්තේ තම ලේ උරුමක්කරුවෙක් නම් එය අතිශය නින්දිත දේශපාලන පළිගැනීමකි.

තම පුතා අත්අඩංගුවට ගැනීම නිසා හඬා වැටුණු රාජපක්ෂ උන්නැහේ ඉන් දින දෙක තුනකට පසු ඉතා සැහැල්ලුවෙන් 'සී බාත්' එකක් ගන්නා ඡායාරූපයක් පුවත්පත්වල පළවී තිබුණි. පුදුමය වන්නේ මහින්ද අඬන තැනත් මාධ්‍යයය. මහින්ද ඔළුවෙන් හිටගෙන ඉන්න තැනත් මාධ්‍යයය. තාම මාධ්‍යයට ආවරණය කරගන්නට බැරි වී තිබෙන්නේ ඔහු ශරීර කෘත්‍යය කරන විධිය පමණි.

මහින්ද එසේ හඬමින් නාමින් සිටින අතරේ ඔහුගේ බාල පුත් රෝහිත දැන් සිංදු කියන්නට පටන්ගෙන තිබේ. ඔහු අලුතින්ම ගැයූ සිංදුවට වීඩියෝ රූප රාමු ඇතුළත් කරන්නේ නැද්ද කියා මාධ්‍ය විසින් ඇසූ ප්‍රශ්නයකට ඔහු පිළිතුරු දී තිබුනේ එහෙම කරන්න තරම් අතේ මුදල් නැත කියාය. එවිට අපිට සිහියට ආවේ නඩු කියන්න සල්ලි නැතිව රුපියල් දහය ගාණේ පිනට එකතු කරන උඩුවේ හාමුදුරුවන්ය.

මහින්ද එක වෙලාවක කිව්වේ මොන දේ කළත් ඔවුන්ව මානසිකව වට්ටවන්න බෑ කියාය. මේ ඊයේ පෙරේදා කිව්වේ මේ ආණ්ඩුව තමන්ට කරන දේවල් නිසා විදුලි පුටුවට යනවාටත් වඩා දිනපතා මානසික වේදනාවක් තමන් විඳිනවා කියාය. මේ කියන හැම දෙයක්ම එකිනෙකට පරස්පරය. අයියා හිරේ ඉන්දැද්දී මල්ලී සිංදු කියයි. තාත්තා මුහුදේ විනෝද වෙයි. 'රාජපක්ෂ' පාඩම, බලය නැති වූ විට මිනිසුන්ට වෙන දේ බලාගෙන කටයුතු කිරීම බලයේ සිටින්නවුන්ට හොඳ පාඩමකි.

## පොලිටිකල් පංතිය

පොලිටික්ක පංතියට පරක්කු අතරෙ පංතියෙ මිනි පාර්ලිමන්ට් එකක් දැම්ම. දැම්ම කිව්වට වැඩේ ගියේ නැත්තෙ කතානායක පත්කර ගන්න වෙලා ගිය හින්ද.

"උඹ ගනින් කතානායකකම." මංජුව සමනට යෝජනා කළා.

"මට බෑ. මට විවාදෙදි කතා කරන්න ඕනැ." සමන කිවුවෙ මරාලෙ ඇඟට කඩා වැටෙන්න ඔන්න මෙන්න තියෙද්දි. "...අනෙක කතානායකට 'උඹ' කියනකොට ඒ වැඩේ කරන්න බෑ..." සමනට හිනාව ගිලගෙන කිවුව.

"අනිත් අයට කියන්නෙ මංජු, ඔයාම කරන්නකො." යෝජනාව අනුරුද්දියගෙන්.

"මටත් බෑ. මට ගනුදෙනුවක් තියෙනව බේරගන්න." මංජුව කර ඇරිය.

"හරි... උඹල හොඳට හැසිරෙනවනම් මට දීපල්ල ඕක." තවත් කීපදෙනෙක් බෑ බෑ කියද්දි කනිය කිවුව.

"දැන් කවුද ආණ්ඩුව... කවුද විපක්ෂෙ?" කනිය ඇහුවෙ හැමෝම කෑගහන්න ගත්ත හින්ද.

"අපි ආණ්ඩුවෙ" කට්ටියක් අත උස්සල කිවුව. "අපි විපක්ෂෙ" තවත් කට්ටියක් කිවුව.

"ඔයාල මොන පැත්තෙද?" කනිය ඇහුවෙ දෙකටම නැති අයගෙන්.

"අපි ඒකාබද්ධ විපක්ෂෙ." පංතියටම බකස් ගාල හිනා ගියා.

"ඒ කියන්නෙ විපක්ෂෙ හිටියට විපක්ෂෙම නෙමෙයි." මංජුව තේරුම් කළා.

"ඇමතිකමක් හම්බුවෙනකම් විපක්ෂෙ ඉන්න එක"

"මන්ත්‍රීකම බේරගන්න දෙපැත්ත කන එක."

"ආසයි බයයි" අර්ථකථන හැම පැත්තෙන්ම ආව. පොලිටික්ක කොර ගගහ පංතියට ආවෙ පංතිය හිනා සාගරයක ගිලෙද්දි.

"මොකද ළමයිනේ මේක පංතියක්ද කෝලම් මඩුවක්ද?" පොලිටික්කට මල පැන්න.

"හරියට හරි. සර්ට ඇහුණ නේද අපි කර කර හිටපු දේ." කනිය ඇහුවෙ ඇහුණම කියල හිතාගෙන.

"ඇයි මොකක්ද?" පොලිටික්ක සැකෝට ඇහුව.

"නෑ සර්... අපි මිනි පාර්ලිමන්ට් එකක් දැම්ම." 'කතානායක' කනියා කිවුව.

"අනේ...මොකද සර් කකුල" වසන්තිය පොලිටික්ක කොරග හනව දැකල විස්සෝපෙ.

"ඒ ගැන පාර්ලිමේන්තුවෙ ශෝක යෝජනාවක් දාමුද?" චමිය ඇහුවා.

"හා හා කට... ශෝක යෝජනා දාන්නෙ මැරුණම." මංජුව කටට ඇඟිල්ල තිබ්බ.

"ඇත්තටම සර් මොකද වුණේ..." අනුරුද්දිය ඇහුවෙ මළ ගෙදර මූණක් හදාගෙන.

"කකුල... කකුලට..." පොලිටික්කගෙ කටහඬත් කොර ගහනව. "කකුලට පොල් ගෙඩියක් වැටුණානෙ."

"ඒ මක් වෙලාද සර්?" කනිය කුතුහලේ.

"ගුරුත්වාකර්ෂණේ හින්ද..." පොලිටික්ක නියෙව්ව.

"සර් මොන එහෙකටද සීනිගම ගියේ?" සමනගෙ ප්‍රශ්නෙන් පොලිටික්ක අන්දුන් කුංදුන් වුණා.

"සමන් මාව එහෙදි දැක්කද?" පොලිටික්කගෙ කට ඉස්සර වුණාද මන්ද.

"ගුරුත්වාකර්ෂණේම නෙමෙයි. මිනිස්සු ගැන විශ්වාසයක් නැතිකම." සමන පොලිටික්කව කරකෝලම අතෑරිය.

"මොකද්ද සමන්, මටනම් මුකුත් තේරෙන්නෙ නෑ." පොලිටික්කට කැරකිලා මාන්සි වගේ.

"දැන් සමහරුන්ට මිනිස්සු විශ්වාස නෑ. දෙවියන්ට කේලම් කියන්න යනවා. හොරෙන් හරි නැතුව හරි පොල් කඩන්න වෙනව. හොරු බේරන්න කියල දෙවියන්ට පොල් ගහන්න වෙනවා. ගහන්න යනකොට සමහරුන්ගෙ පොල් අතෑරෙනව. අල්ලන්න දෙවියො නැති හින්ද වැටෙන පොල්වලට යටින් කකුලක් තිබුණොත් ඒක තැලෙනව." පොලිටික්ක සමනගෙ ඩෑෂ් එක වදින තැනින් අහකට පැන්න.

## රුසියානු විප්ලවය...

07 පිටුවෙන්

දීමට කටයුතු කළහ. එය කළය මුනින් අතට පෙරළා වතුර දැමීමක් මෙන් විය. ශිෂ්‍යයන් පවසන දේශපාලනය තේරුම් ගැනීමට තරම් ගැමියෝ මුහුකුරා ගොස් නොසිටියහ. ඔවුනට ශිෂ්‍යයන් පෙනුනේ තමන් සිටින ස්ථානයෙන්ද පහළට ඇද දැමීමට පැමිණෙන කණ්ඩායමක් ලෙසය. ඇතැම් ගැමියන් ඔවුන් අල්ලා සාර්ගේ පොලිසියටද බාර දුන් අතර අතැමෙක් සිසුන් සිර කර තැබූහ. සාර්ට එරෙහිව ගැමියන් දැනුවත් කිරීමට ගිය සිසුහු තමනට ගැමියන් වෙතින් ලැබුණු ප්‍රතිචාරයන් හමුවේ මහත් කම්පනයකට හා කලකිරීමකට පත්වූහ.

### පුද්ගල ත්‍රස්තවාදය බිහිවේ

මෙම දැනුවත් කිරීම් හරහා පොදු ජනතාව සාර්ට එරෙහිව පෙළගැස්විය නොහැකිය යන අදහස ශිෂ්‍යයන්හට කාන්දු විය. ඔවුන් ඊළඟට දුටුවේ  සාර් පෙරළා දැමිය හැකි එකම මාර්ගය පුද්ගල ත්‍රස්තවාදය බවය. ඒ අනුව ඔවුන්ගේ විප්ලවකාරී ක්‍රියාමාර්ග නව මුහුණුවරක් ගන්නා ලදී. බෝම්බ ප්‍රහාර එල්ල කරමින් කෙසේ හෝ පාලකයන් ඝාතනය කිරීම ඔවුනගේ පරමාර්ථය විය. මෙම  බෝම්බ ගසන්නන් "බෝම්බ රැගත් නිදහස්වාදීන්" යනුවෙන්ද ඔවුනගේ සංවිධානය " මහජන කැමැත්ත" ලෙසද හඳුන්වනු ලැබීය. පොදුවේ මෙසේ පුද්ගලයින් ඝාතනය කර සාර් පාලනය අහෝසි කිරීමේ ව්‍යාපාරය නරෝද්නික් ව්‍යාපාරය ලෙසද හඳුන්වන ලදී. මෙම සංවිධාන තම ක්‍රියා මාර්ග ආරම්භ කිරීමත් සමග සාර් පාලනයෙන් පීඩාවට පත්ව සිටි රුසියාවේ යටත් ජාතීහු හා සුළු ජාතීහු මෙම ත්‍රස්ත ක්‍රියා අනුමත කරමින් ඔවුනට සහයෝගය ලබා දුන්හ. සාර් පාලනය තුළ සුළු ජාතීන්ට ස්ව භාෂාව කථා කිරීමට ඉඩ නොදී ගොළුවන්සේ පසෙකට කර තිබුණි. රුසියානු යටත්විජිතයක් බවට පත් කොට තිබූ පෝලන්තයේ ජනයාට එම භාෂාව තහනම් කෙරුණි. ක්‍රමයෙන් තමන්ට අභියෝගයක් බවට පත්ව එන ත්‍රස්තවාදී සංවිධාන මර්දනය කිරීමට සාර් රජය තම උපරිම බලය යෙදවීය. එම සංවිධාන තුළට ඔත්තුකරුවන් රිංගවා ඒවා අඩපණ කිරීමද, "පොග්රම් " ආකාරයට මනුෂ්‍ය ඝාතන සිදුකරමින්ද එයට අමතරව අත්අඩංගුවට පත්වූවන් සයිබීරියාවට පිටුවහල් කිරීමද ඒ අතර වේ.

**ප්‍රාග්ධනයේ ආගමනය**

19වැනි සියවසේ අගභාගය වන විටත් රුසියාව තුළ ධනේශ්වර ආර්ථික ක්‍රියාවලියක් ස්ථාපිත වීමට තරම් වටපිටාවක් සකස් වී නොතිබුණි. එහෙත් ප්‍රංශය, බ්‍රිතාන්‍යය, ජර්මනිය වැනි රටවල ප්‍රාග්ධන ආයෝජනයෙන් ප්‍රධාන නගර ආශ්‍රිතව කර්මාන්ත ශාලා ආදිය ඇති විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස ධනපති පංතියක සහ කම්කරු පංතියක ආරම්භය සනිටුවන් කරන ලදී.

**"මේ සමයේ සිදුවූ තවත් වැදගත් දියුණුවක් නම්, හැටගණන්වල සිටම බටහිර කර්මාන්ත පැතිර යන්නට වීමයි. එහෙත් එය ඇතැම් ප්‍රදේශවලට පමණක් සීමා විය. එනම් පීටර්ස්බර්ග්, ඒ අවට ප්‍රදේශය හා මොස්කව් නුවරය. මුළු රටම ගෙන බලන විට, එය සම්පූර්ණයෙන්ම කෘෂිකාර්මික රටක් ලෙස ම පැවැත්තේය. එහෙත් එහි ඉතාමත් නවීන කර්මාන්ත ශාලා ගොඩනගනු ලැබීය. මේවා සාමාන්‍යයෙන් ඉංග්‍රිසි කළමනාකරුවන්ගේ පාලනය යටතේ පැවතුණි. මෙයින් ප්‍රතිඵල දෙකක් ඇති විය. මෙම කාර්මික ප්‍රදේශයන්හි රුසියානු ධනපති වාදය සීඝ්‍රයෙන් පැතිරීගිය අතර, එලෙසම සීඝ්‍රයෙන් කම්කරු පංතියක්ද වැඩී වර්ධනය වන්නට විය. මුල් කාලයේ බ්‍රිතාන්‍යයේ පැවති කර්මාන්ත ක්‍රමය මෙන්ම මේ රුසියානු කර්මාන්ත ක්‍රමයක් රුසියානු කම්කරුවාගේ ශ්‍රම ශක්තිය අති භයානක ලෙස උරා- මරා-ගත් බව කිව යුතුය.ඔවුනට දිවා රෑ මුළුල්ලේ ම වැඩ කිරීමට සිදුවිය. එහෙත් එක් වෙනසක් තිබුණි. මේ වන විට නවීන අදහස් පැතිරී තිබුණේය. සමාජවාදී හා කොමියුනිස්ට්වාදී අදහස් රුසියානු කම්කරුවගේ සිතෙහි රැව් දෙන්නට විය." (ලෝක ඉතිහාස සිහිවටන - ශ්‍රී ජවහර් ලාල් නේරු, 659 පිටුව)**

මෙසේ සාර්වරුන්ගේ ඒකාධිපති පාලනයන්ට එරෙහිව ජනතාව ක්‍රමයෙන් සිදු කළ අරගලයන්ගේ ගුණාත්මක පිම් කිහිපයක් 1905 සහ 1917  යන වසරවලදී සිදු විය. අපි ඒ පිළිබඳව ලබන කලාපයෙක් සාකච්ඡා කරමු.

## එට්කා, ආර්ථිකයේ...

09 පිටුවෙන්

මෙම ගිවිසුමෙන් ස්වභාවික ශ්‍රම සංචරණයට (moment of natural persons) අදාළ වන හතරවන ක්‍රමය (Mode 4) අන්තර්ගත නොකරන බව පවසයි. මෑත කාලයේ එට්කා පිළිබඳව ගොඩනැගුණු ප්‍රබලම විවේචනයේ පදනම වූයේ මෙම ශ්‍රම සංචරණය නැතහොත් දෙරටේ ශ්‍රම වෙළඳපොළ  නිදහස්කරණයට අදාළ ගැටලුවය. ලංකාවෙන් ඉන්දියාවේ ශ්‍රම වෙළඳපොළට යාමට කැමති ශ්‍රමිකයින් නොසිටියත් ඉන්දියාවේ පවතින විරැකියා අර්බුදය අනුව විරැකියාවෙන් පෙළෙන ඉන්දියානුවන් විශාල ප්‍රමාණයක් ලංකාවේ කුඩා ශ්‍රම වෙළඳපොළ ආක්‍රමණයක් සිදු කරනු ඇති බවට බොහෝ මත පළවිය. යෝජිත එට්කා ගිවිසුම මගින් දැනට ක්‍රියාත්මක ඉන්දීය-ශ්‍රීලංකා වෙළඳ ගිවිසුම (ISFTA) වඩාත් පුළුල් වනු ඇති බව පැවසේ. එසේම ආණ්ඩුවේ වාර්තා අනුව පෙන්නුම් කරන්නේ දැනට ඇති ඉන්දියාවේ ඍණාත්මක ලැයිස්තුව (Negative list) අඩුකර ගැනීමයි. වෙනත් ලෙසකින් ඉන්දියාවට යැවිය නොහැකි භාණ්ඩ ලෙස දක්වා ඇති භාණ්ඩ ලැයිස්තුව අඩුකර ගැනීම ලංකාවේ බලාපොරොත්තුවක් ලෙස දක්වා ඇත.

මෙම ගිවිසුමේ තවත් අභිලාෂයක් ලෙස රජය දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ නාවුක, ගුවන් සහ සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීමය. දැනටමත් කොළඹ වරායේ නැව් කටයුතුවලින් 70%ක්ම ඉන්දියාවට සිදු කරන ප්‍රති නැව්ගත කිරීම් වන අතර, එස්ම, ශ්‍රී ලන්කන් ගුවන් සේවයේද කටයුතුවලින් 40%ක් පමණද ඉන්දියාව සහ ලංකාව අතර ගුවන් කටයුතුය.

එළඹීමට යෝජිත එට්කා ගිවිසුම ගැන ලංකාවේ වත්මන් පාලකයින් දරන්නේ අති සුභදායක හැඟීමකි. ඔවුන්ට අනුව මෙම ගිවිසුම ආයෝජන බාධා ඉවත්කරන-සේවා වෙළඳපොළ පුළුල් කරන, නවීන තාක්ෂණය ලංකාවට ලැබෙන අපූරු ඇලඩින්ගේ පුදුම පහනකි. ආණ්ඩුවේ වැඩි වර්ණනාව නිසාම ජනතාවට මෙම ගිවිසුම ගැන ඇත්තේ අසීමිත බියකි. තමන්ගේ සේවා වෙළඳපොළ-කුඩා ව්‍යාපාර ආයෝජන පමණක් නොව ඉංජිනේරු, තොරතුරු තාක්ෂණ සහ වෙනත් බොහෝ වෘත්තීන්ගේ පැවැත්මද මේ හේතුවෙන් අහෝසි වනු ඇතැයි සාධාරණ බියක් ඔවුන් සතුය. එම බියට සාධාරණ හේතුන්ද නැතුවා නොවේ. දැනටමත් පැන නැගුණු විරෝධතා නිසා ආණ්ඩුව ගිවිසුමේ මුල් දළ රාමුව සංශෝධනයට ලක් කර ඇත. ආණ්ඩුව මාධ්‍යවලින් ප්‍රකාශ කළේ මුල් දළ රාමුව වැරදි එකක් බවත් එය නිලධාරීන්ගේ වරදින් පිටවූ ලියවිල්ලක් බවය. නිලධාරීන්ගේ වරදින් හෝ ජනතාවට අවශ්‍ය ලියවිල්ල පිටවිය. ඒ නිසා අනතුර හඳුනාගත හැකි විය. දැන් ජනතාවට කළ යුත්තේ, හොඳින් අවදියෙන් සිට කොටසක් නොව අනතුර මුළුමනින්ම පරාජය කිරීමය. නිලධාරීන්ගේ වරද මෙන්ම පාලක දේශපාලකයින්ගේ වරදද පරාජය කිරීමය.

## අධ්‍යාපනයේ සංවර්ධනය...

13 පිටුවෙන්



තිබෙන්නේ. අපේ රටේ අද වෙනකොට 4,700ක පමණ ගුරු උපදේශකවරුන් සංඛ්‍යාවක් සේවය කරනවා. ගුරු උපදේශක සේවාව ස්ථාපනය කිරීම සඳහා නිර්දේශ කළ කමිටු වාර්තා කිහිපයක් තිබෙනවා. විශේෂයෙන්ම 2001අවුරුද්දේ ඇති කරපු ඒකනායක කමිටු වාර්තාවෙන්, 2004 වර්ෂයේ ඇති කරපු සිරිවර්ධන කමිටු වාර්තාවෙන්, 2014 වර්ෂයේ ඇති කරපු මහින්ද මඩිහේවා කමිටු වාර්තාවෙන් ගුරු උපදේශක සේවාව ස්ථාපිත කළ යුතු බවට යෝනා කර තිබෙනවා.  ඒ වාගේම 2007 මාර්තු 28වැනිදා ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවකින්, ගුරු උපදේශක සේවය ස්ථාපනය කිරීම පිළිබඳව කැබිනට් මණ්ඩලයට කරුණු ඉදිරිපත් කර තිබෙනව.ා ඒ අනුව 2007 අප්‍රේල් 18 වැනිදා අමාත්‍ය මණ්ඩලය තීන්දුක් අරගනෙ තිබෙනවා ගුරු උපදේශක සේවය ස්ථාපිත කරන්න.

ගුරු උපදේශක සේවය ස්ථාපනය කරනවා වාගේම තවත් ගැටලුවක් තිබෙනවා. ඔබතුමා දන්නවා ඇති මේ වන කොට රට පුරා විසිරී සිටින 4,700ක් පමණ ගුරු උපදේශකවරුන් වෘත්තීය ක්‍රියාමාර්ගයක ඉන්න බව; මේ වනවිට මාස 06ක් පමණ වනවා. හැබැයි, ඔබතුමාටත් තේරෙනවා ඇති මෙයට විදුහල්පතිවරුන්ගේ හෝ ගුරුවරුන්ගේ ඉතා විශාල සහයෝගයක් ලැබිලා නැති බව. මොකද, සමහර ගුරු උපදේශකවරුන්ගේ වැඩකටයුතු නිසා ඇත්තටම ගුරුවරු සහ විදුහල්පතිවරු පීඩාවට පත්වෙලා සිටිනවා.  එම නිසා අපි මෙම යෝජනාව ගෙන එන්නේ,  දැනටමත් අධ්‍යාපනය මෙතරම් දුරකට පවත්වාගෙන යාමට කටයුතු කරන ගුරුවරු සහ විදුහල්පතිවරු පීඩාවට පත් කරන යම් උපකරණයක්  සකස් කරන්න නොවේ.

මේ ගුරු උපදේශක සේවාව ස්ථාපනය කිරීම සම්බන්ධව කිසි ගැටලුවක් නැහැ. නමුත් පසුගිය කාලයේදී ගුරු උපදේශකවරු වශයෙන් ලබා දුන් පත්වීම්වලින් සමහර ඒවා දේශපාලන පත්වීම්. සමහර ගුරු උපදේශකවරුන් වැඩිපුරම කරලා තිබෙන්නේ දේශපාලන කටයුතු. ගුරුවරුන් පීඩාවට පත් කරලා තිබෙනවා. ඔවුන්ගේ සේවයට හරියාකාරව ඉෂ්ට කරලා  නැහැ. එම නිසා නුසුදුසු ගුරු උපදේශකවරුන් එම සේවයෙන් ඉවත් කරලා, සුදුසු ක්‍රමවේදයක් සකස් කරලා, අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය පළපුරුද්ද සහ පසුගිය කාලයේදී තම ගුරු වෘත්තිය තුළ යෙදිලා ඔවුන් කරන ලද කාර්යභාරය යනාදී සියල්ල ඇගයීමකට ලක්කරලායි මෙම සේවයට බඳවා ගත යුත්තේ. එහෙම නොකළොත් අපි කරන්නේ ගුරු උපදේශක සේවාව ස්ථාපිත කරලා දැනටත් මෙම ඉගැන්වීමේ කටයුතු යෙදෙන ගුරුවරුන් නැවත වතාවක් අනවශ්‍ය පීඩාවකට ලක් කිරීමයි. අපට ඕනෑ කරන්නේ ගුරුවරුන් පීඩාවට පත් කරන තවත් යාන්ත්‍රණයක් නොවෙයි. ඒ වෙනුවට ගුරුවරු අතර සුහදතාවෙන් වැඩකරන ගුරුවරුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවපියට සහය දක්වන පිරිසකුයි අවශ්‍ය වන්නේ. ඒ නිසා ගුරු වෘත්තියේ ඉන්න විශේෂඥභාවය සහිත, අත්දැකීම් සහිත, පරිණතභාවය සහිත අය තමයි ගුරු උපදේශකවරුන් විධියට බැඳෙන්න ඕනෑ.

ඇත්තටම ගුරුවරුන්ට මිතුරෙක් විධියට, සහායකයෙක් විධියට, මාර්ගෝපදේශකයෙක් විධියට, පහසුකම් සපයන්නෙක් විධියට, අධීක්ෂකයෙක් විධියට එහෙම නැතිනම් ඔවුන්ට ඉහළින් නමුත් ඔවුන් සමගම එක්ව හිඳිමින් ඉගෙනුම් ක්‍රියාවලිය වඩාත් විධිමත් කරන, එකතුවන දැනුම පහළ ක්ෂේත්‍රයට අරගෙන යන කෙනෙක් බවට මේ ගුරු උපදේශකවරයා පත් විය යුතුයි.

## වැඩකරන ජනතාව...

13 පිටුවෙන්



වැටුපට සාධාරණය ඉටුකරන්න මැදිහත් වෙලා නැහැ.

ඔබතුමන්ලා අද විහාර දේවාලගම් පනත සංශෝධනය කරනවා. කවුරුත් දන්නවා දන්ත ධාතූන් වහන්සේ ලංකාවට වැඩම කරවූයේ කාන්තාවකගේ හිස මතින් බව.  හැබැයි කාන්තාවකගේ හිස මතින් වැඩම කරවපු දන්ත ධාතූන් වහන්සේ  ආරක්ෂා කරන දියවඩන නිලමේ තෝරා පත්කර ගැනීමේ ඡන්දයේදී කාන්තාවන්ට ඡන්ද බලය නැහැ. කාන්තාවන්ට ඒ ඡන්ද අයිතිය නැහැ. ප්‍රාදේශීය ලේකම්වරුන්ට ඒ ඡන්ද අයිතිය තිබෙනවා. කාන්තා ප්‍රාදේශීය ලේකම්වරු ඉන්නවා. නමුත් ඒ තනතුරේ ඉන්නේ කාන්තාවක් නම්, එතුමියට දියවඩන නිලමේ තෝරනකොට ඡන්දය දීමේ අයිතිය නැහැ.

රුපියල් 2,500ක් නොවෙයි, එම මුදල රුපියල් 5,000ක් දක්වා වැඩි වෙන්න ඕනෑ. පෞද්ගලික අංශයේ සේවකයන්ට රුපියල් 5,0000කින් වැටුප් වැඩිවීම අනිවාර්යයෙන්ම සිදුවිය යුතු දෙයක්. ඒ වෙනුවෙන් රජය පැත්තෙන් මැදිහත්වීමක් අනිවාර්යයෙන්ම අවශ්‍ය වෙනවා. රාජ්‍ය සේවකයන්ට වුණු පොරොන්දුව අනුව අඩුම ගණනේ, මාර්තු මාසයේ 01දා ඉඳලාවත් ඒ අයගේ මූලික වැටුපට රුපියල් 10,000ක් එකතු කරන්නට මේ ආණ්ඩුව මැදිහත් විය යුතුයි. වෙච්ච පොරොන්දුව ඉටු කිරීමට මේ ආණ්ඩුව වහාම පියවර ගත යුතුයි කියන කාරණය අවධාරණය කරමින් මගේ කථාව අවසන් කරනවා.

## දූෂිතයින්ට එරෙහි සටන...

16 පිටුවෙන්

සියලුම ක්‍රියාමාර්ග ජනතා විමුක්ති පෙරමුණ විසින් ගන්නවා.

මෙම දූෂිතයින් සොරකම් කළ දේපළ කාගේද? මේ සියල්ල ජනතාවගේ දේපළයි. මෙම දේපළ සොරාකෑම කෙසෙල් කැනක් සොරකම් කළා වගේ ප්‍රශ්නයක් නොවෙයි. පවුලක හෝ පුද්ගලයින් කිහිපදෙනෙකු අතර ප්‍රශ්නයක් නොවේ. මෙම දූෂිතයින් සොරා කෑවේ නාස්ති කළේ මහජන දේපළයි. මහජනතාව වෙනුවෙන් රෝහල්වලට බෙහෙත් ලබාදෙන්න, දුවා දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් පාසලට ගොඩනැගිල්ලක් හදන්න තිබුනු මුදල්. මේ සියලු ධනය මහා භාණ්ඩාගාරයට අයත්ව තිබුණු මුදල්. මහජනතාව මිලට ගන්න පරිප්පු ටිකට සීනි ටිකට බදු ගහලා එක් රැස් කරපු මුදල්. මේ රටේ කුමන හෝ පුරවැසියෙක් කියනවාද එම දූෂිතයින් නීතිය හමුවට පමුණුවන්න එපා කියලා.

කිසිදු බේදයකින් තොරව ජනතා මුදල් සොරා කෑ පුද්ගලයින්ට දඬුවම් ලබා දිය යුතුයි. එම යුක්ති සහගත සටනේ ජනතා විමුක්ති පෙරමුණ ඉදිරියෙන්ම ඉන්නවා. හොරු වෙනුවෙන් පෙනී ඉන්න කණ්ඩායම් දෙකක් ඉන්නවා. එක්කෝ ඒ ආකාරයෙන්ම මහජන මුදල් හොරාකාපු අයයි. එසේ නැතිනම් ඉදිරියේදී මහජන මුදල් හොරාකන්න බලාගෙන ඉන්න අයයි. එවැනි පිරිසක් හැර අනෙක් සෑම පුරවැසියෙක්ම දූෂිතයින් නීතිය හමුවට පමුණුවන සටනේ පෙරට ආ යුතුයි." ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා ප්‍රකාශ කළේය.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## සමාජවාදී තරුණ සංගමයේ 03වන ජාතික සමුළුව

2016 පෙබරවාරි 28














# රනිල්ගේ වහසිබස්වලට ජනතාව යටපත් කිරීමට ඉඩදෙන්නේ නැහැ

**ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා**

රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා එට්කා ගිවිසුමට එරෙහි වෘත්තිකයන්ගේ විරෝධතාවයට එරෙහිව ප්‍රකාශ නිකුත් කරමින් සිටින නමුදු ඔහුගේ වහසිබස්වලට ජනතාව බිය වැද්දීමට හෝ යටපත්කිරීමට ජ.වි.පෙ. ඉඩ නොදෙන්නේයැයි ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා පැවසීය.

ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 18වැනි දින 'ලංකාවේ ආර්ථිකය ඉන්දියාවට බිලිදෙන එට්කා එපා!' තේමාව යටතේ කොළඹ මහවැලි කේන්ද්‍රයේ ශ්‍රවණාගාරයේදී පවත්වන ලද සම්මන්ත්‍රණයේදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා, ඉන්දියාව සමඟ අත්සන් කිරීමට නියමිත එම ගිවිසුමේ දළ රාමුව පිළිබඳව මෙතෙක් අවසන් අදහසක් පාර්ලිමේන්තුවට හෝ රටට ඉදිරිපත් කර නොමැති බවත් ජනතා විමුක්ති පෙරමුණ නිරපේක්ෂව රාජ්‍යයන් අතර අත්සන් කරන ගිවිසුම් ප්‍රතික්ෂේප නොකරන බවත් ජ.වි.පෙ. විරෝධය රඳා පවතින්නේ එම ගිවිසුම් රටේ අනාගතයට හිතකරද, අහිතකරද යන්න මත බවත් අවධාරණය කළේය.



"අපි ස්තුතිවන්ත වෙනවා වෘත්තිකයින්ට මේ සම්බන්ධයෙන් විරෝධතාවයක් ආරම්භ කිරීම ගැන. ඒ වගේම ඔවුන්ට සුභ පතනවා. නමුත් මෙම ගිවිසුම හරහා අවදානමට ලක්වෙන්නේ වෘත්තිකයින් පමණක් නොවෙයි. මෙය දේශපාලන ප්‍රශ්නයක්. සමාජ, ආර්ථික, දේශපාලන ප්‍රශ්නයක්. ඒ නිසා එයට මුහුණ දෙන්න පුළුල් පෙරමුණක් අවශ්‍ය වෙනවා. මෙම ආර්ථික ගිවිසුමට එරෙහි මේ සටන ජාතික මට්ටමේ එකක් බවට පත්කළ යුතුයි. ඒ නිසා මේ ආරම්භ කළ සම්මන්ත්‍රණය රට පුරා ගෙන යාමටත් මේ සම්බන්ධයෙන් විවිධ වෘත්තිකයින් සමඟ සාකච්ඡා කිරීමටත් ජනතා විමුක්ති පෙරමුණ බලාපොරොත්තු වෙනවා. ඒ හරහා මෙම සටන සියලු ක්ෂේත්‍රවල පුරවැසියන්ගේ සහභාගිත්වයෙන් ජාතික සටනක් දක්වා වර්ධනය කිරීමට ජවිපෙ කැපවෙනවා." අනුර දිසානායක සහෝදරයා කියාසිටියේය.

# තෙල් මිල අඩු නොකර ආණ්ඩුව කළුකඩකාරයෙකු මෙන් ලාභ ලබනවා

**ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා**

ලෝක වෙළඳපොළේ තෙල් මිල විශාල ලෙස පහත වැටී තිබියදී එම සහනය ජනතාවට ලබා නොදී ආණ්ඩුව කළුකඩකාරයෙකු මෙන් ලාභ ලබමින් සිටින බවට චෝදනා කළ ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා වත්මන් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ජනතාවට සහන ලබාදීම නොව රාජපක්ෂ පාලනය මෙන් සහන කැපීම බව ප්‍රකාශ කළේය.

ටිල්වින් සහෝදරයා මෙසේ පැවසුවේ පසුගිය 11වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය සාකච්ඡාවකදීය. වැඩිදුරටත් අදහස් දැක්වූ ටිල්වින් සිල්වා සහෝදරයා මෙසේද කීය.



"ගොවි ජනතාවගේ පොහොර සහනාධාරය, රාජ්‍ය සේවකයින්ගේ විශ්‍රාම වැටුප කපා හරින්න ආණ්ඩුව උත්සාහ කළා. පාසැල් ළමුන්ට නිල ඇඳුම ලබාදෙනවා වෙනුවට මුදල් ලබාදී එම සහනය කප්පාදු කිරීමට උත්සාහ කළා. ජනතාවට අලුතින් සහන ලබා දෙනවා වෙනුවට ජනතාවට ලැබිය යුතු සහන පවා ලබාදෙන්නේ නැහැ. රාජපක්ෂ ආණ්ඩුව සමයේ තෙල්වලට විශාල ලෙස බදු අයකරන බවට චෝදනා එල්ල කළ එක්සත් ජාතික පක්ෂය තමන්ට බලය ලබාගැනීමෙන් පසුව බද්ද අඩුකිරීමට කටයුතු කළේ නැහැ. තෙල් මිල අඩු කිරීමක් ගැන මේ වනවිටත් ආණ්ඩුව කිසිදු පැහැදිලි කිරීමක් කර නැහැ. වෙළඳ ඇමතිවරයා, මුදල් ඇමතිවරයා, ඛනිජ තෙල් ඇමතිවරයා සහ අගමැතිවරයා තිත්ත කසාය බීපු ගොළුවන් සේ ඉන්නවා.

තෙල්වල මිලට වඩා ආණ්ඩුව ලබා ගන්නා ලාභය සහ බද්ද වැඩි වී තිබෙනවා. තෙල් මිල වැඩිවීම නිසා ප්‍රවාහන ගාස්තු, බස් ගාස්තු මෙන්ම භාණ්ඩවල මිල වැඩිවෙලා තිබෙනවා. එනිසා අපි ආණ්ඩුවට අවධාරණය කරන්නේ මෙම තෙල් මිල සහනය ජනතාවට ලබාදෙන්න කියලා."

# තරුණ තරුණියන්ගේ ගැටලුවලට එකම විසඳුම නවීන සමාජවාදයයි

**ජනතා විමුක්ති පෙරමුණේ ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා**

දේශපාලන පරිවර්තනයක් කරා රට ගෙනයාමට මැදිහත් වෙන්නැයි රටේ තරුණයින්ට ආරාධනා කළ පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා, තරුණ තරුණියන්ගේ ගැටලුවලට එකම විසඳුම නවීන සමාජවාදය බවත් අනාගතය වෙනුවෙන් රටේ තරුණ තරුණියන් සමාජවාදය වෙනුවෙන් පෙළ ගැස්වීමට සමාජවාදී තරුණ සංගමය සූදානම් බවත් අවධාරණය කළේය.

ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 23වැනි දින ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලද මාධ්‍ය හමුවකට එක්වෙමිනි.

28වැනි දිනට නියමිත තරුණ සංගමයේ තුන්වන සමුළුව පිළිබඳව කරුණු දැක්වීම සඳහා පවත්වන ලද මෙම මාධ්‍ය හමුවේදී බිමල් රත්නායක සහෝදරයා වැඩිදුරටත් ප්‍රකාශ කළේ රටේ තරුණ තරුණියන්ට ජීවිතයක් මෙන්ම යහපත් අනාගතයක් අවශ්‍ය බවත් එම ජීවිතයත් අනාගතයත් වෙනුවෙන් සමාජවාදී තරුණ සංගමය සමාජවාදය යෝජනා කරන බවත්ය. "මෙම ජාතික සමුළුවේ ප්‍රධාන අරමුණ වන්නේ එයයි. එනිසා තමයි අපි 'ජීවිතය සහ අනාගතය වෙනුවෙන් සමාජවාදය' තේමාව කරගෙන තිබෙන්නේ." ඔහු පැවසීය. වැඩිදුරටත් අදහස් පළ කළ බිමල් රත්නායක සහෝදරයා මෙසේද කීය.



"අපිට කියන්න පුළුවන්කමක් නැහැ අපේ රටේ තරුණ පරම්පරාව දේශපාලනයට සංවේදී නැහැ කියලා. එවැනි චුවමනාවක් තිබෙන යෞවන යෞවනියන් අපේ දිස්ත්‍රික් සමුළුවලට ආවා. ඔවුන් ආවේ ජොබ් ඇප්ලිකේෂන් බලාගෙන, කොරියා යන්න බලාගෙන, ඉඩම් කෑල්ලක් ගන්න බලාගෙන, ආණ්ඩුවේ ජොබ් එකක් ගන්න බලාගෙන නෙවෙයි.

සියලු දෙනාම ආවේ පොදු අරමුණක් වෙනුවෙන්. තරුණ තරුණියන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ලියන්න, කියන්න සටන් කරන්න සමත් තරුණයින් පිරිසක් ගොඩනැගිය යුතුයි. ඒ වෙනුවෙන් ස්වේච්ඡා ක්‍රියාකාරිත්වයක් සහිත තරුණ ව්‍යාපාරයක් ගොඩනගන්න සමාජවාදී තරුණ සංගමය කටයුතු කරනවා. දෙන දේ කාලා, වෙන දේ බලාගෙන ඉන්න තරුණයින් වෙනුවට තමන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරන තරුණ පිරිසක් ගොඩනැගිය යුතුයි."

# දූෂිතයින්ට එරෙහි සටන අත්හරින්නේ නැහැ!

**ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා**

දූෂිතයින් අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාවලියට ජ.වි.පෙ. පූර්ණ දායකත්වය ලබා දෙන බව පැවසූ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා විවිධ පුද්ගලයින්ගේ මඩ ගැසීම්වලින් බිය වැද්දීම්වලින් තර්ජනවලින් කඳුළුවලින් දූෂිතයින් විසින් සොරා කෑ මහජන දේපළ නැවත අත්පත් කරගැනීමේ සටන ආපසු හැරවීමට නොහැකි බව අවධාරණය කළේය.

අනුර දිසානායක සහෝදරයා මේ බව පැවසුවේ පසුගිය 03වැනිදා ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය.

"මෙය අපේ රටේ මහජනතාවගේ දේපළ පිළිබඳ ප්‍රශ්නයක්. දූෂිතයින් අත්අඩංගුවට ගන්න එපා කියන්න පුළුවන් නිහීන පුරවැසියන්ට පමණයි. යෝෂිත රාජපක්ෂ අත්අඩංගුවට ගැනීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණට විවිධාකාරයෙන් විවේචන, චෝදනා එල්ලවෙමින් තිබෙනවා. පසුගිය ආණ්ඩුව කාලයේ සිදුකළ මහජන මුදල් කෝටි ප්‍රකෝටි ගණනින් සොරාකෑම නාස්ති කිරීම අවභාවිතා කිරීම පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණ රට තුළ මහත් කතාබහක් ඇති කළා. ජනවාරි 08වැනිදා ජනාධිපතිවරණයෙන් පසුව මහජන මුදල් සොරා කෑ මහා පරිමාණ දූෂිතයින්ට දඬුවම්දීමට අදාළව ජ.වි.පෙ. විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, මහාපරිමාණ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශය, අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසමට වැනි අදාළ සියලුම ආයතනවලට පැමිණිලි ඉදිරිපත් කළා. එම විමර්ශන අඩාල වනවිට ඒ පිළිබඳව අපි පාර්ලිමේන්තුවේදී ප්‍රබල හඬක් නැගුවා. එයින් නොනැවතී පාරට බැහැලා සටන් කළා. ඒ නිසා දූෂිතයින්ට දඬුවම්දීමට ජ.වි.පෙ. මැදිහත්වීම සඟවන්න වංගු ගහන්න ඕන නැහැ. මහජන මුදල් ගසා කෑ වංචනිකයින් නීතිය හමුවට ගෙන ඒමටත් ඔවුන් සොරකම් කළ මහජන දේපළ නැවත අත්පත් කරගැනීමටත් ගත හැකි

15වැනි පිටුවට

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.